# THE WHITE HACKLE

JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
ශ්‍රී ලංකා පාබල හමුදා සඟරාව






2004

*Sheltering Colours of Life*
Sri Lanka Light Infantry

*Coloursfest'04*


43rd Issue
JANUARY 2005

# මේජර් ජෙනරාල් N. මල්ලවආරච්චි RWP USP ndc psc
## ශ්‍රීලංයුහ සෙව්විජා බළසේනාධිපති තනතුර භාර ගැනීම.











සම්මාන මුරය පරීක්ෂා කිරීම



ශ්‍රීලංයුහ සෙව්බමු හි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ප්‍රමුඛ නිලධාරීන් හඳුනාගැනීම



ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය



සෙව්විජා බලසේනාධිපති වශයෙන් වැඩ භාර ගැනීම

## අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික තනතුර භාර ගැනීම.



ආගමික වතාවත් වල යෙදුන මොහොත



තනතුර භාරගැනීමේ ලිපියට සිය අත්සන තබමින්

# THE WHITE HACKLE

JANUATY 2005 VOLUME 12 NO 01 43rd ISSUE



රෝද පුටු ටෙනිස් පිටියක සැබෑ වූ සිහිනය

7-8-9 වන පිටු



ශ්‍රීලපාහ වර්ණ ප්‍රධානෝත්සවය - 2004

18-19 වන පිටු





SPRIT OF SPORTS

29, 30, 31, වන පිටු

Design & Printed by:
*Dinuka* **Graphic Network**
197, High Level Road, Pannipitiya.

## Headlines


| | |
|---|---|
| රෙජි අධිපතිගේ අලුත් අවුරුදු පනිවුඩය | 3 |
| Some Lesser - known Ethnic Communitues of Sri Lanka | 4-5 |
| හමුදා කුමන්ත්‍රණයක් නිසා | 6 |
| නව මාධ්‍ය අධ්‍යක්ෂක | 11 |
| Remembering the world war | 12-13 |
| රෙජිමුඛ ආබාධිත ක්‍රීඩකයින්ට වර්ණ ප්‍රදානය | 14 |
| පුනරීන් කඳවුර බේරාගැනීමට දිවිදුන් විරුවන් සැමරේ | 15 |
| යුහ අන්තර් රෙජි ආබාධිතවූවන්ගේ ක්‍රීඩා උළෙල - 2004 | 22-23 |
| 14 වන සංවත්සරය - 6 ශ්‍රීලපාහ | 24 |
| 6 වන බළඇණිය සෑම අතින්ම අතිශූර බළඇණිය වූ වගයි. | 26 |
| දසුනේ හසුන / තල් අරඹේ සිට | 33 සිට |

### කවරයේ කථාව.

දක්ෂතා දැක්වූ ශ්‍රීලපාහ ක්‍රීඩකයින්ට සහ "ප්‍ර", "පා", "භකාස" කරුණු යටතේ හොඳම ශ්‍රීලපාහ බළඇණි වෙනුවෙන් 2004-11-11 වන දින බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යාන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී වර්ණ සහ ජය සංකේත ප්‍රධානය කරන ලදි. එම උත්සවයේ විශේෂ අවස්ථා.

# Feedback

## අදහස් උදහස් හා විවේචන

## Readers Please Write in

The WHITE HACKLE, the Voice of the Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 43rd Issue.

We should not rest on our laurels. Targets have to be set. Greater goals achieved. The success of WHITE HACKLE depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome. What is valued is our making the attempt, then we can surely do our bit. Express your throughts, ideas, opinons, and criticisms, hopes and fears through 'THE WHITE HACKLE' the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience go ahead and write in to the 'THE WHITE HACKLE'. We are willing to accept and use what if of a standard, like sketches, stories and poems, whatever comes from your throughts and your pen.

Our Motto is "Ich Dien" "I Serve". Let' WHITE HACKLE' be a way to serve each other, our regiment and our country with our banner flying high as it always will.

Wishing you all the very best.

Editor in Chief

### හිතවත් පාඨකය, කරුණාකර ඔබගේ අදහස් අප වෙත එවන්න

ශ්‍රී ලංකා පාබල හමුදාවේ හඬ ඉතා උසස් ලෙස නංවන "වයිට් හැකල්" සඟරාවේ හතළිස් තුන්වන කලාපයත් සමඟ එහි ළදරු අවධිය අවසන්කල අප ඉතා විශ්වාස වන්තව ඉදිරියට පිය ඔසවමින් පරිනත භාවයට පත් වෙමින් සිටින්නෙමු. රෝම අධිරාජ්‍යය ඉතා කෙටි කලකින් ගොඩ නැගුවක් නොවන අතර අපි ද පියවරින් පියවර ඉතා විශ්වාසවන්තව ස්ථීර අඩිතාලමක් සඳහා ඉදිරියට ගමන් කරමින් සිටින්නෙමු.

එනමුත් අප දැනට ලබා ඇති ප්‍රගතියෙන් සෑහීමකට පත්විය නොහැක. තව ඉදිරියට යා යුතු මඟ බොහෝ ය. එය දුෂ්කර ද නැතහොත් බාධාවකින් තොර වන්නේ දැයි තීරණය වන්නේ ඔබගෙන් ලැබෙන මහඟු සහයෝගය මතය. 'වයිට් හැකල්' සඟරාවේ ප්‍රගතිය සඳහා අප සියලු දෙනාටම ඉටු කිරීමට ඇති කාර්යභාරය ඉමහත් ය. ඔබගෙන් සුළුවෙන් හෝ අප වෙත ලැබෙන සහයෝගය සෑම අවස්ථාවකම අපි අගයමු. අවශ්‍ය වන්නේ ඔබගේ උත්සාහයයි. එයින් අප වඩාත් ධෛර්‍යයමත් වන අතර අපගේ කාර්යය නිසි අයුරු ඉටු කිරීමට අවශ්‍ය පන්නරය ලබන්නෙමු.

මෙම සඟරාව පිළිබඳ හා එහි ලිපි රචනා පිළිබඳ ඔබගේ අවංක අදහස් හා විවේචන අප වෙත එවන්න. එය වයිට් හැකල් සඟරාවේ ඉදිරි ගමනට මහඟු අත්වැලකි. 'වයිට් හැකල්' සඟරාව ශ්‍රී ලංකා යුධ හමුදාවේ අභිමානවත් ඉතිහාසයට හිමිකම් කියන පෞඪතම රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා පාබල හමුදාව මගින් තෛයි මාසිකව පළ කරනු ලබයි.

මෙම පෞඪ රෙජිමේන්තුවේ සාමාජිකයෙකු වී සිටීම ගැන ඔබ ඔබ ගැනම ආඩම්බර විය යුතු ය. මෙම රෙජිමේන්තුව අනධිමත් කලක් රැකගත් විලසට අප විසින් එය ඉදිරියට ද සුරැකිය යුතුය.

ඔබ බලඇණිවල යම් විශේෂ හා අවස්ථා පිළිබඳ ඔබ හට පැවසීමට ඇත්නම් 'වයිට් හැකල්' සඟරාව වෙත ලියන්න. ඔබගේ ලිපි ඉතා උසස් තත්වයක ඇතැයි අප විශ්වාස කරන අතර එම ලිපි 'වයිට් හැකල්' සඟරාවේ පළ කිරීමට අප පුල පුලා බලා සිටින්නෙමු.

එමෙන්ම ඔබගේ උසස් කවි සංකල්පනා හා සිතුවම් සඳහා ද මෙම සඟරාවේ ඉඩ ප්‍රස්ථාව ඇත.

අපගේ ආදර්ශ පාඨය වන 'සේවය කරමි' මත පිහිටා අප එකිනෙකාට, රෙජිමේන්තුවට, හමුදාවට හා රටට සේවය කරමු. අපගේ පාබල හමුදා ධජය ඉතා විශ්වාසවන්තව, අභිමානයෙන්, ඉතා ඉහලින් ලෙලදුන් විලසටම, තව දුරටත් ලෙලදීමට අවසථාව උදා කර දෙමු.

ප්‍රධාන කර්තෘ

**THE WHITE HACKLE** is for Members of the SLLI, their families, Ex-Servicemen of SLLI and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We invite readers' views. Under 150 words; A post card will do - and include your name, rank and address. We will withhold your name if you so desire and may condense your views because of space. We cannot publish or answer every one, but we will use representative views. Send your letters to:

**Feedback,**
The White Hackle,
RHQ SLLI, Army Cantonment,
Panagoda, Homagama.

**SRI LANKA LIGHT INFANTRY MAGAZINE**

**Col of the Regt.**
Maj. Gen N. Mallawaarachchi RWP USP, ndc, psc

**Centre Commandant**
Col. JS Masakkara, RSP

*The White Hackle, Staff*

**Editor-in Chief** - Brig RMD Rathnayaka RWP,RSP,USP,psc

**Assistant Editor** - Lt. Col C Wimalasiri SLLI

**Associate Editors** - Lt Col J R Kulatunga, RSP psc SLLI
Lt Col SWMTB Hulugalle SLLI
Capt THS Aravinda, RWP, RSP SLLI

**Chief Consultant** - Maj Gen HV Athukorale VSV, psc, FBIM (Rtd), (Reg Force)
Brig AER Abeysinghe KSV (Rtd) Vol Force)

**Publisher** - Regimental Centre
Sri Lanka Light Infantry.

*The White Hackle* is published quarterly under the supervision of the Regimental Centre Commandant to provide the Regiment with information on people, policies, operations, technical developments, views, opinions and ideas about the Sri Lanka Light Infantry • Manuscripts of interest to the Regiment are invited. • Direct Communication is authorized to Editor, or Asst Editor, The White Hackle, Regimental Centre, Army Cantonment, Panagoda, Homagama. Phone 2855204 or 2855356 - 60 Extn. 7380 or 7404. • Individual paid subscriptions are available through the Regimental Adjutant, Sri Lanka Light Infantry. • Publication of this periodical is authorized by the Dte of PA, Army HQCBO by letter No. A/275/27 of 16 Mar '94. • Use of funds for printing this publication has been approved by the Regimental Commander on 30th Aug 1993 at the Regimental Conference held at Welioya.

රෙජිමේන්තු අධිපති

**මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී**

විසින් නිකුත් කරනු ලබන

## 2005 වර්ෂයේ අලුත් අවුරුදු පණිවිඩය

වසරක් ගෙවී නව වසරක් උදාවත් සමගින් ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති වශයෙන් ඔබ වෙත සුභාශිංෂණ පණිවුඩයක් නිකුත් කරනුයේ මා මෙන්ම සියලුම ලක්වැසි ජනතාව අතිශයින් ශෝක වී සිටින අවස්ථාවක දීය.

යුධ හමුදා සෙබලුන් වශයෙන් මෙන්ම ප්‍රෞඩ ඉතිහාසයක් ඇති පාබල හමුදා සෙබලුන් වශයෙන් මෙම සාමකාමී වාතරවරණය අඛණ්ඩව පවත්වා ගෙන යාමට ඔබ සියලුදෙනා අධිෂ්ඨානය කරගත යුතුවේ. මෙවන් අවස්ථාවකදී ඔබහට පැවරෙන ඕනෑම රාජකාරියක් විනය ගරුකව, කැපවීමෙන් හා තීක්ෂණ බුද්ධියකින් යුතුව ඉටු කිරීම අප සතු වගකීමයි. මෙම සාමකාමී වාතාවරණය උපයෝගී කරගෙන ඉඩ ලද සෑම අවස්ථාවකදීම යුද ශිල්පයෙන් පරිනතව ඉදිරියේදී එල්ල විය හැකි ඕනෑම අභියෝගයක් ජයගැනීමට හැකි සෙබලුන් ලෙස එඩිතරව මුහුණ දීමට සූදානම්ව සිටිය යුතුවේ.

යුද්ධයේදී දිවිපුදා අප අතරින් වෙන්වූ සියලුම නිලධාරීන් සහ සෙසු නිලයින් ද ''හයිටි'' දේශයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්වී තුවාල ලැබූ සෙසු නිලයා ද මෙම අවස්ථාවේදී සිහිපත් කරමි. එමෙන්ම නොසිතූ පරිදි 2004 දෙසැම්බර් මස 26 වන දින මහ සයුර ගොඩගැලීමෙන් ජීවිතක්‍ෂයට පත් නිලධාරීන් සහ සෙසු නිලයින් ද සෙසු ලක්වැසියන් ද නිරතුරුවම සිහිපත් කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

යුද්ධයේදී අබාධිත තත්ත්වයට පත් නිලධාරීන් සහ සෙසු නිලයින් ද ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ද, එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා රාජකාර්ය සඳහා ''හයිටි'' දේශයේ රාජකාර්ය කරනු ලබන ශ්‍රීලපාහ බලඇණියේ අණදෙන නිලධාරි ඇතුලු සියලුම නිලධාරීන් සහ සෙසු නිලයින්ද, ඔවුන්ගේ පවුල්වල සියලුම සාමාජිකයින්ද, අප සමග රාජකාර්යයන් කරනු ලබන සිවිල් සේවක මහතුන් සහ එම පවුල්වල සියලුම සාමාජිකයින්ටත් සතුට සමගිය සෞභාග්‍ය සපිරුන සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමි.

### ඔබ සැමට සුභ නව වසරක් වේවා !

එන් මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී
මේජර් ජෙනරාල්
රෙජිමේන්තු අධිපති ශ්‍රී ලංකා පාබල හමුදාව


2005 ජනවාරි මස 01 දින

# Some Lesser-known Ethnic Communities of Sri Lanka Part 9 GYPSIES

*by Vama Vamadevan*

The gypsies also known as *Ahikuntakayas* in Sinhala and *Kurawars* in Tamil were very visible in the 1930s and 40s. They used to live in their *kuppayams* (tents) (Tamil: *kudarams*) and used to visit homes on their daily rounds. The women are out in the daytime selling trinkets, talismans or fortune-telling. The men roamed about as snake charmers or getting monkeys to perform acrobatic fetes and entertain small gatherings on market days or visiting homes. The monkeys are well trained to obey orders of the handler and display tricks much to the amusement of the onlookers. Children hassle the parents to get these performances displayed and enjoy it very much. They are always on the move and roam the villages and small towns in and around their camps.

The origin of the gypsies is in India and according to several authorities they trace their origin to the lower castes of India such as the Rope makers. The tenth century is mentioned as the time of their Diaspora. They started drifting in waves in different directions. Some went westward to Central Asia, others through Northwest India, Persia and into Greece and Eastern Europe. Rumania became the refuge of a big group of gypsies and many Rumanian words have gypsy origin. In general, Rumanians are very fond of music and dancing most of the leading dancers and musicians in Rumania are from the *Czjgany* or *Tzjgani* gypsies.



A Gypsy man & woman in a typical tent

The Nazis had a loathing for the gypsies and it is believed that Hitler's henchmen exterminated no less than 50,000 gypsies in their pogroms. It is estimated there are 12 million gypsies in the world of which 6 or 7 million now live in Eastern Europe, 2.5 million in Western Europe and some in North and South America. The literacy rate among the Gypsies has been very low until recent times. To remedy this a European Gypsy Congress was held in Seville, Spain around 1994 to ameliorate the appalling conditions of the gypsies. They also aimed to set out a policy to prevent an upsurge of racism against them and improve their educational standards. Over 250 Gypsies immaculately dressed in Suits and ties attended the meeting.

The European gypsies form a recognisable ethnic grouping in Rumania, Hungary and Bulgaria. They lead their nomadic lives in tents like their Asian counterparts and are considered the dirtiest, most cheerful and most musical people in Europe. The men wear their hair long, while the women deck themselves with gay finery. The children are noted for their good looks. The European gypsy can be recognised in Europe by the perpetual smile they wear all the time among an otherwise glum population.

In many places they were an unwanted lot, except to avail of their fortune telling skills. They had a propensity (or so people thought) for petty thieving when the occasion presented itself. This was the main reason they were disliked and shunned by the people. There was also a fear that they figured in kidnapping of children. But in this respect they were more maligned than guilty

The gypsies are usually dressed in colourful clothing with a profusion of beads, ear rings, armlets and bracelets etc. mainly made of silver. The modern gypsy earrings worn by

fashion buffs are of gypsy origin as the name suggests. In Tamil areas they have Tamil names such as Letchumanan, Ponnan etc. and females names such as Mariamma, Valli etc. They visit Hindu temples and live mostly in the eastern province. Then there are those who live in Sinhala areas and have Sinhala names and visit Buddhist temples. They adapt themselves to the areas they live in.

They collect food on their rounds or buy them out of their meagre earnings. They have also trained dogs to catch Iguanas and they ferret out field rats to supplement their menu. Gypsies are also good at hunting small game and on the banks of tanks and rivers they do a bit of fishing.

They camp in low tents made of palm leaves in open, wind swept, undulating tracts. The tents are made of talipot leaves, so much so that Casinader refers to them as Talipot Gypsies. Being nomadic people they move tent every often in an age-old cycle of travel. When they moved, they did so in small caravans, with donkeys as the beast of burden. John Still describes their encampments well *".... they were half a dozen bivouacs built of branches and talipot palm leaves, so light that a donkey could carry enough to house a family...".* The sound of the flute emanating from their encampments is enchanting. They make their flutes \ cleverly from the shell of small gourds and pipe out plaintive notes that can be very haunting indeed.

The contents of a gypsy camp which houses a family of three or four are very meagre. Cooking utensils, crude-hunting equipment, leaf mats and bags containing their clothing are all what one sees. There will be snake charms, sacks of grain and sometimes-dried meat. The scene is not complete with out a brooding hen and probably a scraggy dog hanging around the encampment. In and around the house they grow manioc, batala etc. which require the least amount of attention until the harvest.

In their encampments they live by a loose patriarchal federation and the elder rules over the rest. They have a tradition of respect for elders and resolve their conflicts in open assembly. Their tents are in clusters near abandoned tanks normally pitched in a circular fashion suitable for communal living.



Two European Gypsies
from Rumania

Their marriage customs confine their unions to cross cousins. A young man who has a cross cousin invariable is the suitor for such a girl. If there is no cross cousin he may have to remain single~ unless he finds another girl in another clan also without a cross cousin. If such a marriage is contracted the man moves from his clan to his wife's clan. A throat let of black beads serves as a *thali*. The dowry is a snake or two in baskets, a donkey, a dog, clothes, necklace and beads. Affluence is indicated by silver jewellery worn by women. Divorce is as simple as the wedding. If a husband wrongs his wife seriously, the father of the girl would tear the nuptial thread off his daughter's neck and return it to his erring son-in-law and take his daughter away. The husband will thereafter have no claim on her children. Re-conciliation is possible only after a stiff fine on the exhusband.

Many of the gypsies have broken from their traditional life style and have taken jobs as labourers or obtained lands from Government in colonisation schemes and lead a sedentary life as peasant colonists. In dress and ways, many of them have entered the main stream society. The few who still cling to their age-old life style received a shot in the arm with the development of tourism. They can be seen at popular tourist resorts entertaining tourists with their age-old art.

*Compiled by*
**Maj Gen N. Mallawaarachchi**
RWP USP ndc psc
(DGGS & Condt SLAVF)
(Quoted from the Avondster)

# හමුදා කුමන්ත්‍රණයක් නිසා දිවි එපාවූ කපිතාන්වරයෙක්

ලෝකයේ වැඩිපුරම සංවර්ධනය වෙමින් පවතින රටවලින් හමුදා කුමන්ත්‍රණ ගැන අසන්නට ලැබේ. එක්කෝ යුද හමුදාව විසින් පවතින රජය පෙරළා දැමූ බව හෝ නැතහොත් හමුදා කුමන්ත්‍රණයක් ව්‍යර්ථ වූ බව අපට අසන්නට දකින්නට ලැබෙන ප්‍රවෘත්තිය.

එහෙත්, මේ ලිපියෙන් කියන්නට යන්නේ අසාර්ථක වූ හමුදා කුමන්ත්‍රණයක් නිසාවෙන් සිය දිවි හානි කරගත් කපිතාන්වරයකු ගැනය. අද බොහෝ දෙනාගේ මතකයෙන් බොහෝ දුරස්වී තිබෙන මෙම සිද්ධිය වූයේ ශ්‍රී ලංකාවේය. ඒ 1962 දීය. යුද්ධ හමුදාවේ , නාවික හමුදාවේ සහ පොලිසියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් පිරිසක් සමග තවත් පුද්ගලයන් හවුල්වී 1962 ජනවාරි 27 වන දින එවකට අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ රජය රහසිගත කුමන්ත්‍රණයකින් පෙරළා දැමීමට සැලසුම් කළහ. හමුදා කුමන්ත්‍රණය ව්‍යර්ථ වූ අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනිණ. එම කුමන්ත්‍රණයට සම්බන්ධ වීම හේතුවෙන් ඇතිවූ දැඩි පසුතැවීම නිසා ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වෙච්ඡා බල සේනාවට අයත් කාලතුවක්කු ඒකකයේ නිලධාරියෙකු වූ කපිතාන් ලැංන්ඩන් පෝලියර් 1962 පෙබරවාරි 07 වන දින සවස 1730 පැයට පමණ මොරටුවේ කටුබැද්දේ තාවකාලික හමුදා කඳවුරේදී රයිෆලයකින් වෙඩි තබාගෙන සිය ජීවිතයෙන් සමුගත්තේය. විදේශ විදුලි පණිවුඩ හුවමාරු අංශයේ සේවය කළ 35 හැවිරිදි කපිතාන් පෝලියර් දරුවන් 05 දෙනෙකුගේ පියෙකු විය.

හමුදා කුමන්ත්‍රණය සඳහා මෙම නිලධාරි හටද විශේෂ වැඩ කොටසක් භාරවී තිබිණි. කුමන්ත්‍රණයට පෙර දිනයේදී අදාල කුමන්ත්‍රණ සැලසුමට අනුව ප්‍රධාන විදුලි පණිවුඩ කාර්යාලයේත් මරදානේ හා හැව්ලොක් ටවුමේ තැපැල් කන්තෝරු වල දුරකථන පණිවුඩ හුවමාරුවත් ඇතුළු මධ්‍යස්ථාන වල කාර්‍යයන් සිදුකිරීමත් ඒවාට ආරක්ෂාව ලබාදීමේ කටයුතු කපිතාන් පෝලියර් ඇතුළු 05 දෙනෙකු විසින් සිදුකරන ලදී.

කෙසේ හෝ අවසාන මොහොතේදී රජයේ ව්‍යසනාවකට කුමන්ත්‍රණය පිළිබඳ රහසිගත සැලසුම අනාවරණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස එයට සම්බන්ධ සැකකරුවන් අත්අඩංගුවට ගැනිණි. මේ පිළිබඳව දැඩි පසුතැවිලි ස්වභාවයකින් පසුවූ කපිතාන් පෝලියර් කුමන්ත්‍රණය පිළිබඳව සිය කැමැත්තෙන්ම රහස් පොලීසියට ප්‍රකාශයක් කිරීමට ඉඩ දෙන මෙන් තම අණදෙන නිලධාරී වෙතින් 1962 පෙබරවාරි 06 වන දින ඉල්ලා සිටියේය. ඔහුගේ අණදෙන නිලධාරි විසින් එදිනට ඔහුව රහස් පොලීසිය වෙත කැඳවා ගෙන යන ලදී. එහිදී ඔහු ප්‍රකාශයක් කළේය. එම ප්‍රකාශය කිරීමෙන් පසුව ඔහු ඉතා වේදනාවෙන් පසුවූ බව සඳහන් වේ.

1962 පෙබරවාරි 07 වන දින අණදෙන නිලධාරී විසින් කපිතාන් පෝලියර් හට නිවසට යාම සඳහාත් ඔහුට සිවිල් වශයෙන් ලැබෙන වැටුප් ලබාගැනීම සඳහාත් නිවාඩු ලබාදෙන ලදී. එහෙත් ඔහු එදිනම සවස 1700 පැයට පමණ සිය යතුරු පැදියෙන් හමුදා කඳවුරට පැමිණියේය. එහි මුරහලට ගොස් රයිෆලයක් ගෙන තමා පසුපස එන ලෙස මුරපතිටද අණ කොට ඉවත්ව ගොස් ඇත. කපිතාන් පොලියර් එම රයිෆලයට පතුරම් දමා ගත්තේය. ටික දුරක් ගිය ඔහු තුවක්කු බැරලය තුළ ඇස යොමා බලමින් ට්‍රිගරය වෙත ඇඟිල්ල යවා වෙඩි තබාගත්තේය. වෙඩි උණ්ඩය ඔහුගේ හිස පසාරු කරගෙන ගියේය. බිත්තියක්ද පසා කරගෙන ගොස් උණ්ඩය සීජ් පෙරේරා නැමති සෙබලෙකුගේ හිසේ වැදී තිබේ. එහෙත් එම සෙබළාට තුවාල සිදු නොවුනි. කපිතාන් පෝලියර් ගේ මළ සිරුර කපා පරීක්ෂා කළ මොරටුවේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරියා එය සිය දිවි නසා ගැනීමක් විය හැකි බව දන්වා සිටි අතර, ඒ අනුව එය සිය දිවි නාසාගැනීමක් බවට මරණ පරීක්ෂකවරයා තීරණය කළේය.

සිය දිවි හානි කර ගැනීමට ප්‍රථම කපිතාන් පෝලියර් ලියුම් 03 ක් ලියා තිබේ. එම ලිපි 03 සිය අණ දෙන නිලධාරි හට, භාරයාවට හා මවටය. අණදෙන නිලධාරි වෙත ලියා තිබූ ලිපියේ සඳහන් වන්නේ වෙඩි තබා ගැනීම සඳහා තමා පාවිච්චි කළ පතුරම් තමාට අයත් ඒවා බවයි. කපිතාන් පෝලියර් සිය බිරිඳට ලියා තිබූ ලිපියෙහි මෙසේ සඳහන් විය.

''මම ඉවරයි. මගේ මොට්ටකමට මම කුමන්ත්‍රණයට හවුල් වුනා. හිරේ වැටීමෙන් මට සිදුවන නින්දාවට මුහුණ දෙන්න බැහැ. නුඹගේත් මගේ ළපටි දරුවන්ගේත් මුහුණේ දැලි ගෑවෙන්න ඉඩ තියන්න බෑ''

**හමුදා කුමන්තණය සඳහා මෙම නිළධාරි හටද විශේෂ වැඩ කොටසක් භාරවී තිබිණි. කුමන්ත්‍රණයට පෙර දිනයේදී අදාල කුමන්ත්‍රණ සැලසුමට අනුව ප්‍රධාන විදුලි පණිවුඩ කාර්යාලයේත් මරදානේ හා හැව්ලොක් ටවුමේ තැපැල් කන්තෝරු වල දුරකථන පණිවුඩ හුවමාරුවත් ඇතුළු මධ්‍යස්ථාන වල කාර්යයන් සිදුකිරීමත් ඒවාට ආරක්ෂාව ලබාදීමේ කටයුතු කපිතාන් පෝලියර් ඇතුළු 05 දෙනෙකු විසින් සිදුකරන ලදී.**

**කපිතන් තරිඳු වීරසිංහ:**
2(සෙවි) ශ්‍රීලපාහ
ආඥාකාර කාර්යාලය
උතුරු/නැගෙනහිර පළාත් සභාව
ත්‍රිකුණාමලය

# රෝද පුටු ටෙනිස් පිටියක සැබෑ වූ සිහිනය

**1983** වසරේ ජූලි මස 23 වන දින යාපනය තිත්තවේලි හිදී බෙදුම්වාදීන්ගේ රුදුරු බිම් බෝම්බයකට ලක්වීමෙන් 2/ලුතිනන් ඒපීඑන්සී ද වාස් ගුණවර්ධන ශ්‍රීලපාහ ඇතුළු රණවිරුවන් 13 දෙනෙකු දේශය වෙනුවෙන් දිවි පිදූ මොහොතේ සිට 2001 දෙසැම්බර් මස දක්වා දශක දෙකකට ආසන්න කාලයක් පැවැති කුරිරු යුද්ධයට තිතක් තබමින් සාමයේ අරුණැලි කරා පියනගන මෙවන් අවදියක සාම මාවත උදාකරලීම සඳහා රුටදැය සුරැකීමේ උදාර මෙහෙවරක නියලෙමින් සතුරා සමඟ උරෙන් උර ගැටී සටන්කර සඳහටම අප අතරින් වියෝ වූ විරෝධාර රණවිරුවන් සහ සදාකාලිකව ආබාධිත තත්වයට පත්වූ අප වැනි සොල්දාදුවන් පිළිබඳ මතකය අතීතයට මුසුවූ මතකයන් වන්නට ඉඩ නොදී ආබාධිත සෙබළුන්ගේ චිත්ත ධෛර්‍යය, ක්‍රීඩා කෞශල්‍ය වැඩි දියුණු කිරීම වස් ධානපතීන්ගේ ආධාර උපකාර තුළින් සහ රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ මුදල් යොදවා ආබාධිත සොල්දාදුවන්ගේ රෝදපුටු ටෙනිස් ක්‍රීඩාව ජාත්‍යන්තර තලයට ගෙනඒමේ අපේක්ෂාවෙන් පනාගොඩ ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථාන භූමිය තුළ ඉදිකරන ලද ටෙනිස් පිටිය 2004 සැප්තැම්බර් මස 08 වන දින 1830 පැයට යෙදුණු සුභ මොහොතින් **ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තැන්පත් මේජර් ජනරාලේ එන් මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී** මැතිතුමන් විසින් උත්සවශ්‍රීයෙන් විවෘත කරන ලදී.

මෙම ක්‍රීඩාපිටිය විවෘත කිරීමේ අවස්ථාව ඉතාමත් දර්ශණීය වුවත් මෙම කර්තාව්‍යය ආරම්භයේ සිට විවෘත කිරීමේ මොහොත දක්වාම නොයෙකකුත් හැලහැප්පීම්, දුක්කම්කටොලු, පසුබෑම් සිත්වේදනා නොතිබුණාම නොවේ. කෙසේ වෙතත් පැමිණි සියළුම බාධක, දුක්කම්කටොලු මැඩගෙන ඉතාමත් සාර්ථක අවසානයක් කරා පියනැගීමටඅප ගිය මාවතෙහි අපට සහයෝගය දුන්, අපව දිරිමත්කල අපට ආධාර උපකාර කල උත්තමයන් නොසිටියාම නොවේ.

1999, 2000, 2001 සහ 2002 යන වසර වලදී පැවති අන්තර් ඒකක යුධ හමුදා ආබාධිත තරඟ වලදී හා ජාතික ආබාධිත ක්‍රීඩා උළෙලේදී සමස්ථ ටෙනිස් ශූරතාවය ශ්‍රීලපාහ මූලස්ථාන බැළඇණිය වෙතින් දිනාගෙන ඇත. 2002 වර්ෂයේ අග භාගයේදී ශ්‍රීලපාහ මූලස්ථාන බළඇණිය වෙතින් දිනාගෙන ඇත. 2002 වර්ෂයේ අග භාගයේදී ශ්‍රීලංකා ටෙනිස් සංගමය, ශ්‍රීලංකා යුද්ධ හමුදාව හා ඒකබද්ධව ආරම්භ කරන්නට යෙදුණ රෝද පුටු ටෙනිස් ක්‍රීඩාව වැඩි දියුණු කිරීමේ ක්‍රියාවලියත් සමගම යුධ හමුදාව තුළ රෝද පුටු ටෙනිස් ක්‍රීඩාව වැඩි දියුණු වන්නට විය. මෙහි ප්‍රථම සංචිතය සඳහා 20 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් තෝරාගත් අතර, මා එම සංචිතයේ ජ්‍යෙෂ්ඨතමයා විය. සෙසු සාමාජිකයින් අතර, එවකට ශ්‍රීලංකාවේ සිට දක්ෂතම රෝද පුටු ටෙනිස් ක්‍රීඩකයින් වන

*මෙම ක්‍රීඩාපිටිය විවෘත කිරීමේ අවස්ථාව ඉතාමත් දර්ශණීය වුවත් මෙම කර්තව්‍යය ආරම්භයේ සිට විවෘත කිරීමේ මොහොත දක්වාම නොයෙකකුත් හැලහැප්පීම්, දුක්කම්කටොලු, පසුබෑම් සිත්වේදනා නොතිබුණාම නොවේ. කෙසේ වෙතත් පැමිණි සියළුම බාධක, දුක්කම්කටොලු මැඩගෙන ඉතාමත් සාර්ථක අවසානයක් කරා පියනැගීමටඅප ගිය මාවතෙහි අපට සහයෝගය දුන්, අපව දිරිමත්කල අපට ආධාර උපකාර කල උත්තමයන් නොසිටියාම නොවේ.*

අප ඒකකයට අයත් සැරයන් නිශාන්ත... සහ කෝප්‍රල් වීරසිංහ ... යන දෙදෙනාද ඇතුලත්වී තිබුණි. මා අප බළඇණියේ 2 වන අණදෙන නිලධාරී වු නිසා මා හට එම සංචිතයට ඇතුලත් වීමේ අවස්ථාව ගිලිහී ගිය අතර, නේවාසික පහසුකම් වල ඇතිවූ යම්යම් ප්‍රශ්න සහගත හේතූන් මත අනෙක් දෙදෙනාටද එම සංචිතයට සහභාගිවීමේ අවස්ථාව ගිලිහී යන ලදී.

මෙම සංචිතයට සහභාගි වූ අනෙකුත් සාමාජිකයින් ග්‍රීන්පාත් හි පිහිටි ටෙනිස් සංගමයේ දක්ෂ උපදේශකයින් යටතේ පුහුණුව ලැබූ අතර. අප පනාගොඩ ශාරීරික අභ්‍යාස පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සිදුකරන ලදී. නිසි උපදේශකත්වයක් නොමැතිව අප විසින් සිදුකළ පුහුණුවීම් වල ප්‍රතිපලය වූයේ මෙතෙක් කලක් අප රැකගෙන සිටි ටෙනිස් ශූරතාවය අපගෙන් ගිලිහී මෙතෙක් කලක් අප ලබාගත් ලකුණු 30 කට ආසන්න ප්‍රමාණය වෙනුවට ලකුණු 03 කට සීමාවීමයි. මේ විශාල පරාජය හමුවේ නොසැලී ඉදිරියට යාමට සිතාගත් අප රෙම ශ්‍රීලපාහ කඳවුරු භූමිය තුළ පිහිටි කලින් පාවිච්චියට ගෙන නුසුදුසු තත්ත්වයේ තිබූ බාස්කට් බෝල පිටිය ටෙනිස් පිටියක් බවට පත්කර ක්‍රීඩා කල නමුත්, එකල පැවති වල ගොඩලි හමුවේ අප සතුව තිබූ රෝද පුටු දිනෙන් දිනම අබලන් වූ අතර, එම රෝදපුටු අළුත්වැඩියා කොට යථාතත්වයට ගැනීමට රු. 25000.00 ක පමණ මුදලක් වැය කිරීමට සිදුවිය. සෑම දිනකම මෙම අළුත්වැඩියාවන් සිදුකිරීමට වූ අතර, එම හේතුවෙන් සියළුම රෝදපුටු පාවිච්චියට නුසුදුසු තත්ත්වයට පත්විය. ක්‍රීඩාපිටිය යථාතත්වයට පත්කිරීම සඳහා කොන්ක්‍රීඩ් දමා වල ගොඩැලි වසා පිළිසකර කර ක්‍රීඩාවේ පුහුණු කටයුතු නැවත ආරම්භ කල නමුත්, එය තාවකාලික විසදුමක් විය. පසුව රෝද පුටු ටෙනිස් ක්‍රීඩාව ඉදිරියට ගෙන යාම සඳහා අළුතින්ම ටෙනිස් පිටියක් ඉදිකල යුතු බැව් යැයි අවසාන තීරණයකට එළඹුණි.

මෙම වකවානුවේදී ගොඩගම සිට මාලඹේ දෙසට දිවෙන මාහා මාර්ගයේ ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භකර තිබූ අතර, මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා තිබූ කලුගල් අප ටෙනිස් පිටිය ඉදිකිරීමට සුදුසුබැව් අප විසින් කරන ලද විමසුමකදී දැනගන්නට ලැබුණි. අනතුරුව අප ලබාගත් තොරතුරු අනුව මෙම මාර්ග ව්‍යාපෘතිය භාර ඉංජිනේරු කාර්යාලය වෙත ලුතිනන් යටගම සමඟ ගොස් එහි ඉංජිනේරු මහතා මුණගැසී අපගේ අවශ්‍යතාවය පිළිබඳ කරුණු අනාවරණය කරන ලදී. අප මුණගැසී ඇති ඉංජිනේරු මහතා ගොඩගම - මාලඹේ මාර්ග ප්‍රතිසංස්කරණය ව්‍යාපෘතිය භාර ඉංජිනේරු තැන බවත්, මේ සඳහා ඔහුට තනිව තීරණයකට එළඹීමට නොහැකි බැවින් එහි සභාපතිතුමාගේ අනුමැතිය ලබාගත හොත් අපගේ අවශ්‍යතාවය ඉටුකර දීමට හැකිබවත් ඔහු විසින් දැනුම් දෙන ලදී. එතුමා ගෙන් ලද පිලිතුර අපට යම් ධෛර්යක් ගෙන දුන් බැවින් අප අණදෙන නිලධාරිතුමාගේ අත්සනින් යුත් ලිපියක් සකස්කර පසුදිනම නාරහේන්පිට පිහිටි ඔවුන්ගේ ප්‍රධාන කර්යාලය වෙත ගොස් සභාපතිතුමා හමුවීමට උත්සාහ කළෙමි.

නියමිත ස්ථානයට අප යන අවස්ථාවේදී සභාපතිතුමා කාර්යාලයේ නොසිටි බැවින් ඔහුගේ පුද්ගලික ලේකම්වරිය හමුවී රැගෙන යන ලද ලිපිය ඇයට භාරදීමෙන් අනතුරුව අපගේ අවශ්‍යතාවය පැහැදිලි කරදී ආපසු පැමිණියෙමි. දින කීපයකට පසුව මා නැවත නාරහේන්පිට අදාල ආයතනය වෙත ගොස්

# රෝද පුටු ටෙනිස් පිටියක සැබෑ වූ සිහිනය

කරුණු විමසීමේදී අපගේ ඉල්ලීම අනුව ක්‍රියාකිරීමට සභාපතිතුමා අනුමැතිය දී අදාල නිලධාරී වෙත කාර්ය භාරදී ඇති බවත්, ප්‍රතිපාදන අවසන්වී ඇති බැවින් අපගේ ඉල්ලීම ඉටුකිරීමට නොහැකි බැව් කාර්යය භාර නිලධාරී විසින් දන්වා ඇති බවත්, අපට දැනගන්නට ලැබුණි. අපගේ බලාපොරොත්තුව එලෙසින් සුන්වන්නට වු අතර, හැකි දිනයක ක්‍රීඩා පිටිය සකස්කරන තෙක් මෙම ක්‍රීඩාව නතර කරන්නට තීරණය විය.

මෙලෙස දින ගණන් ගෙවී යද්දී එක් සවස් කාලයක ලුතිනන් ප්‍රේමලාල් මා හමුවට පැමිණ ''සර් ටෙනිස් පිටිය සැකසීම සඳහා කීයක් පමණ වැය වෙයිද?'' මේ මුදල සොයන්න මම උදව් කරන්නම්. සර් වැඩේ පටන් ගන්න අඩු තරමින් මුළු මුදලින් භාගයක් හරි හොයල දෙන්නම්' යනුවෙන් පවසන ලදී. මෙමගින් ධෛර්යයටපත් මා නැවත ක්‍රියාත්මක වී අප ඒකකයට අයත් දැනට ඉසේරෙ වෙත අනුයුක්ත කර සිටින ලුතිනන් වික්‍රමනායක කැඳවා ක්‍රීඩාපිටිය නැවත සකස් කිරීම සඳහා ව්‍යාපෘති වාර්ථාවක් සකස්කර දෙන ලෙස දැනුම් දෙන ලදී. ඒ අනුව අදාල නිලධාරී විසින් සති අන්ත දෙකක ඔහුගේ විවේක කාලය වැය කර මමත් ලුතිනන් යටගමත් සමඟ එක්වී අපේක්ෂිත ව්‍යාපෘති වාර්ථාව සකස්කර දෙන ලදී. පසුව අදාල ව්‍යාපෘති වාර්ථාව රැගෙන ලුතිනන් යටගම සහ ලුතිනන් වීරසිංහ නැවත වරක් ඉහත කී මාර්ග අළුත්වැඩියා කිරීම භාර ඉංජිනේරු තැන හමුවට ගොස් සිදුවු සියළුම විස්තර ඔහුට පවසා අදාල ව්‍යපෘති වාර්ථාව ඔහුට භාර දෙන ලදී. එම අවස්ථාවේදීම එම ඉංජිනේරු තැන විසින් ඔහුගේ සභාපතිතුමා හට දුරකථනයෙන් කථාකර අපගේ ක්‍රීඩාපිටිය සකස්කිරීමේ කටයුතු ඉටුකිරීමට ඔහු විසින් එවෙලේම එකඟතාවය පලකර පලමුව ක්‍රීඩාපිටිය නිරීක්ෂණය කලයුතු බවත්, අනතුරුව අවසාන තීරණයට එළඹිය හැකි බවත් පවසා ඇත.

පසුදිනම අප විසින් අදාල ඉංජිනේරු මහතා කඳවුර වෙත කැඳවා තාර දැමීමට පෙර භූමිය නිසි අයුරු සකස් කලයුතු අයුරු පිළිබඳ කරුණු සාකච්ඡා කරන ලදී. තාර දැමීමට පෙර ක්‍රීඩාපිටියේ භූමිය සැකසීම සඳහා ඒ.බී.සී නම් කළුගල් කියුබ් 10 ක් වැය වන බවත්, පිටතින් ගලාඑන වැසි ජලය ක්‍රීඩා භූමිය තුලට නොඑන ලෙස පිළියම් යොදා අවැසි ගල් ගෙනවිත් දැනුම් දෙන ලෙසත්, අප හට දැනුම් දෙන ලදී.

ඉන් අනතුරුව ඒබීසී ගල් නිෂ්පාදනය කරනු ලබන ස්ථානයක් සොයන්නට වු අතර, මාලඹේ පිහිටි මෙම ගල් නිෂ්පාදනය කරනු ලබන ස්ථානයක් ගැන දැනගැනීමට හැකිවිය. ඒ අනුව ලුතිනන් යටගම, ලුතිනන් වීරසිංහ සහ මම අදාල වැඩපල වෙත ගොස් එහි හිමිකරු වන ඩබ්. ඒ. පෙරේරා මහතා මුණගැසී අපගේ අවශ්‍යතාවය පිළිබඳ දැනුම්දීමෙන් අනතුරුව කිසිම පැකිලීමකින් තොරව අපගේ අවශ්‍යතාවය සපුරාලමින් ඒබීසී ගල් කියුබ් 10 ක් නොමිලේ ලබා දීමට කටයුතුකර නිකුත්කිරීමේ වවුචරය එවෙලේම අප වෙත භාරදීමට කාරුණික වන ලදී.

කලුගල් සපයාගත් අප ඉතිරි වැඩකටයුතු ඉටුකර ගැනීම සඳහා අවැසි මුදල් සොයා ගැනීමට යුහුසුළු විය. මේ සඳහා ලුතිනන් යටගම, ලුතිනන් වීරසිංහ, ලුතිනන් ප්‍රේමලාල් සහ මා මුදල් සොයාගැනීමේ අභිප්‍රායෙන් අවස්ථා තුනක්ම අළුත්ගම ගියමුත් පලවන සහ දෙවන අවස්ථාවන්හිදි ඇය මුණගැසීමේ අපේක්ෂාව ගිලිහී ගියද තුන්වන අවස්ථාවේදී ඇය මුණගැසීමට හැකිවිය. ප්‍රසන්න පෙනුමකින් යුත් ඇය නිහතමානී ඇමරිකානු ජාතික කාන්තාවක් වු අතර, ප්‍රංශ ජාතිකයෙකු සමඟ විවාහවීමෙන් අනතුරුව දැනට ප්‍රංශයේ පදිංචිව සිටින්නීය. ඇය කොකා කෝලා සමාගමේ කොටස්කාරියක්ද වේ. ලේඛිකාවක් වන ඇය ලේඛන කටයුතු සඳහා සුදුසු පරිසරයක් සොයා ලංකාවට පැමිණ අළුත්ගම පිහිටි ඇයගේ පුද්ගලික නිවසක ලේඛන කටයුතු වල නියලී සිටින්නීය. අපගේ අවශ්‍යතාවය වටහාගත් ඇය දැනට ඇය සතුව සුළු මුදල් ප්‍රමාණයක් ඇති බවත්, එම මුදලින් අපගේ අවශ්‍යතාවය ඉටුකර ගැනීමට නොහැකි බවත් පවසා අප පනාගොඩ කඳවුර වෙත යන ගමන් අළුත්ගමින් මාරුකර ගන්නා ලෙස දන්වා රුපියල් ලක්ෂයක ප්‍රේෂණපතක් ලබා දෙන ලදී.

කලින් තීරණය කරගත් පරිදි අණදෙන නිලධාරීතුමාගේ උපදෙස් මත එම මුදල් බළඇණි ගිණුමෙහි තැන්පත් කරන ලදුව අවශ්‍යතාවය පරිදි මුදල් ලබාගෙන ක්‍රීඩාපිටියේ ඉදිරි කටයුතු ආරම්භ කරන ලදී. ඇස්තමේන්තුවට අනුව ක්‍රීඩාංගනය ඉදිකිරීමේ කටයුතු සඳහා සිමෙන්ති කොට්ට 110 ක් පමණ වැය වන බැව් ගණන් බලා තිබුණි. ඒ අනුව අප රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන මේජර් සේනක විජේසූරියගේ මගපෙන්වීම මත අණදෙන නිලධාරීගේ අත්සනින් යුතු ලිපියක් සිමෙන්ති සංස්ථාවේ සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදුව එහි ප්‍රතිපලයක් වශයෙන් එක් සිමෙන්ති උරයක් රු. 200.00 බැගින් සිමෙන්ති උර 100 ක් අපට ලබාදීමට අනුමැතිය දෙන ලදී. වෙළඳපොලේ පවතින සිමෙන්ති මිල අනුව මෙමගින් අපට රු. 20000.00 ක මුදලක් ඉතිරි කරගැනීමට හැකිවිය. යුධ හමුදාවේ තෙල් ප්‍රතිපාදන සීමාකර ඇති බැවින් පුත්තලම සිමෙන්ති කම්හලේ සිට පනාගොඩ දක්වා මෙම සිමෙන්ති රැගෙන ඒමට අවැසි ප්‍රවාහන පහසුකම් සපයා ගැනීමට මීළඟ දුෂ්කරතාවය විය. නමුත් අපගේ ඉල්ලීම පරිදි එවකට පුත්තලම බළසේනා මූලයේ බළසේනා මේජර් වශයෙන් කටයුතු කල අප රෙජිමේන්තුවේ නිලධාරියෙකු වන මේජර් අජිත් දිසානායක විසින් පුත්තලම සිට පනාගොඩ දක්වා මෙම සිමෙන්ති රැගෙන ඒම සඳහා අවැසි ප්‍රවාහන පහසුකම් සපයා දෙන ලදී.

අනතුරුව අප විසින් සපයාගත් අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් පෙර සඳහන් කල ඉංජිනේරු මහතාගේ උපදෙස් අනුව තාර දැමීමට සුදුසු අයුරින් ක්‍රීඩාංගනයේ භූමිය සකස්කර අදාල ඉංජිනේරු මහතාහට දැනුම් දෙන ලදී. අනතුරුව ඉංජිනේරු මහතා තම කණිෂ්ඨ නිලධාරියෙකු සමඟ අප කඳවුර වෙත පැමිණ ක්‍රීඩා පිටියට තාර දැමීම සිදුකල යුතු අයුරු ඔහුට පැහැදිලි කර දෙන ලදී. පසුව අවස්ථා තුනකදී මුළු පිටියටම සම්පූර්නයෙන්ම තාරදමා අවසන්කල අතර මේ සෑම අවස්ථාවකදීම වාහන 08 ක් සහ සේවකයින් 20 දෙනෙකු කඳවුර වෙත රැගෙන එන ලදී. මෙම වාහන සහ සේවකයින් 11 සේනාංකයේ ප්‍රධාන දොරටුවෙන් කඳවුර වෙත රැගෙන ඒම සඳහා අවැසි අනුමැතිය එවකට 11 සේනාංකාධිපති වශයෙන් කටයුතු කල මේජර් ජෙනරාල් කේබී එගොඩවෙල ... මැතිතුමන් ලබාදුන් අතර, තුන්වන අධියර යටතේ ක්‍රීඩාංගනයේ වැඩ නිමකිරීම සඳහා මෙම වාහනය සහ සේවකයින් කඳවුර තුළට රැගෙන ඒමේ අනුමැතිය අප රෙජිමේන්තුකාරක මහා සභාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන පසුව 11 සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් කටයුතු කල මේජර් ජෙනරාල් ජීබීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී ආර්එස්පී මැතිතුමන් ලබාදෙන ලදී.

මෙම ක්‍රීඩාංගනය තාර දැමීම සඳහා රුපියල් ලක්ෂ හතරක් වැයවී ඇත. මෙම භාරදූර කටයුත්ත නිසි පරිදි නොමිලයේ ඉටුකරදීමට නාරන්හේන්පිට පිහිටි ''තුඩාවේ බ්‍රදර්ස්'' හි අධිපති තුඩාවේ මැතිතුමාගේ සහ ගොඩගම - මාලඹේ මාර්ගයේ ප්‍රතිසංස්කරණය ව්‍යාපෘතියේ ඉංජිනේරු තැන්පත් දිසානායක මැතිතුමාගේ පූර්ණ අනුග්‍රහය යටතේ සිදුකරන ලදී. මෙය ඉතාමත් දැකුම්කළු ක්‍රීඩාපිටියකි. තාර දමා ඇති මෙම ක්‍රීඩා පිටියේ දිවා කාලයේ ක්‍රීඩා කිරීම පහසු කාර්යයක් නොවේ. මම ද මෙහි ක්‍රීඩා කරන ක්‍රීඩකයෙකු වශයෙන් සවස 0530 පමණ වනතුරු ක්‍රීඩා කිරීමට අපහසු බැව් හොදාකාරවම දනිමි. මන්දයත් දිවා කාලයේ පවතින තද රශ්මියත් මෙයට හේතුවකි. සවස 0530 ට ක්‍රීඩා කටයුතු අරභා 0630 ට පමණ වන විට අවසන් කිරීමට සිදුවී ඇත්තේ රාත්‍රිය එළඹීමයි. එම බාධකයද ජය ගැනීමට අපට අවශ්‍ය විය.

## රෝද පුටු ටෙනිස් පිටියක සැබෑ වූ සිහිනය

අප ඒකකයේ ලුතිනන් සමරතුංගගේ සොහොයුරු සේවයේ නියුතු නුගේගොඩ සුපර් මාර්කට් හි පිහිටි "ට්‍රිම් ඉලෙක්ට්‍රිකල්ස්" ආයතනයේ දායකත්වය ඒ සඳහා ලබා ගැනීමට හැකි බැව් දැනගන්නට ලැබුණි. එම ආයතනයේ අධිපති මීපගේ මහතා මුණගැසී මෙම ක්‍රීඩාපිටියට විදුලි ආලෝකය ලබාගැනීමට අවැසි සම්පූර්ණ ඇස්තමේන්තුව ඉදිරිපත් කරන ලදී. එම ඇස්තමේන්තුවට අනුව ඇස්තමේන්තු ගත මුදල රු. 90000.00 ක් පමණ වුවද, එම ඇස්තමේන්තුවට අනුව සියළුම විදුලි අම්පන්න නොමිලයේ ලබාදීමට මීපගේ මහතා කටයුතු කරන ලදී.

දේශය වෙනුවෙන් යුධවැදී ආබාධිත වූ රණවිරුවන්ගේ රෝද පුටු ටෙනිස් ක්‍රීඩාව ඉදිරියට ගෙනයාම සඳහා අවශ්‍යව තිබූ අංග සම්පූර්ණ දැකුම්කළු ටෙනිස් ක්‍රීඩාපිටියක සිහිනය සැබෑවන ලදී. මෙම ක්‍රීඩා පිටිය විවෘත කිරීමේ උත්සවයට අපගේ ආරාධනය පිළිගෙන ප්‍රධාන අමුත්තා වශයෙන් සපැමිණි **ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් එන්. මල්ලවආරච්චි ආර්ඩබ්පි යූඑස්පි එන්ඩීසි පීඑස්සී මැතිතුමන්ට සහ ශ්‍රීලපාහ කන්තා සංගමයේ ගරු සභාපතිනී ශාර් මල්ලවආරච්චි මැතිණියට** අණදෙන නිලධාරීතුමා ඇතුළු සියළුම නිලයින්ගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටිමි. අප රෙජිමේන්තුකාරක මහා සභාවේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වන හිටපු 11 සේනාංකාධිපති වත්මන් උපකරණ මාස්ටර් ජෙනරාල් **මේජර් ජෙනරාල් පීබීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී ආර්එස්පී මැතිතුමන්** ටෙනිස් පිටිය විවෘත කල සන්ධ්‍යාවේ අප සමග ගතකිරීමට පැමිණීම වෙනුවෙන් අපගේ ගෞරවනීය ස්තූතිය පුදකර සිටින අතර, විශේෂයෙන්ම මෙම කාර්ය ආරම්භයේ සිටම අපහට උපදෙස් දෙමින් මෙම ක්‍රීඩාපිටියේ වැඩකටයුතු කිරීමට අපට දිරිමත් කල **ශ්‍රීලපාහ මධ්‍යස්ථාන සේනාවිධායක කර්නල් ජේඑස් මාසක්කාර ආර්එස්පී මැතිතුමා** හට අපගේ ස්තූතිය පුද කිරීමට මා මෙය අවස්ථාවක් කර ගනිමි. එමෙන්ම අපගේ ආරාධනය පිළිගෙන පැමිණි අපගේ චිත්ත ධෛර්යය වැඩිකරමින් අප සමඟ එම සන්ධ්‍යාව ගතකළ **අප රෙජිමේන්තුවේ ජ්‍යේෂ්ඨ සහ කණිෂ්ඨ සියළුම නිලධාරීන්ටත් සෙසු නිලයින්** හටත් අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලයින්ගේ ස්තූතිය මා මේ අවස්ථාවේදී මෙසේ ප්‍රකාශ කර සිටිමි.

**ටෙනිස් පිටිය සැකසීම වෙනුවෙන් ඒ.බී.සී ගල් කියුබ් 10 ක් පරිත්‍යාග කළ එන්.ඒ.පෙරේරා සමාගමේ අධිපති ඩබ්ඒ පෙරේරා මහතාණනි.** අපගේ අවශ්‍යතාවය වටහා ගෙන ඔබ එදා අපට දුන් සහයෝගය මුදලින් රු. 20000.00 ක් පමණ වුවද අපට එය මිළ කළ නොහැක. ඔබ කළ පරිත්‍යාගය ප්‍රයෝජනවත් ලෙස පරිහරණය කළ බැව් ඔබ වටහාගත් බව මම සිතමි. ඔබටද අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලයින්ගේ ස්තූතිය ප්‍රකාශකර සිටිමි.

මෙම ක්‍රීඩාපිටිය සැකසීම වෙනුවෙන් රු. 100000.00 ක මූල්‍ය පරිත්‍යාගයක් කල ඇමරිකානු ජාතික "ඇඩේලි ඩී බොතානෝ" මැතිණියනි, බොහෝ දුරබැහැර රටක සිට මෙරටට පැමිණි මොහොතේදී අප රටේ සිටින අප වැනි ආබාධිත සොල්දාදුවන් වෙනුවෙන් කල උදාරතර පරිත්‍යාගය අපගේ ක්‍රීඩා කෞෂල්‍ය දියුණුකර ගැනීමට අවශ්‍ය ආත්ම ශක්තිය සහ ධෛර්යය වැඩි දියුණුවී ඇත. ටෙනිස් පිටිය විවෘත කිරීමේ උත්සව අවස්ථාවට සහභාගි වීමට ඔබ තුමිය ලංකාවේ නොසිටියත්, ඔබ කළ උදාර පරිත්‍යාගය වෙනුවෙන් අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලයින්ගේ ප්‍රනාමය පුද කරමි.

ක්‍රීඩාපිටිය සැකසීම සඳහා අවැසි සිමෙන්ති ලබාගැනීමට මග පෙන්වූ මේජර් සේනක විජේසූරිය නිලධාරීවරයාණනි, ලබාගත් සිමෙන්ති පනාගොඩ දක්වා ප්‍රවාහනය කිරීම වස් ප්‍රවාහන පහසුකම් ලබාදුන් මේජර් අජිත් දිසානායක නිලධාරීවරයාණනි, ඔබ දෙපලටත් අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිළයින්ගේ භක්ති ප්‍රණාමය මේ අවස්ථාවේ පුද කරමි. තවද අපගේ ආරාධනය පරිදි විවෘත කිරීමේ උත්සව අවස්ථාවට පැමිණි **පුත්තලම සිමෙන්ති කම්හලේ ප්‍රවර්ධන කළමනාකාරතුමා සහ අධ්‍යක්ෂකතුමා ඇතුළු එම ආයතනයේ සියළුම මහත්වරුනි.** ඔබ අපට ලබාදුන් සහයෝගය ඉතාමත් අගනේය. ඔබ සැමටත් අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලයින්ගේ ප්‍රනාමය මෙසේ සහිටුහන් කරමි.

ක්‍රීඩාපිටියේ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පැමිණි සේවක මඩුල්ලට සහ වාහන 11 සේනාංක ප්‍රධාන දොරටුව වෙතින් රෙම ශ්‍රීලපාහ කඳවුර වෙත රැගෙන යාම සඳහා අනුමැතිය ලබා දුන් එවකට 11 සේනාංකාධිපතිවරුන් වශයෙන් කටයුතු කළ මේජර් ජෙනරාල් කේබී එගොඩවෙලෙ .... මැතිතුමන්, මේජර් ජෙනරාල් පීබීඩබ් ජයසුන්දර ආර්ඩබ්පී ආර්එස්පී මැතිතුමන් හට සහ 11 සේමු කාර්යය මණ්ඩලයටත් අණදෙන නිලධාරීතුමා ඇතුළු සියළුම නිලයින් වෙනුවෙන් මාගේ ස්තූතිය මෙයින් පුදකර සිටිමි.

මෙම ක්‍රීඩාපිටියට **තාරදමා ප්‍රමිතියට අනුව සකස්කර දුන් තුඩාවේ බ්‍රදර්ස් අධිපති තුඩාවේ මැතිතුමණි, ගොඩගම මාලබේ මහා මාර්ගය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියභාර ඉංජිනේරු දිසානායක මහතාණනි.** ඔබ දෙපල අප ආබාධිතයින් වෙනුවෙන් මේ කල උතුම් මෙහෙය අප සිත්සතන් වලින් ගිලිහී නොයයි. අපගේ ඉදිරි ජයග්‍රහණ සඳහා මෙය රැකුලක් වනු නොඅනුමානය. ඒකකයේ අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලයින්ගේ භක්ති ප්‍රනාමය ද පුද්ගලිකවම මාගේ හදපත්ලෙන් නැගෙන භක්තියද ගෞරව පූර්වකව පුද කරමි.

ටෙනිස් ක්‍රීඩාපිටියට විදුලි ආලෝකය ලබාදීම සඳහා අවැසි විදුලි උපකරණ නොමිලයේ ලබාදී සහාය දැක්වූ **නුගේගොඩ ට්‍රිම් ඉලෙක්ට්‍රිකල්ස් ආයතනයේ අධිපති මීපගේ මහතාණෙනි,** ඔබටද අණදෙන නිලධාරීගේ සහ සියළුම නිලයින්ගේ ගෞරවනීය ස්තූතිය මෙසේ සහිටුහන් කරමි.

එමෙන්ම රෝදපුටු ටෙනිස් ක්‍රීඩාව පිළිබඳව දැනමුතුකම් ලබාදුන් ග්‍රීන්පාත් හි පිහිටි ශ්‍රීලංකා ටෙනිස් සංගමය පසුගිය වසර දෙක මුළුල්ලේ අපට දිරිමත් කල රෝද පුටු ටෙනිස් ක්‍රීඩාව ජාත්‍යනත්‍ර මට්ටමට ගෙනයාමට ඇපකැපවී ක්‍රියාකල ශ්‍රීලංකා ටෙනිස් සංගමයේ ගරු සභාපතිතුමා, ගරු ලේකම්තුමා ජ්‍යෙෂ්ඨ කමිටු සාමාජිකයින් වන ඉන්ද්‍රකුමාර මහතා, බූඩ් මහතා සහ ජ්‍යෂ්ඨ පුහුණු උපදේශක වෙත අණදෙන නිළධාරී ඇතුළු සියළුම නිළයින්ගේ භක්ති ප්‍රනාමය පුදකර සිටිමු.

තවද මෙම ටෙනිස් ක්‍රීඩාපිටිය විවෘත කල මොහොතේ ප්‍රදර්ශණ තරග පවත්වමින් උත්සව අවස්ථාවට අලංකාර කල ක්‍රීඩකයින් සියළු දෙනාටද මෙම උත්සව සංවිධානය කළ සියළුම නිළධාරීන්ට හා මණ්ඩලවල සාමාජිකයින්ටද, මෙම ක්‍රීඩාපිටිය ගොඩනැගීම සඳහා ආරම්භක දිනයේ සිට වැඩ කණ්ඩායම මෙහෙය වූ වර්ණ සැරයන් තිලකරත්න, සැරයන් ඩේවිඩ්, ලාකෝ වික්‍රමසිංහ, සාසෙ ජාතිරත්න ඇතුළු වැඩ කණ්ඩායමටත්, ක්‍රීඩාංගනයට උචිත අන්දමින් විදුලි ආලෝකය සැලසුම් කළ ලාකෝ සමරතුංග ඇතුළු වැඩ කණ්ඩායමටත්, අපගේ අවශ්‍යතාවය පරිදි වැඩ කණ්ඩායම් ලබාදුන් බනි 11 නන්දසිරි, බනි 11 සිරිවර්ධන යන අයවළුන් හටත් අණදෙන නිලධාරීතුමාගේ ප්‍රණාමය මෙසේ පුදකර සිටිමි.

**පරිත්‍යාගශීලී දයාබර මහත්මාවරුනි, මහත්මියණි, ඔබ සැම දැක්වූ නොමද සහයෝගය හෙට දින අපගේ බලාපොරොත්තු ඉටුකර ගැනීම සඳහා විශාල රැකුලකි. ඔබ කල පරිත්‍යාග ප්‍රයෝජනවත් ලෙස යොදවා ඇති බැවින් එයින් ඔබ යම් සතුටක් ලද බැව් අප දනිමු. ඔබගේ ව්‍යාපාර දිනෙන් දිනම සාර්ථක වේවායි අණදෙන නිලධාරීතුමා ඇතුළු සියළුම නිලයින් සමග මම මෙසේ ප්‍රාර්ථනා කරන්නෙමි.**

**මේජර් ඩබ්පීඑච් මංචනායක ආර්එස්පී ශ්‍රීලපාහ**
2 වන අණදෙන නිලධාරී
රෙජි මූලස්ථාන බළඇණිය ශ්‍රීලපාහ

# බ්‍රිගේඩියර් ආර් එම් ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී

## නව මාධ්‍ය අධ්‍යක්ෂක



කල්කුඩා බලසේනාවට කල මෙහෙයට තිළිණයක්



මාධ්‍ය අධ්‍යක්ෂක තනතුර භාරගැනීමට ප්‍රථම සම්ප්‍රදායානුකූලව පොල්තෙල් පහන දැල්වූ මොහොත



මාධ්‍ය අධ්‍යක්ෂක වශයෙන් වැඩ භාර ගැනීම



නව මාධ්‍ය අධ්‍යක්ෂකට
හිටපු මාධ්‍ය අධ්‍යක්ෂකගෙන් සුභ පැතුම්

# රෝද පුටු ටෙනිස් පිටිය විවෘත කල දින විශේෂ අවස්ථා



මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී විසින් ටෙනිස් පිටිය විවෘත කිරීම.



මේජර් ජෙනරාල් එන් මල්ලවආරච්චි ආර්ඩබ්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී පොල්තෙල් පහන දැල්වූ මොහොත



හිටපු රෙජිමේන්තු ශ්‍රීලපාහ අති විසින් පොල්තෙල් පහන දැල්වූ මොහොත



ප්‍රධාන ආරාධිත අමුත්තා විසින් උත්සව සභාව ඇමතූ අයුරු



උත්සවයට සහභාගී වූ ආරාධිත අමුත්තන්



රෙජිමේන්තු ශ්‍රීලපාහ 2 වන අණදෙන නිලධාරී
මේජර් ඩබ් පී එච් මංචනායක ආර්එස්පී ශ්‍රීලපාහ විසින් ස්තුති කථාව මෙසේ සිදුකරන අ

# නව මාධ්‍ය අධ්‍යක්ෂක

## බ්‍රිගේඩියර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී, ආර්එස්පී, යූඑස්පී, පීඑස්සී

ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරී වරයෙකු මෙන්ම මඩකලපුව, වාලච්චේන කල්කුඩා හි 232 බළසේනාවේ බළසේනාධිපතිව සේවය කරමින් සිටි බ්‍රිගේඩියර් ආර්ඩබ්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී 2004.10.22 දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ ජනමාධ්‍ය අධ්‍යක්ෂක හා ශ්‍රී ලංකා යුධ හමුදා මාධ්‍ය ප්‍රකාශක ලෙස රාජකාරි භාරගන්නා ලදී.

කුරුණෑගල මලියදේව පිරිමි විද්‍යාලයෙන් සිය් සතර හදරා පාසල් අවදියෙන් පසු 1980.02.06 දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ නිත්‍ය බළසේනාවට බැඳී අංක -13 කෙඩෙට් නිලධාරී පාඨමාලාව හැදෑරීමෙන් අනතුරුව 2/ලුතිනන් වරයෙකු ලෙස අධිකාරි පත්වීම් ලැබ 1 වන බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ඇතුලත්වූ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී තත් බලඇණියේ බණ්ඩාගාර නිළධාරීවරයෙකු ලෙසින් ස්වකීය රාජකාරි දිවිය ආරම්භ කරන ලදි.

අනතුරුව බලඇණියේ බුද්ධි නිලධාරී, කණ්ඩායම් නිලධාරී අණදෙන සහ 3ශ්‍රීලපාහ ඒකකයේ 2 වන අණදෙන නිළධාරී යන තනතුරු දරා ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී 1993.10.12 දින 6 වන බල ඇණිය ශ්‍රී ලංකා පාබළ හමුදාවේ අණදෙන නිලධාරී තනතුරට පත්වන ලදී. මෙකල ද්‍රවිඩ බෙදුම්වාදී ඊලාම් යුද්ධයේ උච්චතම අවස්ථාවක් වූ අතර, තම භට පිරිස් ඉතා දක්ෂ ලෙස මෙහෙයවමින් යුධ හමුදාව විසින් දියත් කල ප්‍රධාන පෙලේ ක්‍රියාන්විතයන්ට දායකත්වය දෙමින් වඩාත් පලදායි ලෙස තම ක්‍රියාන්විත වගකීම් සැබෑ යුධ නායකයෙකු ලෙස ඉටුකර තිබීම පැසසිය යුතු කරුණකි.

අණදෙන නිලධාරී තනතුර හෙබවීමට ප්‍රථම තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී 1988 වර්ෂයේ දී යුහපුපා මාදුරුඔය ප්‍රධාන උපදේශක තනතුරෙහිද එම වසරේම එනම් 1988.10.01 දින සිට ටික කලක් කොළඹ ඒකාබද්ධ මෙහෙයුම් මූලස්ථානයෙහිද ඉන් අනතුරුව 01 වන සේනාංකයෙහි මානි 111 (බුද්ධි) තනතුරෙහිද රාජකාරි කර ඇති අතර, 1991.04.25 දින සිට 1992.01.13 දින දක්වා රෙම ශ්‍රීලපාහ විධායක අධිකාරි ලෙස රාජකාරි ඉටුකර ඇත.

1996.02.10 වන දින 6 ශ්‍රීලපාහ බළඇණියේ අණදෙන නිලධාරී තනතුරෙන් මිදී යාමෙන් පසු තත ජ්‍යෙෂ්ඨ නිලධාරී 1996.12.01 දින සිට 1998.07.20 දින දක්වා දියතලාව යුධ හමුදා විද්‍යාපීඨයේ කෙඩෙට් නිළධාරී අංශයෙහි අණදෙන නිලධාරී ලෙස රාජකාරි කටයුතු කරන ලදී. අනතුරුව 1998.07.20 දින සිට 533 බළසේනාවේ කානි බළසේනාධිපති ලෙස පත්ව එතැන් පටන් ත්‍රස්තවාදයට එරෙහිව තම භට පිරිස් සක්‍රීයව ඉතා සාර්ථක ලෙස මෙහෙය වන ලදී.

2001.09.24 වන දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ මධ්‍යස්ථාන සේනාවිධයාක ලෙස රාජකාරි භාරගත් අතර, එතුමාගේ නිල කාලයේදී රෙජිමේන්තුවේ උන්නතිය සඳහා විශාල කාර්යය භාරයක් ඉටුකරනු ලැබ තිබීම පැසසිය යුතුය. තත් ජ්‍යෙෂ්ඨ නිලධාරීගේ සේවා කාලය තුළ රෙජිමේන්තුවේ නව පිබිදීමක් ඇති වූ අතර, නව ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ මගින් සෙබල සුභසාධනය උදෙසා විශාල මෙහෙවරක් ඉටුකරන ලදී. රෙම ශ්‍රීලපාහ සේනාවිධායක තනතුරෙන් මිදී 2002.08.29 වන දින නුවර ප්‍රදේශ මූලස්ථානයෙහි අඥාපති වශයෙන්ද සුවිශේෂී මෙහෙවරක් ඉටුකරනු ලැබීය. එතුමාගේ එකී නිල කාලය තුළදී ශ්‍රී දළදා මාළිගාවට එල්ල වූ ත්‍රස්තවාදී ප්‍රහාරයේදී සුන්බුන් වලින් අපවිත්‍රව තිබූ දිය අගල සහ ඒ ආශ්‍රිත පූජා භූමිය සම්පූර්ණයෙන්ම පිළිසකර කිරීමට දියවඩන නිළමේ තුමාට දැක්වූ සහය අදත් මහනුවර වැසියන් කෘතඥතා පූර්වකව සිහිපත් කරන්නේය.

2002.02.01 දින සිට 232 බලසේනාධිපති ලෙස රාජකාරී භාරගත් තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී නැගෙනහිර පළාතේ උද්ගතව තිබූ ත්‍රස්තවාදී කණ්ඩායම් අතර අරගලයේදී ඉතා සුපරික්ෂාකාරී ලෙස සාම ක්‍රියාදාමය ආරක්ෂා කරමින් කල සේවය පැසසිය යුතුය.


තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී මේ වන විට පහත සදහන් පාඨමාලා හදාරා සකලවිධ හමුදාමය රාජකාරීන් පිළිබඳව මනා පරිචයක් ලබා ඇත.

| | | |
|---|---|---|
| කොමාන්ඩෝ නිලධාරී පාඨමාලාව | - | ඉංදියාව |
| පාබල තරුණ නිලධාරී පාඨමාලාව | - | ඉංදියාව |
| බලඇණි ආධාරක අවි පාඨමාලාව | - | ඉංදියාව |
| බුද්ධි මාණ්ඩලික නිලධාරී පාඨමාලාව | - | ඇ.එ.ජ. |
| කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව | - | ඉංදියාව |
| මාණ්ඩලික විද්‍යාලීය පාඨමාලාව | - | බංගලිදේශය |
| ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව | - | ඉංදියාව |
| බුද්ධි පාඨමාලාව | - | ඇ.එ.ජ. |
| කලමනාකාර පාඨමාලාව | - | ඉංදියාව |

ඉහත සදහන් පාඨමාලා හැදෑරීමෙන් ලත් පන්නරය සහිත වූ තත් ජ්‍යෙෂ්ඨ නිලධාරී 2004.10.22 දින සිට හමුදා මූලස්ථානයෙහි ජනමාධ්‍ය අධ්‍යක්ෂ ලෙස හා යුධ හමුදා ප්‍රකාශක ලෙස රාජකාරිය ආරම්භ කරන ලදී.

බ්‍රිගේඩියර් රත්නායක හට එකී තනතුරේ රාජකාරි නොපිරිහෙලා ඉටු කිරීමට ඇවැසි ශක්තිය හා ධෛර්යය ලැබේවායි අප ප්‍රාර්ථනා කරන්නෙමු.

ලුතිතන් කර්නල් SWMTB හුළුගල්ලේ ශ්‍රීලපාහ



# Remembering the World War 1 Dead & Wounded.

On November 11, 1918 cease fire agreed by the British & German forces to end the First World War. Since 1919 it was called Armistice Day presently as Remembrance Day. Fallen & wounded are remembered with parades & religious ceremonies. 70 million were mobilized for the WW1 & about 13 million died.

First Sri Lankan contingent of Volunteers for active service went in the French ship named "Ville de la Ciotat". It was sunk somewhere in the Mediterranean Sea by a German submarine. 14 Sri Lankans died in the sinking on the 24th December 1915. First Sri Lankan to be killed in action in WW1 was Lt GCB Loos (3rd Worcester). He was a son of Mr.FC Loos, Member of the Legislative Council.

Governor Robert Chalmers' son Lt Robert Chalmers also died in action. 49 Sri Lankans died in the WW1. 276 Britons from Sri Lanka also died fighting at the front. Altogether 325 from Sri Lanka sacrificed their lives.

Lord Mac Cauley suggested that Poppy to be the "Flower of Sacrifice & remembrance". Most of the fighting during the WW1 was in Flanders. Thousands of soldiers from both sides died at the battles were buried in the Flanders. It is a part of Belgium, France & Netherlands. Lt Col John MacCrae a Canadian doctor wrote the famous poem "we shall not sleep" or "Flanders fields" in 3rd May 1915 while serving in the front soon after the battle at Ypres. He was a Professor of Medicine at McGill University in Canada. He also had served in the Boer war (South Africa) as a gunner .The poem was published in the "Punch" magazine in 8th December 1915. It read,

*In Flanders fields the Poppies blow,*
*Between the crosses, row on row,*
*That mark our place: and in the sky*
*The larks, still bravely singing fly,*
*Scare heard amid the guns below,*

*We are the dead short days ago,*
*We lived, felt down saw sunset glow,*
*Loved and were loved, and now we lie,*
*In Flanders fields*

*Take up our quarrel with the foe,*
*To you from failing hands we throw*
*The torch be yours to hold it high,*
*If ye break faith with us who die,*
*We shall not sleep though Poppies grow,*
*In Flanders' fields.*

Col McCrae was wounded & died in France. On each Remembrance day The British Legion lays a wreath on his grave- a tribute to a great man whose thoughts were always for others.

During the WW1 in USA an American lady Miss Moira Michael who was working in the YMCA wrote the reply & to keep the faith with those who died started wearing a Poppy. She started wearing the Poppy to keep the faith on the 9 th of November 1918 two days before the Armistice was signed. Later she sold Poppies & initiated a fund for families of soldiers killed in the war. Since then the Red Poppy was considered as the symbol of remembrance for those who sacrificed their lives in Wars.
Her reply was....

**We shall keep the faith by Moira Michael**
*Oh you who sleep in Flanders fields,*
*Sleep sweet - to rise a anew,*
*We caught the torch you threw,*
*And holding high we kept*
*The faith with those who died,*
*We cherish too, the Poppy Red,*

*That grows on fields where valour led,*
*It seems to signal to the skies,*
*That blood of Heroes never dies,*
*But lends a luster to the red,*
*Of the flower that blooms above the dead,*
*In Flanders' fields.*

*And now the torch and Poppy Red,*
*Wear in honour of our dead,*
*Fear not that ye have died for naught,*
*We've learned the lesson that ye taught*
*In Flanders' fields.*

Then a French Lady Madame Medici Guerin started making Poppies with silk cloth & sold them to help French War widows in 1921.The British Legion formed in 1919 to foster the interests of ex-servicemen & their dependents. Field Marshal Earl Haig who was the first president of the Legion adopted the Red Poppy as the emblem which would "honour the dead & help the living". In England Poppy day started in 11th November 1921.

Red Poppy has been accepted as the Emblem of Remembrance & the day chosen for the wearing of the emblems was 11 th November.

These Poppies were made by disabled soldiers & sold in many countries of the then British Empire. The monies collected were sent to England to fund for the welfare of the War veterans. Since 1983 the monies collected from the sale of Poppies are being used to fund the old & disabled soldiers of ours & to help the families whose members died in the ethnic war.

The 'two minutes silence was instituted as part of the main commemorative ceremony at the Cenotaph in London on 11 th November 1919.This was proposed by an Australian journalist named Edward Honey.

**Roll of Honour World War 1 Sri Lanka**

| | |
|---|---|
| WP | de Alwis |
| A | Aiyadurai CLI |
| EL | Brohier |
| F | Drieberg |
| EF | Edema |
| HC | Foster |
| GAH | Gibson |
| Lt. R | Joseph |
| MD | Janz |
| CB | Joachim |
| 2/Lt HGH | Jan |

| | |
|---|---|
| HR | Jacotine CLI |
| CF | Kent |
| Maj REE | Kriekenbeck |
| CH | Kate |
| J | Loos |
| Lt. CGB | Loos |
| DJ | Lorensz |
| F | Ludovinci |
| CL | Mellonious |
| JB | Moldrich |
| SPM | Nell |
| F | Obeysekara |
| G | Paktsun |
| A | Paramananthan CLI |
| GF | Perera |
| SOL | Pereira |
| S | Ramanathan |
| SLV | Reimers |
| K | Redlich |
| R | Robertson |
| PC | Sirisena |
| WE | Speldewinde |
| ACK | d' Silva |
| CHS | de Saram |
| HEW | Staples CLI |
| H | St John |
| GP | Stirling |
| LG | Tussaint |
| LG | de Vos |
| L | de Vos |
| CW | de Vos |
| HAE | de Vos CLI |
| GJC | Van Rooyen |
| HG | Van Sanden CLI |
| W | Whittle |
| AC | Wijekoon |
| W | Weerakoon |
| AJ | Wells |

There are two other names only mentioned in The Ceylon Light Infantry Roll of Honour.

| | | |
|---|---|---|
| R St | John | CLI |
| BS | Hemachandra | CLI |

Except for a few, great grand children of the above dead do not remember them. They were the youth of our country who died for a global cause at that time. How many of us know that one of our great grand relative had sacrificed his life for a better world. Are we grateful for them?

I think it is time for some of us whose relatives died during the WW1 to do a small research and find out about their families & how they managed the shock of bereavement. Unlike today they did not go to war to earn money. All of them were volunteers. The British Empire did not pay a pension for their Kith & Kin as they do now. They had a cause though it is foolish in today's terms," to safeguard the Empire"

They shall grow not old,
As we that are left grow old,
Age shall not weary them,
Nor the years condemn,
At the going down of the Sun, and in the Morning,
We shall remember them
(From Laurence Binyon's poem For the Fallen-1869-1943)

## The members of the The Ceylon Light Infantry who volunteered to serve with the British durina the WW1.

| | |
|---|---|
| SAL Anthonisz | EFE Alwis |
| WA Blake | VC Brind |
| WG Buultjens | AA Carthelis |
| RW Burke | W Crutchley |
| CE Coggins | AM Carver |
| J de Cruze | LM Chapman |
| HF David | PDon |
| JAS Dias | BL Duckworth |
| DI Durham | AS Eaton |
| ESJ Eyhianghert | CA Ernest |
| JV Fernando | OD Edward |
| EJW de Fry | IV Fruigniet |
| VE Forester | BL Guinan |
| GA Galpin | A W Gunasekere |
| RD Hemachandra | HGD Helsham |
| SStJohn de la Harpe | C Henricus |
| HP Harrison | JB StJonklaas |
| CJ de Jong | EC Jacotine |
| A Jayawardane | RC Janz |
| L VSW Jayawardane | A Jones |
| SJ Janz | DA Krause |
| VT Koelmeyer | DJ Lourensz |
| GL Karunaratne | C Ludekens |
| ACB Lockhart | LD Landsberaer |
| WGD Lawrance | VJO Moldrich |
| CB Ludowyke | WK Maartensz |
| P Moriatv | J Michael |
| CF Modder | W Mamuhewa |
| C Marshall | A Manuel |
| DHG Munasinghe | V Modder |
| H Mellonius | TP Martin |
| SA Morel | JH de Niese |
| PM Nell | MA Peters |
| P O'Neil | BL Perera |
| AA Perera | GJ Pomoeus |
| BC Perera | R Prestoniee |
| FR Perera | H Poulier |
| RJ Perera | DPS Peiris |
| BMA Perera | JKT Perera |
| SW Perera | S Raiaratnam |
| BA Ruston | E Rezel |
| HDG Simon | WR Ratwatte |
| BH de Silva | P South |
| GF Siegerty | LHL de Silva |

| | |
|---|---|
| MDV Silva | E Sheriff Deen |
| RM Samsudeen | T Sebastianoulle |
| DB Seneviratne | BJ de Silva |
| AJ Sansoni | W Sirr |
| FJ Schrader | ELS Schrader |
| AD Sapideen | AL Shaw |
| HH Saldin | JC Sissouw |
| S Thomasz | R Tucker |
| P Van Twest | OC Van Sanden |
| JEH Van Hoff | KD Van Sanden |
| PA Van Geyzel | V Vanlangenburg |
| JG Vandersmagt | H Wilson |
| WB Wickramaratne | HE Williams |
| NP de Zoyza | HR Young |
| JF de Zilva | WCde Zylva |

**Major Anton Edema**
SLLI. Volunteers

## ගොඩ ගැලූ "සුනාමිය" මෙතරම් දරුණු විය...

ලෝකය වටා පිහිටා ඇති සාගරය
බලනා විටදී සවසට ගෙන දෙයි සිරිය
රැකුමට උදව් වෙනවා ධීවර දිරිය
අමතක නොවෙනු ඇත අද ඔබ කල හරිය

වියරුව ගොඩට ගැලුවා මහ සාගරය
රටටම ඇති කලා මහ ලොකු වියසනය
සුරතල් දරු පැටව් කාගෙත් පෙම්බරය
සයුරට නැතිවුනා පෙර තිබු ආදරය

මා පිය සොහොයුරන් දරුවන් අහිමිවිය
ගේ දොර ඉඩකඩන් සුන්බුන් ඉතිරිවිය
ජීවිත දස දහස් ගණනක් අහිමිවිය
ගොඩ ගැලු රළ මෙතරම් දරුණුවිය

දෙව් මව් වරුන් සිටිනා මුලු ලෝ සතර
සිහිකරනවා කොයි කවුරුත් හැම නිතර
දුක කියකියා දීවත් හැම දස අතර
සිදුවුනු විපත බැරිවිය කෙරුමට නතර

මිනිසුන් මාලුමෙන් ගොඩවල් එකතුවිය
දාහක් දෙනා තැන් තැන් වල අතුරුවිය
සිංහල දෙමල ජාතින් ඒ අතරවිය
සියලුම දෙනා සැඩ පහරට එකතුවිය

මිහිමත උපන් හැමටම මරණය උරුමයි
රළකට අසුව මියගිය හැටි හරි පුදුමයි
දහමට අනුව සිදුවූයේ කරුමයමයි
කොහොමත් කුසල් කරනා එක හරි කදිමයි

හදවත් දවන විපතකි වූයේ රටට
සිහිවන විටදී දැනෙනා බිය හදවතට
ඉපදී මියෙන මාගේ ලක් මව් රටට
පතනෙමි මෙවන් විපතක් යලි නොමවෙන්ට

සෙ/316690 සාසෙ ජයලත් ඩබ්ඩබ්බී
පාලන කණ්ඩායම 10 ශ්‍රීලපාහ

# ශ්‍රීලපාහ ඒකකයට අයත් රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ ආබාධිත ක්‍රීඩකයින්ගේ දක්ෂතා දැක්වූවන්හට රෙජිමේන්තු වර්ණ ප්‍රධානය කිරීම.

2004.11.11 දින සවස 0520 පැයට කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්වනු ලැබූ පාබල හමුදා රෙජිමේන්තුවට අයත් ආබාධිත සහිත වූවන්ගේ ක්‍රීඩා තරඟ වලින්ද, දක්ෂතා ඉදිරිපත් කර ඇති ශ්‍රීලපාහ ආබාධිත ක්‍රීඩකයින්හට රෙජිමේන්තු වර්ණ ප්‍රධානය කිරීමේ උත්සවයත් ඉතාමත් උත්සව ශ්‍රීයෙන් යුතුව රෙජිමේන්තු සේනාවිධායක ශ්‍රීලපාහගේ මගපෙන්වීම යටතේ රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ සියළුම නිළධාරීන් හා සෙසුනිළයින් විසින් සංවිධානය කරන ලදී. එම උත්සවයේ ආරාධිත අමුත්තා වශයෙන් යුධ හමුදාපති තුමන් හා එම මැතිණියද සහභාගි වන ලදී. එයට යුධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරල් වූලා සෙනෙවිරත්න මැතිතුමන් හා ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති හා නැගෙනහිර ආඥාපති මේජර් ජෙනරල් එන් මල්ලවආරච්චි, ශ්‍රීලපාහ හා රෙජිමේන්තු සේනාවිධායකතුමන්ද ශ්‍රීලපාහ නිළධාරීන් හා සෙසුනිළයින් මෙන්ම වර්ණලාභ ආබාධිත සෙනීන්ගේ ඥාතින්ද සහභාගි විය. මෙම වර්ණ රාත්‍රිය වර්ණවත් කිරීම සඳහා යුධ හමුදා තූර්ය වාදක කණ්ඩායම එයට දායකවන ලදී. දිවයිනෙ ජනප්‍රිය ගායක ගායිකාවන් වන සනත් නන්දසිරි, මල්කාන්ති නන්දසිරි, සුනිල් එදිරිසිංහ, එච්එච් ජයකොඩි, ටී එම් ජයරත්න යන අය ගීතයෙන් ගීතවත් කරන ලදී. ඉන්පසු පැවති වර්ණ ප්‍රධානය කිරීමේ උත්සවය සඳහා එහි ආරාධිත අමුත්තා වශයෙන් පැමිණි යුධ හමුදාපතිතුමන් අතින් දක්ෂතා ලබාසිටි ශ්‍රීලපාහ අබාධිත ක්‍රීඩකයින්හට වර්ණ ප්‍රධානය කරන ලදී. හොඳම ක්‍රීඩා කුසලතාවයන් ලබාසිටි රෙජිමේන්තුවට හිමි කුසලානය රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ අණදෙන නිළධාරීතුමන් හට යුධ හමුදාපතිතුමන් විසින් පිළිගන්වන ලදී.



ඉහත ඡායාරූපයේ දක්වෙනුයේ ආබාධිත තත්ත්වයට පත්වුවද තම රෙජිමේන්තුවටත් ශ්‍රීලංකා යුධ හමුදාවටත් ශ්‍රීලංකාද්වීපයටත් ඉමහත් ගෞරවයක් ලබාදෙමින් තම ක්‍රීඩා කුසලතාවයන් වැඩිදියුණු කර ගනිමින් දෙස් විදෙස් රටවල සංචාරය කරමින් ක්‍රීඩා දක්ෂතාවයන් දක්වූ සෙ/303135 කෝප්‍රල් වීරසිංහ කේඑස්-3 ශ්‍රීලපාහ යන ක්‍රීඩකයා හට යුධ හමුදාපතිතුමන් විසින් වර්ණ ප්‍රධානය කිරීමේ අවස්ථාව.



ඉහත ඡායාරූපයේ දක්වෙනුයේ යුද්ධයේදි ආබාධිත තත්වයටපත් වුවද තම ශක්තිය වැයකර රෙජිමේන්තුවට හා ඒකකයට ඉමහත් ගෞරවයක් ලබාදුන් සෙ/304370 ලාකෝ බුද්ධික වීඑස්-3 ශ්‍රීලපාහ යන සෙනීහට තම රෙජිමේන්තුවට හා ඒකකයට මෙම ආබාධිත රණවිරුවාගෙන් ලැබී ඇති ගෞරවයට ප්‍රනාමයක් වශයෙන් රෙජිමේන්තු වර්ණ යුධ හමුදාපති තුමන් අතින් ප්‍රධානය කෙරිණි.



ශ්‍රීලංකා පාබළ හමුදා අන්තර් ඒකක මළල ක්‍රීඩා උලෙළදී දක්ෂතම ක්‍රීඩා කණ්ඩායම ලෙස රෙජිමේන්තු මූලස්ථාන බළ ඇණි කණ්ඩායම හිමිකර ගන්නා ලදී. ඒ සඳහා රෙජිමේන්තු මූලස්ථාන බැළඇණියේ අණදෙන නිළධාරීතුමන් ඇතුළුව සියළුම නිළධාරීන් හා සෙනීන් රෙජිමේන්තු මූලස්ථාන බළඇණියේ ක්‍රීඩකයින් දිරිගන්වමින් විශාල සහයක් ලබාදුන් අතර, දක්ෂතම බළඇණියට හිමි කුසලානය යුධ හමුදාපතිතුමන් අතින් රෙජිමුබ ශ්‍රීලපාහ අණදෙන නිළධාරීතුමන් වෙත ප්‍රධානය කරන ලදී.

**බුද්ධි අංශය - රෙජිමුබ ශ්‍රීලපාහ**



# පුනරින් කඳවුර බේරා ගැනීමට දිවිදුන් රණවිරුවන් සැමරේ

සෑම වසරකම නොවැම්බර් මස 11 වන දින 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට විශේෂ දිනයකි. ඒ මෙම බළඇණිය පුනරින් කඳවුරේ රාජකාරි කරමින් සිටයදී 1993 නොවැම්බර් මස 11 වන දින සිට 14 වන දින දක්වා එම කඳවුර වෙත එල්ල වූ දැවැන්ත ත්‍රස්තවාදී ප්‍රහාරය නිසාවෙනි.

එම කාල වකවානුව තුළදී මියගිය හා අතුරුදහන් 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සියළුම රණවිරුවන් සිහිපත් කර ඉතා උසස් අන්දමින් පිංකම් මාලාවක් මෙම බළඇණියේ අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලධාරීන හා සෙසු නිලයින් විසින් සිදු කරනුයේ හදපිරි භක්තියෙනි.



**ප්‍රදේශ මුලස්ථානය (මන්නාරම) ස්ථාපිත ස්මාරකය අභියසදී අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලයින් මියගිය රණවිරුවන් සිහිපත් කිරීම**

ඒ අනුව වර්ෂයක් පසා පවත්වාගෙන යන මෙම පිංකම් මාලාව මෙවර නොවැම්බර් මස 10 වන දින සංධ්‍යාවේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස පවත්වනු ලැබූ බෝධි පූජාවෙන් ආරම්භ වූ අතර, ඒ සඳහා බළඇණියේ නිලධාරීන් හා සෙසු නිලයින් බොහෝ දෙනෙකු සහභාගී විය. මියගිය එක් රණවිරුවකු වෙනුවෙන් එක් නෙළුම් මල් වට්ටියක් බැගින් මල් වට්ටි 168 ක් 11 වන සංවත්සරය වෙනුවෙන් නෙළුම් මල් 11 බැගින් ඇතුළත් වන සේ සකස් කර ඉතා මනස්කාන්ත අන්දමින් යුතුව ජය ශ්‍රී මහා බෝධිය අභියස 1 ශ්‍රීලපාහ යනුවෙන් දැක්වෙන සේ සකසා තිබීමෙන් එය දුටු දෙස් විදෙස් බැතිමතුන්ටද මෙම පිංකම සිත් ඇඳගන්නාසුළු සිදුවීමක් විය.



**බෝධි පූජාව සඳහා සූදානම් වන 1 ශ්‍රීලපාහ සෙනීන්**

ඉන් අනතුරුව 2004 නොවැම්බර් මස 11 වන දින දහවල් 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ ක්‍රියාමූලය ස්ථානගත මන්නාරම දේවස්ථාන කඳවුරේදී මහා සංඝයා වහන්සේ උදෙසා සංඝගත දක්ෂිනාවක් පවත්වා පිංපෙත් අනුමෝදන් කරන ලදී.

මීට සහභාගී වූ ගරුතර මහා නායක ස්වාමීන් වහන්සේගේ දායකත්වයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව තුළ දක්නට ලැබෙන ඉතාම උසස් ලෙස මෙම පිංකම සෑම වර්ෂයකම පවත්වනු ලබීම වඩාත් අගය කළයුතු බවත් ඒ සඳහා ඉතාමත් කැපවීමෙන් පාබල හමුදාවේ නිළධාරීන් සහ සියළුම නිළයින් කටයුතු කිරීම ඉන් උසස් තත්වයක් වඩාත් පිළිඹුබු වන බව ප්‍රකාශ කළහ.



**මහා සංඝයා උදෙසා දානය පිළිගන්වන නිළධාරීන්/සෙනීන්**

**සෑම වසරකම නොවැම්බර් මස 11 වන දින 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට විශේෂ දිනයකි. ඒ මෙම බළඇණිය පුනරින් කඳවුරේ රාජකාරි කරමින් සිටියෙදී 1993 නොවැම්බර් මස 11 වන දින සිට 14 වන දින දක්වා එම කඳවුර වෙත එල්ල වූ දැවැන්ත ත්‍රස්තවාදී ප්‍රහාරය නිසාවෙනි. එම කාල වකවානුව තුළදී මියගිය හා අතුරුදහන් 1 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සියළුම රණවිරුවන් සිහිපත් කර ඉතා උසස් අන්දමින් පිංකම් මාලාවක් මෙම බළඇණියේ අණදෙන නිලධාරී ඇතුළු සියළුම නිලධාරීන් හා සෙසු නිලයින් විසින් සිදු කරනුයේ හදපිරි භක්තියෙනි.**

මේ අවස්ථාවට 1 වන බළඇණියේ දෙවන අණදෙන නිලධාරී හා සියළුම කණ්ඩායම් නිලධාරී අණදෙන වරුන්ද, කණ්ඩායම් සැරයන් මේජර්වරුන් ඇතුළුව සියළුම සෙසුනිලයින් සහභාගී වූහ.



**දානය අවසානයේ පිරිත් සජ්ඣායනයට සහභාගී වන 2 අනි ඇතුළු අනෙකුත් නිළධාරි/සෙනින්**



# ශ්‍රී ලංකාවේ දෙවන ගුවන් හමුදාපති හා සම්බන්ධ විශේෂ සිදුවීම් සමහරක්

ශ්‍රී ලංකාවේ රාජකීය ගුවන් හමුදාවේ දෙවන ගුවන් හමුදාපතිවරයා වූ එයා(ර්) වයිස් මා(ර්)ෂල් ජෝන් ලින්ඩ්සේ බාක(ර්) (Air Vice Marshal John Lindsay Barker, LLB, DFC, RAF) 2004 මැයි මස 07 වන දින එක්සත් රාජධානියේ ලස්ට්ලේ, ඩෙවන්ෂයර් වල පිහිටි සිය නිවසේදී අභාවප්‍රාප්ත වී තිබේ. මිය යන විට මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී 93 වන වියෙහි ඉතා නිරෝගීව පසුවිය.

බැරිස්ටර්වරයෙක් වූ (Barrister - at -Law) එයා(ර්) වයිස් මා(ර්)ෂල් බාක (ර්) රාජකීය ගුවන් හමුදාවේ දක්ෂ ප්‍රහාරක ගුවන්නියමුවෙක් වේ. බ්‍රිතාන්‍ය රජය විසින 1958 දී ශ්‍රීලංකාවේ රාජකීය ගුවන් හමුදාවේ ප්‍රධානියා ලෙස ඒ මහතාව පත්කරන ලදී. ගුවන් කොමදෝරු ජී.සී. බ්ලේඩන් රාගුහ (Air Commodor GC Bladon, RAF) වෙතින් එයා(ර්) වයිස් මා(ර්)ෂල් බාක(ර්) ගුවන් හමුදාපති තනතුර භාරගන්නා ලදී. ගුවන් හමුදාපති පදවිය දරමින් සිටි කාලයේදී එයා(ර්) වයිස් මා(ර්)ෂල් බාක(ර්) රාජකීය ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සාමාජිකයන් බඳවා ගැනීමට හා ඔවුන් විදේශ රටවල පුහුණු කිරීමෙහිලා ඉතා විශාල කාර්ය භාරයක් ඉටුකළේය. එමෙන්ම ශ්‍රී ලංකාවේ ගුවන් හමුදාව පිහිටුවීමෙහිලා යටිතල පහසුකම් සැපයීමට ද උත්සුක වූ නිලධාරියෙක් වශයෙන්ද ප්‍රකටය. ශ්‍රී ලංකා රාජකීය ගුවන් හමුදාව ලද ප්‍රථම ජෙට් ගුවන් යානය වූ "Jet Provost " යානය මෙම ගුවන් හමුදාපතිවරයාගේ සේවා කාලය තුළදී ලබාගන්නා ලද්දකි.


ගුවන් හමුදා නිලධාරීන් හට නායකත්ව ගුණාංගයන් මෙන්ම සිය වෘත්තීමය ගරුත්වය ආරක්ෂා කරගන්නා අයුරු ආදර්ශයෙන් පෙන්වූ නිලධාරියකු වශයෙන්ද ගෞරවයක් උසුලයි. ගුවන් හමුදාපතිවරයා දිනක් දියතලාව ගුවන්හමුදා කඳවුර බලා ගමන් කරමින් සිටියේය. ඒ සිදුකිරීමට නියමිත වාර්ෂික පරීක්ෂණය සඳහාය. හපුතලේදී මත් බීම හලක් අසල ගුවන් හමුදා ජීප් රථයක් නතරකර තිබෙනු ගුවන් හමුදාපතිවරයා දුටුවේය. නිල ඇඳුමින් සැරසුණු තරුණ ගුවන් හමුදා නිලධාරියෙකුද මත්බීම හල තුළ සිටුනු දුටුවේය. ඒ දෙස ඉතා විමසිල්ලෙන් බැලූ එයා (ර්) වයිස් මා(ර්)ෂල් බාක(ර්) දියතලාවට ගියේය.

පසුදින දියතලාව ගුවන් හමුදා කඳවුරේදී අදාල වාර්ෂික පරීක්ෂණය පැවැත්වුණු අතර, එයට පසුව දිවා භෝජන සංග්‍රහයක්ද පැවැත්විණි. දිවා භෝජන සංග්‍රහය සඳහා ගුවන් හමුදාපතිවරයාගේ පැමිණීම අපේක්ෂාවෙන් පැමිණ සිටි සියළුම ගුවන් හමුදා නිලධාරීන් පිට කාමරය (Ante-room) තුළ රැස්වී සිටියහ. මිනිත්තු කිපිහයකට පසුව ගුවන් හමුදාපතිවරයා සිය අධිසහායක නිලධාරියාද සමඟින් පැමිණියේය. ගුවන් හමුදාපතිවරයා නිලධාරීන් ද සමඟ කොක්ටේල් සාදය සඳහාද සහභාගි වෙමින් අල්ලාප සල්ලාපයෙන් පසුවූ අතර එයින් පසුව දිවා භෝජනය ලබා ගැනීමට සියළුම දෙනා සූදානම් වූහ. එම අවස්ථාවේදී ගුවන් හමුදාපතිවරයා උස් හඬින් ''ඊයේ තැබෑරුමේ හිටිය නිලධාරියා කවුද? එයා මොකක්ද එහෙ කරන්නේ?'' යැයි ඇසුවේය. (Who was the officer in that bloody tavern yesterday, and what the bloody hell was he doing there?)

''නිලධාරි යන්නේ නැහැ බාර් වලට නිල ඇදුමින්. අනික් දවසෙ තමුසෙගෙ බඩ බොකු ගන්නව ගාටරයට. තමුසෙට ඇහුනද?''("Officers do not go into bloody bars in uniformms. Next time I will have your guts for garters, You hear?")

ඇල්පෙනෙත්තක් වැටුණත් හඬ ඇසෙන නිශ්ශබ්ධතාවයක් ඇතිවිය.
''ඔ-ඔ-ඔව් සර්.'' ("Y - Y- Yes Sir.")

එම තරුණ නිලධාරියා එසේ ගොත ගසමින් පවසා ඉක්මනින් කාමරයේ කොනටම ගියේය. එවිට ගුවන් හමුදාපතිවරයා විගසින් එම තරුණ නිලධාරිය වෙත ගියේය. ඔහුගේ කරට අත දැම්මේය. එලෙස කරට අත දමාගෙන ඔහුද සමඟ ඒ අසල ඇති බීම හලේ කවුන්ටරය වෙත ගියේය. ගුවන් හමුදාපතිවරයා සිය දෑස් තරුණ නිලධාරියාගේ දෑස් වෙත යොමා ඔහුගේ මුල් නමින් ආමන්ත්‍රණය කොට ඔහු බීමට කැමති මොනවාදැයි විමසුවේය.



*Barker inspecting a guard of honour*

''ජින් හා ටොනික් සර්'' ( "Gin and tonic, Sir ) පිළිතුර එය විය. දෙදෙනාගේ වීදුරු දෙක එකිනෙකට වද්දා මදුපාන ආරම්භයට ගුවන් හමුදාපති වෙතින් සුබ පැතිණි. ("Cheers all round") පසුව ගුවන් හමුදාපතිවරයා එම තරුණ නිලධාරියා හට සමුදී ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සිටින දෙසට ගියේය.

පසුව කඳවුරේ අණදෙන නිලධාරි සහ බ්‍රිතාන්‍ය ගුවන් හමුදා නිලධාරියෙකු විසින් නිලධාරීන් හට හමුදා සම්ප්‍රදායට අනුව නිල ඇඳුමින් තැබෑරුම්, හෝටල්, සිනමා ශාලා, පල්ලි, හා සාප්පු වැනි පොදු ස්ථාන වල ගැවසීමෙන් වැළකී සිටිය යුතු බව පැහැදිලි කරදෙන ලදී.

පෙරදින හපුතලේ තැබෑරුමට ගිය තරුණ නිලධාරියා ගල්ගැසී මොහොතක් බලා සිටියේය. මේ කියන්නේ තමා පිළිබඳව යයි තේරුම් ගත් එම තරුණ නිලධාරියා පියවරක් ඉදිරියට තබා වෙව්ලන දෑතින් යුතුව සීරුවට පැමිණියේය.

''මමයි සර්, අද උත්සවයට අවශ්‍ය කරන බීම මිලදී ගන්න ගියේ. මමයි බීම හල භාර නිලධාරී'' ("Me Sir, I was making purchases for todys function. I am the Bar officer.") ගුවන් හමුදාපතිවරයා තරුණ නිලධාරියා දෙස දැඩි බැල්මක් හෙලා සිය ගැඹුරු හඬ යළි අවධි කළේය.

එවකට අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රජය ඉමහත් අවදානමකට ලක්වූ අවස්ථාවේ දී මෙම ගුවන් හමුදාපති එයා(ර්) වයිස් මා(ර්)ෂල් බාක(ර්) වෙතින් විශේෂ සේවාවක් ඉටුවුනි. ඒ 1962 දී රජය පෙරලා දැමීම සඳහා හමුදා කුමන්ත්‍රණයක් ඇතිවූ අවස්ථාවේදීය. එම තීරණාත්මක ප්‍රශ්ණගත අවස්ථාවේදීද අගමැතිනියගේ විශ්වාසය දිනා ගනිමින් කුමන්ත්‍රණය ව්‍යර්ථ කිරීම සඳහා විශාල කාර්යය භාරයක් ඉටුවුනි. එම හමුදා කුමන්ත්‍රණය මැඩ පැවැත්වීම සඳහා ගුවන් හමුදාපතිවරයාට එවකට රාජකාරීමය වශයෙන් සහය දැක්වූ

දැනට එක්සත් රාජධානියේ පදිංචි 1965 දී විශාම ලත් රාජකීය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙක් වූ බලසෙන නායක එස්එන් සමරසිංහගේ සඳහන් කිරීමකට අනුව එම රාජකාරිය දෙදෙනාගේම වෙහෙසකර මෙන්ම වේදනාත්මක රාජකාරිය වී තිබේ. කුමන්ත්‍රණයට සම්බන්ධ නායකයන් අත්අඩංගුවට ගැනීමටත්, ඔවුන්ව වැලිකඩ බන්ධනාගාරයෙහි රඳවා තැබීමටත් දැඩි කැපවීමකින් යුතුව කටයුතු කර රජය බේරාගෙන තිබේ. ( "Air Vice Marshal Barker was the man who saved constitutional government in Colombo - in other words - he will go down in history as the man ( a British officer, of very much the "old school" officer corps") who did his duty by the Ceylon Government of the day.")

1965 දී විශ්‍රාම ලත් දැනට ඇ.එ.ජ. හි පදිංචිව සිටින රාජකීය ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ නිලධාරියෙක් වූ බලසෙන නායක නිහාල් රත්නායක ගේ සඳහන් කිරීමකට අනුව ශ්‍රී ලංකාවේ ජාතික නිදහස් සමරුවට පෙරදිනක විශේෂ සිදුවීමක් වී තිබේ. සම්ප්‍රදායානුකූලව පැවැත්නේ හමුදා සරඹ සංදර්ශනය සඳහා ගුවන් හමුදාවද සූදානම් විය. අවසන් පෙරහුරුව ද පවත්වන දිනයද උදා විය. එහෙත් නිසි වේලාවට ගුවන් හමුදා පිරිසට එය සහභාගි වීමට නොහැකි විය. නිදහස් චතුරශ්‍රය දක්වා පැමිණෙන මාර්ගයේ අතරමග පැවති වාහන තදබදය හේතුවෙන් ප්‍රමාද වූ නිසාය. එවිට ගුවන් හමුදාපතිවරයා අගමැති සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය වෙත කෙලින්ම ගොස් හමුදා සරඹ පෙළපාලියේ අවසන් පෙරහුරුව ප්‍රමාද වී පැවැත්වීමට සිදුවීම පිළිබඳව සම්පූර්ණ වගකීම තමා විසින් භාර ගන්නා බව පවසමින් සිය ඉල්ලා අස්වීම ඉදිරිපත් කළේය. එහෙත් එයා(ර්) වයිස් මා(ර්)ෂල් බාක(ර්) කෙරෙහි පැවති ගෞරවය හා පැහැදීම නිසා මැතිනිය එය ප්‍රතික්ෂේප කළාය.


එයා(ර්) වයිස් මා(ර්)ෂල් බාක(ර්) 1962 දක්වා ගුවන් හමුදාපති ධූරය දැරූ අතර, ඒ මහතාට පසුව එයා(ර්) වයිස් මා(ර්)ෂල් ඊආර් අමරසේකර, ඩීඑෆ්සී ඇන්ඩ් බාර්, ඒඊඑම්, රාලගුහ ප්‍රථම ශ්‍රී ලාංකික ගුවන් හමුදාපතිවරයා ලෙස පත්විය.

( "Sunday Island") පුවත්පතෙහි පළවූ විශ්‍රාමික ගුවන් හමුදා නිලධාරියෙකු වූ පක්ෂාංග කොමදෝරු ඊඑච් ඕල්මස් විසින් එයා(ර්) වයිස් මා(ර්)ෂල් ජෝන් ලින්ඩ්සේ බාක (ර්), එල්එල්බී, ඩීඑෆ්සී, ආර්ඒඑෆ් පිළිබඳව ලියන ලද ( "The man who arrested the 1962 coup leaders dies in UK" යන ලිපිය ඇසුරෙනි.

**ලුතින් තරිඳු වීරසිංහ** - 2 ශ්‍රී ලපාහ
ආණ්ඩුකාර කාර්යාලය
උතුරු නැගෙනහිර පළාත් සභාව- ත්‍රිකුණාමලය.

# බ්‍රිගේඩියර් එන්ඒ ජයසූරිය ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී ගේ 4 ශ්‍රීලපාහ ඒකක සංචාරය

2004 ඔක්තෝබර් මස 15 වන සිකුරාදා දිනය මෙම ඒකකයේ සියළුම නිලයින් හට ඉතා වැදගත් දිනයකි. මන්දයත් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මෙන්ම 52 සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් කටයුතු කරන බ්‍රිගේඩියර් එන්ඒ ජයසූරිය ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී 4 ශ්‍රීලපාහ ඒකකයේ සංචාරයේ යෙදීමයි.



**බ්‍රිගේඩියර් එන්ඒ ජයසූරිය ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස් සී විසින් සම්මාන මුරයේ ආචාර පිළිගනිමින්.**

උදෑසන 0940 පැයට පමණ 52 සේනාංකාධිපතිතුමා ප්‍රධාන දොරටුව ඉදිරිපිටට සම්ප්‍රාප්ත වූ අතර අණදෙන නිලධාරී විසින් සේනාංකාධිපතිතුමා පිළිගන්නා ලදී. අනතුරුව සේනාංකාධිපතිතුමා විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීමෙන් අනතුරුව රෙසැමේ ඇතුලු ඒකකයේ සියළුම ජ්‍යෙකොනොනිවරුන් හඳුනාගන්නා ලදී. ඉන් අනතුරුව සේනාංකාධිපති විසින් නිලධාරී නිවස්නයේදී ඒකකයේ සියළුම නිලධාරීන් හඳපිරි සතුටින් හඳුනාගන්නා ලදී.

**බ්‍රිගේඩියර් එන්ඒ ජයසූරිය ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස් සී විසින් ඒකකයේ ජ්‍යෙකොනොනින් හඳුනාගනිමින්.**



නිලධාරී නිවස්නයේදී පැමිණ සිටි සියළුම නිලධාරීන්ට දිවා භෝජන සංග්‍රහයක් පිළිගන්වන ලද අතර ඉන් අනතුරුව එය අවසානයේ සේනාංකාධිපතිතුමා අමුත්තන් සටහන් තබන පොතේ සටහන් තබා අණදෙන නිලධාරීතුමාට හා සියළුම නිලධාරීන්ට සමුදී පිටව ගියහ.



**බ්‍රිගේඩියර් එන්ඒ ජයසූරිය ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස් සී විසින් අමුත්තන් සටහන් තබන පොතෙහි සටහන් තැබීම සිදුකරමින්.**

**ලුතිනන් යූඑල්ඩීකේ පෙරේරා ශ්‍රීලපාහ** - බුද්ධි නිළධාරී 4 ශ්‍රීළපාහ

THE WHITE HACKLE

2004
Sheltering Colours of Life
Sri Lanka Light Infantry

# Colours fest'04
# වර්ණ ප්‍රධානෝත්සවය - 2004

ශ්‍රී ලංකා යුධ හමුදාවේ ආරම්භක පුරෝගාමී රෙජිමේන්තුව වන ශ්‍රී ලංකා පාබල හමුදාව පෞඩ ඉතිහාසයකට හිමිකම් කියමින් හමුදාමය ක්‍රියාකාරකම් වලදී මෙන්ම ක්‍රීඩා හා බාහිර ක්ෂේත්‍රයන්හිදී ප්‍රමුඛස්ථානය උසුලනු ලැබීය. පනහ, හැට, හැත්තෑව යන දශකවලදී විශේෂයෙන්ම ක්‍රීඩාව තුළින් පාබල සෙබලුන් දක්වන ලද විශිෂ්ඨ දස්කම් ඉතිහාසගත අප රෙජිමේන්තු තොරතුරු පරිශීලනයෙන් අපට දැනගත හැක. එම කාල වකවානුව තුල විදේශයන්හිදී තරඟ ජයග්‍රහණය කල හා ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා සංචිතය නියෝජනය කල ක්‍රීඩකයන් රැසක් ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් සාමාජිකයින් වීම අප කාහටත් අඩම්බරයකි.

දශක දෙකකටත් වඩා වැඩි කාල පරිච්ඡේදයක් තුල උතුරු/නැගෙනහිර පැවති වර්ගවාදී යුද්ධයට ඉදුරාම ජීවිත පරිත්‍යාගයෙන් යුතුව දයකවී පැවරුණු රාජකාරිය නොපිරිහෙලා ඉටුකල හෙයින් අප සෙබලුන් සැලකිය යුතු ප්‍රමාණයක් ජීවිතක්ෂයට/අබාධිත තත්වයට පත්වන ලදී.

දැනට රටතුළ පවතින යුධ මුක්ත වාතාවරණය හමුවේ යුද්ධයට පෙර හා එම කාලවකවානුව තුලදී අප රෙජිමේන්ත සෙබලුන් සතු බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි අවධානය යොමු කොට විශේෂයෙන්ම ක්‍රීඩා ක්ෂේත්‍රයේදී සෙබලුන් සතු සුවිශේෂී දක්ෂතාවන් ඔප්නංවා ගැනීමවස් ඔවුන්ගේ දක්ෂතාවයන් ඇගයීමකට ලක් කිරීමේ මූලික අඩිතාලමක් ලෙස සංවිධානය කරන ලද වර්ණ හා ජය සංකේත ප්‍රධානෝත්සවය ශ්‍රී ලංකා යුධ හමුදාධිපති තැන්පත් ලුතිනන් ජෙනරාල් SHS කෝට්ටේගොඩ WWV, RWP, RSP, USP, ndc සහ එම මැතිණියගේ ප්‍රධානත්වයෙන් 2004/11/11 දින සන්ධ්‍යාවේ බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

මින් පෙර රට හා ජාතිය වෙනුවෙන් කරන ලද මෙහෙවරේදී දෑත් දෙපා ශරීරයේ අනෙකුත් අවයවයන් අහිමිවී ආබාධිත තත්ත්වයට පත්වූ රණවිරුවන් 09 දෙදෙනෙකු හට යුධ හමුදා ආබාධිත ක්‍රීඩා උළෙල, ආබාධිත සහිත වූවන්ගේ ජාතික ක්‍රීඩා උළෙල, සහ විදේශීය රටවල දී පැවැත්වූ ආබාධිත ක්‍රීඩා තරඟ සඳහා ඉදිරිපත්ව එම තරඟ වලදී තම දක්ෂතාවයන් පෙන්නුම් කරමින්, ශ්‍රීලපාහ රෙජිමේන්තුවටත් යුධ හමුදාවටත් ගෙන දුන් ගෞරවය හේතුවෙන් 1998 ජූලි මස 25 දින බම්බලපිටිය පොලිස් ක්‍රීඩාංගනයේදී එවකට රෙජිමේන්තු අධිපතිව සිටි මේජර් ජෙනරාල් A.K. ජයවර්ධන RWP, RSP, USP, rcds, psc (දැනට ආරක්ෂක ලේකම් තනතුර දරණ) අතින් වර්ණ පිරිනමන ලදී.

ප්‍රධාන ආරාධිත අමුත්තන්ගේ පැමිණීමත් සමග නර්ථන දායකත්වය ලබාදුන් පද්මිණී දහනායක ආරියදාස ශිල්පිනියගේ කුඩා සිසුවියන් දෙදෙනෙකු විසින් යුධහමුදාපති, යුධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, රෙජිමේන්තු අධිපති ඇතුලු ආරාධිත භවතුන් පොල්තෙල් පහන්සිල දැල්වීම සඳහා කැඳවාගෙන ගිය අතර, පොල්තෙල් පහන දැල්වීමෙන් පසු රංගනා ආරියදාස ශිල්පිණිය ඇතුළු සිසුවියන් විසින් පිළිගැනීමේ නර්ථනය ඉදිරිපත් කරන ලදී. ඉන්පසු දේශය වෙනුවෙන් දිවි පිදූවන් විනාඩි 02 ක නිහඬතාවයකින් සිහිකිරීමෙන් අනතුරුව රෙජිමේන්තු ගීතය ගායනා කරන ලදී. එහිදී බළඇණි ගීතයට උචිත පරිදි පසුබිමෙන් රූපරටා උත්සවය සඳහා පැමිණි සිටි සියලුම අයවලුන්ගේ නෙත් සිත් ඇඳබැඳගන්නා පරිදි දිස්වීමට සලස්වා තිබීම ඉතාමත් දැකුම්කළුය.

පැමිණි සිටි සියළුම අයවලුන් ආදර භක්තියෙන් පිලිගත් රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් N මල්ලවආරච්චි RWP, USP, ndc, psc වර්ණ ජය සංකේත උළෙලේ අභිප්‍රාය හා අභිමතාර්ථයන් පිළිබඳව කෙටි හැදින්වීමක්ද කරන ලදී.

පද්මිණී ආරියදාස නර්ථන ශිල්පිණිය විසින් පූජා නැටුම ඉදිරිපත් කරන ලදී. ගායන ශිල්පී විශාරද සුනිල් එදිරිසිංහ මහතා විසින් ''රන් මලක් ලෙස දෙව් බඹුන් '' ගීතය ගායනා කල අතර යුධ හමුදා නර්ථන කණ්ඩායමේ සාමාජිකාවන් එයට නර්තන දායකත්වය ලබාදී පැමිණසිටි අයවලුන්ගේ සිත් ප්‍රබෝධමත් කිරීමට සමත් ඩිය.

ඉන්පසුව යුධ හමුදා සංස්කෘතික නර්ථන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද වෙස් නැටුමකින් පසුව වර්ණ ප්‍රධානෝත්සවයේ ප්‍රථම අදියර රෙජිමේන්තු අධිපතිතුමන් අතින් සිදුකෙරුණ අතර එහිදී රෙජිමේන්තු මට්ටමින් ජයග්‍රහණය ලබාගත් අයවලුන් වෙත ප්‍රථමයෙන් වර්ණ ප්‍රධානය කරන ලදී. සියළුම අයවලුන්ගේ ආකර්ෂණය තමන් වෙත නතුකර ගනිමින් නර්ථන ශිල්පී සුරාජ් මාපා හා සහායිකාව බටහිර



නර්ථනයක් ඉදිරිපත් කල අතර, ඉන්පසු ගායන ශිල්පී විශාරද එඩ්වඩ් ජයකොඩි විසින් ද ගීතයක ගායනා කරන ලදී. පැමිණි සිටි සියලුම අයවලුන්ගේ රසාස්වාදය උදෙසා යුධ හමුදා නර්ථන කණ්ඩායම විසින් පහත රට නර්ථනයන් ඉදිරිපත් කල අතර, එයද සැමගේ සිත් සතන් පිනවීමට ඉවහල් විය.

ඉනික්බිතිව වර්ණ ප්‍රධානෝත්සවයේ දෙවන අදියරේ වර්ණ පිරිනැමීම සඳහා ලක් හඬ ගුවන් විදුලියේ හා ITN රූපවාහිනී නාලිකාවේ නිවේදිකා හා මෙම වර්ණ රාත්‍රියේ සිංහල මාධ්‍යයෙන් නිවේදන කටයුතු කල ලංකා පෙරේරා මෙනවිය විසින් යුධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරාල් AMWCB සෙනෙවිරත්න මැතිතුමන් හට ආරාධනය කල අතර එම අදියරේද රෙජිමේන්තු මට්ටමින් ජයග්‍රහණය කල අයවළුන්ට හා යුධ හමුදා සංචිතයන් නියෝජනය කල අයවළුන්හට වර්ණ ප්‍රධාන කරන ලදී.

වර්ණ ප්‍රධානයේ දෙවන අදියරේ අවසානයත් සමගම ගායන ශිල්පී TM ජයරත්නයන් යුධ හමුදා සංගීත කණ්ඩායමේ සංගීත සත්සරයන්ට ගීතවත් වූ අතර, යුහ නර්ථන කණ්ඩායමෙන් ඒ සඳහා නර්ථන දායකත්වයක් ලැබිණ. ඉංදියානු ගැමි නර්ථනයක් ඉදිරිපත් කල රංගනා ආරියදාස ශිල්පිණියගේ සිසුවියන් වේදිකාවෙන් නික්ම ගිය අතර, සංගීත් නිපුන් සනත් නන්දසිරි ගායනා කල "මගේ රටට දළදා හිමි සරණයි" ගීතයේ පදවැල් ප්‍රේක්ෂකාගාරයේ සිටි සැමගේ මුවින් පිටවුයේ ඔවුන්ටත් හොරා ඉබේටමය.

ෆයිසාල් බොන්සෝ මහතා විසින් තෙවන හා අවසාන අදියරේ වර්ණ හා ජය සංකේත ප්‍රධානය සඳහා යුද්ධ හමුදාධිපති තැන්පත් ලුතිනන් ජෙනරාල් SHS කෝට්ටේගොඩ WWV, RWP, RSP, USP ndc මැතිතුමන් හට ආරාධනා කල අතර එතුමා වේදිකාව වෙත කැඳවාගෙන එනු ලැබුවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් N මල්ලවආරච්චි RWP, USP, ndc, psc විසිනි. ශ්‍රී ලංකාව නියෝජන කරමින් ජාත්‍යන්තර තරගවලදී ජයග්‍රහණ ලබාගෙන රටටත් යුධ හමුදාවටත් අප රෙජිමේන්තුවටත් ගෙනදුන් ගෞරවය වෙනුවෙන් යුද්ධ හමුදාධිපතිතුමන්ගේ පැසසුමට ලක්වෙමින් වර්ණ ලාභීන් පිදුම් ලද අතර. ඉන්පසුව පසුගිය වර්ෂයන් තුල එක් එක් ඒකකයන්ගේ රාජකාරී තත්ත්වයන් අධ්‍යයනය කරමින් ලකුණු ලබාදීමේ ක්‍රමයක් මත එක්එක් ක්ෂේත්‍රයන් සඳහා කුසලානයන් පිරිනැමුනු අතර. ශ්‍රීලපාහ බළඇණි අතරින් පොදු රාජකාරී සඳහා හොඳම බළඇණිය ලෙස 1 ශ්‍රීලපාහ ඒකකය නම් කරන ලද අතර, ඒකක අණදෙන නිලධාරී මේජර් K.J **ජයවීර ශ්‍රීලපාහ එම කුසලානය ලබාගන්නා ලදී. ඉන්පසුව පාලන රාජකාරිය සඳහා හොඳම බළඇණිය ලෙස 6 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරී මේජර් තන්තිරිවත්ත** RWP **ශ්‍රීලපාහ විසින්ද හා.කා.ස. කටයුතු සඳහා හොඳම බලඇණිය ලෙස 10 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරී මේජර්** HMJK **ගුණරත්න ශ්‍රීලපාහ විසින්ද ක්‍රීඩා ක්ෂේත්‍රයේ හොඳම බළ ඇණිය සඳහා රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය නම් කරන ලද අතර, එය රෙජිමුඛ අණදෙන නිළධාරී මේජර්** MAMI **මුණසිංහ** RSP **ශ්‍රීලපාහ විසින්ද යුධ හමුදාධිපතිතුමා අතින් ලබාගන්නා ලදී.**

> **2004 වසරේ ශ්‍රීලපාහ හොඳම බළඇණිය ලෙස 6 ශ්‍රීලපාහ ඒකකය නම් කරන ලදී. ප්‍රේක්ෂකාගාරයේ සියලුම අයවලුන්ගේ ජයඝෝෂා මධ්‍යයේ 6 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරීතුමන් වන මේජර් J තන්තිරිවත්ත RWP ශ්‍රීලපාහ විසින් සිනහමුසු මුහුණින් යුතුව යුධ හමුදාධිපතිතුමන් අතින් රෙජිමේන්තු අධිපති කුසලානය දිනාගන්නා ලදී.**

ඉන්පසුව සිදුකරන ලද්දේ රෙජිමේන්තු අධිපති කුසලානය සඳහා හොඳම ඒකකය නම් කිරීමයි. කා තුලත් කුතුහලය දනවන පරිදි නිවේදක මහතා විසින් නිවේදන කටයුතු කර විරාමයක් තබා **2004 වසරේ ශ්‍රීලපාහ හොඳම බළඇණිය ලෙස 6 ශ්‍රීලපාහ ඒකකය නම් කරන ලදී. ප්‍රේක්ෂකාගාරයේ සියලුම අයවලුන්ගේ ජයඝෝෂා මධ්‍යයේ 6 ශ්‍රීලපාහ ඒකක අණදෙන නිලධාරීතුමන් වන**

2004
Sheltering Colours of Life
Sri Lanka Light Infantry

**මේජර්** J **තන්තිරිවත්ත** RWP **ශ්‍රීලපාහ විසින් සිනහමුසු මුහුණින් යුතුව යුධ හමුදාධිපතිතුමන් අතින් රෙජිමේන්තු අධිපති කුසලානය දිනාගන්නා ලදී.**

අනතුරුව යුධ හමුදාධිපතිතුමන් සභාව අමතමින් වර්ණ ලාභීන්ට සුභාශිංසන පුද කල අතර, වර්ණ ප්‍රධානෝත්සවය සංවිධානය කර එතුමානන්ට ආරාධනා කිරීම සබැඳිව රෙජිමේන්තු අධිපතිතුමාටත්, සේනාවිධායක ශ්‍රීලපාහ ඇතුළු සැමටත් ප්‍රසංශා කරන ලදී.

රෙජිමේන්තු සේනාවිධායකතුමාගේ සංකල්පයක් අනුව රෙජිඅධිපතිතුමන් වෙත රෙජිමේන්තු මහා සභාව මගින් අනුමතකර සියලුම නිලධාරී / සෙසු නිලයින්ගේ කැපවීමත් අනුග්‍රාහකභවතුන් ලබාදුන් අනුග්‍රාහකත්වය නිසා මෙම උළෙල සාර්ථක කරගැනීමට හැකිවූ බැව් ස්තුති කථාව කළ ලුතිනන් කර්නල් SWMTB හුලුගල්ලේ ශ්‍රීලපාහ ප්‍රකාශ කල අතර, පැමිණි සිටි සියලුම අයවලුන්ට හා නන් අයුරින් උපකාර කල සැමට එතුමා රෙජිමේන්තු මධ්‍යස්ථානය ශ්‍රීලපාහ වෙනුවෙන් ස්තූතිය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව රාත්‍රී 2045 පැයට පමණ ජාතික ගීය වාදනයෙන් 2004 ශ්‍රීලපාහ වර්ණ රාත්‍රිය අවසන් වන ලදී.

**MARKS AND POSITIONS OF COLOURS & AWARDS NIGHT**

| UNIT | ADMIN DUTIES | LOG DUTIES | GEN DUTIES | SPORTS | TOTAL | PLACE |
|---|---|---|---|---|---|---|
| 1 SLLI | 373.6 | 221.6 | 265 | 151 | 1011.2 | 2nd |
| 3 SLLI | 338.6 | 212 | 183 | 110 | 842.6 | 9th |
| 4 SLLI | 348 | 216.6 | 170 | 126.5 | 861.1 | 7th |
| 6 SLLI | 390 | 323 | 249 | 182 | 1053 | 1st |
| 7 SLLI | 336.6 | 228 | 224 | 104 | 892.3 | 5th |
| 10 SLLI | 361 | 246 | 160 | 141 | 908 | 3rd |
| 2 (V) SLLI | 321.6 | 200.6 | 217 | 136 | 875.2 | 6th |
| 5 (V) SLLI | 332 | 211 | 192 | 114.5 | 849.5 | 8th |
| 9 (V) SLLI | 347.6 | 22.3 | 209 | 116 | 849.9 | 4th |
| 14 (V) | 299.3 | 167 | 124 | 127 | 717 | 10th |
| RHQ BN | - | - | - | 293 | 293 | - |

# ශ්‍රීලපාහ වර්ණ සහ ජය සංකේත ප්‍රධා



ප්‍රධාන ආරාධිත අමුත්තා සහ එම මැතිණිය උත්සව සභාවට සම්ප්‍රාප්ත වීම



සම්ප්‍රධායානුකූලව පොල්තෙල් ප්‍රදීපය දල්වමින්



විනාඩි දෙකක නිශ්ශබ්දතාවය



රෙජිමේන්තු අධිපති විසින් පිළිගැනීමේ කථාව පැවැත්වීම



ආරාධිත අමුත්තන් ප්‍රමුඛ උත්සව සභාව



ආරාධිත අමුත්තන් ප්‍රමුඛ උත්සව සභාව



නැටුම් සංදර්ශනයක්



යුධ හමුදා තූර්ය වාදක කණ්ඩායමේ දයකත්වය



ගායක සනත් නන්දසිරි යුවලගෙන් මියුරු ගීතයක්



රෙජි අධිපති විසින් සැරයන් ජයරත්න හට වර්ණ පදානය කිරීම

යුද
ලුහි
SHS කෝට්ටේගොඩ
ප්‍රධා
2004
දින
පැව

# ...නෝත්සවය - 2004 විශේෂ අවස්ථා



රෙජි අධිපති අතින් සාසෙ චන්ද්‍රජීව පීජ්එන්
ප්‍රණාම සහතිකය ලබා ගැනීම



එවකට මාණ්ඩලික ප්‍රධාන අතින් මේජර් GMCKB ඒකනායක RSP
ශ්‍රීලපාහ විසින් ප්‍රණාම සහතිකය ලබා ගැනීම



එවකට මාණ්ඩලික ප්‍රධාන අතින් කපිතන් ADKI විජේවර්ධන
ශ්‍රීලපාහ විසින් ප්‍රණාම සහතිකය ලබා ගැනීම



යුද්ධ හමුදපති තුමා අතින් ලාකෝ ලලිත් කුමාර WAP
ප්‍රණාම සහතිකය ලබා ගැනීම



යුද්ධ හමුදපති තුමා අතින් ශ්‍රීලපාහ පාපන්දු පුහුණුකරු
අසංක විජේරත්න මහතා ප්‍රණාම තිළිණය ලබා ගැනීම



ගායක T.M. ජයරත්න ගෙන් සුමියුරු ගීතයක්



යුද්ධ හමුදපති තුමා අතින් අත්පන්දු පුහුණුකරු
ජපන් ජාතික වකායා බජී මහතා ප්‍රණාම තිළිණය ලබා ගනිමින්



යුද්ධ හමුදපති තුමා අතින් Maj. MAMI මුණසිංහ RSP
කුසලානය ලබා ගැනීම



යුද්ධ හමුදපති තුමා අතින් Maj. J තන්තිරිවත්ත RWP
කුසලානය ලබා ගැනීම



ලුතිනන් කර්නල් SWMTB හුවගල්ලේ ශ්‍රීලපාහ විසින්
ස්තුති කථාව පැවැත්වීම

...මුදාපති
...පත්
... ජෙනරාල්
...V RWP RSP USP ndc
...වයෙන්
...-11 වන
...ICH හිදී
...වූ වගයි

2004

# යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ආබාධිත වූවන්ගේ ක්‍රීඩා උළෙල - 2004

**2004** නොවැම්බර් මස 18 සහ 19 දෙදින තුළ යුධ හමුදා මූලස්ථාන ක්‍රීඩාංගනයේදී යුද හමුදා අන්තර් රෙජිමේන්තු ආබාධ සහිත වූවන්ගේ ක්‍රීඩා උළෙල යුධ හමුදාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් අන්දමින් ආරම්භ කරන ලදී.

එම තරඟාවලිය සඳහා අප රෙජිමේන්තුව නියෝජනය කරමින් ක්‍රීඩකයින් 120 කින් සමන්විත ක්‍රීඩා කණ්ඩායමක් සහභාගි විය. එහිදී විවිධ ක්‍රීඩා ඉසව්වලින් රන් පදක්කම් 14 ක් ද රිදී පදක්කම් 17 ක් ද ලෝකඩ පදක්කම් 10 ක් ද කණ්ඩායම් ශූරතාවයන් 3 ක් සහ අනුශූරතාවයන් 2 ක් ද මලල ක්‍රීඩා ශූරතාවය සමගින් සමස්ථ තරගාවලියේ ශූරතාවය මෙවරද අප ක්‍රීඩා කණ්ඩායමට හිමිකර ගැනීමට හැකි වූ අතර ඒ අනුව 2001, 2002, 2003, වර්ෂයන් තුළ අප සතුව පැවති සමස්ථ ශූරතාවය රැකගනිමින් මෙවරද 2004 වර්ෂයේ සමස්ථ ශූරතාවය සිව්වන වරටත් හිමිකර ගනිමින් තම අභිමානය තවදුරටත් රැකගන්නා ලදී.



පූර්ණ අන්ද අයවලුන් සඳහා පැවති මීටර් 100 තරග ඉසව් 2 වන ස්ථානය හිමිකරගැන්නා මොහොත සෙ/ 306597 සාසෙ නිශාන්ත පෙරේරා කේවිපි - 4 ශ්‍රීලපාහ



එක් පාදයක් දණහිසට පහලින් අහිමි අයවලුන් වෙනුවෙන් පැවති උස පැනීමේ ඉසව්වට සහභාගි වෙමින් සෙ/314894 ලාකෝ බංඩාර එච්එම්ජ් - 3 ශ්‍රීලපාහ.


**එම තරගාවලියේ විශේෂ අවස්ථා කිපයක් පහත පරිදි වේ.**




තරගාවලිය ඇරඹීමට පෙර ඔලිම්පික් ගිනිසිලුව දැල්වීමෙන් පසු ක්‍රීඩා ඉසව් ඇරඹීම සඳහා ප්‍රතිඥාව ප්‍රකාශ කර සිටින මොහොත සෙ/ 300820 සැරයන් නිශාන්ත විජී - 10 ශ්‍රීලපාහ



සෙ/306342 කෝප්‍රල් ජයකොඩි ඩබ්එස්- 3 ශ්‍රීලපාහ යන අය එක් අතක් අහිමි අයවලුන් වෙනුවෙන් පැවති උස පැනීමේ ඉසව්වට සහභාගිවී 2 වන ස්ථානය හිමිකරගත් අවස්ථාව



සෙ/300820 සැරයන් නිශාන්ත විජී - 10 ශ්‍රීලපාහ, සෙ13255 ලාකෝ වික්‍රමසිංහ ඩබ්පීඑස්කේ - 1 ශ්‍රීලපාහ සහ සෙ/ 309112 සාසෙ මානෙල් කේජ් - 7 ශ්‍රීලපාහ යන ක්‍රීඩකයින් කාණ්ඩ අංක 2 යටතේ රෝද පුටුවලට සීමාවූ අයවලුන් සඳහා වූ මීටර් 100 ඉසව්වේ මූලික වටයේ තරගයට සහභාගි වන අවස්ථාව.



සෙ/5 ඩී 02135 සාසෙ නිමල්ජයන්ත ඩබ් - 5 ශ්‍රීලපාහ යන අය රෝද පුටු වලට සීමාවූ අයවලුන් වෙනුවෙන් පැවති හෙල්ල විසිකිරීමේ තරග ඉසව්වට සහභාගි වූ අවස්ථාව.






2004 වර්ෂය වෙනුවෙන් පවත්වනු ලැබූ යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා උළෙලේ සමස්ථ ශූරතා කුසලානය ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පැමිණි නියෝජ්‍ය රාජ්‍ය ආරක්‍ෂක අමාත්‍ය ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා විසින් රෙජිමුඛ ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරීතුමා වෙත පිරිනමනු ලැබූ අවස්ථාව.



යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ආබාධිත ක්‍රීඩා උළෙලේ දක්ෂතම මලල ක්‍රීඩා කණ්ඩායමට හිමි අභියෝග ශූරතා කුසලානය ත්‍රිවිධ හමුදාපතිතුමා අතින් රෙජිමුඛ ශ්‍රීලපාහ ක්‍රීඩා කණ්ඩායම් නායක සෙ/ 13627 බති II ජයවික්‍රම කේ්වී - 4 ශ්‍රීලපාහ යන අය වෙත පිරනමන මොහොත.



සමස්ථ තරඟාවලිය නිමාවෙන් පසු රෙජිමුඛ ශ්‍රීලපාහ අණදෙන නිලධාරීතුමා විසින් ක්‍රීඩා කණ්ඩායමේ සියලුම දෙනා වෙත සතුට හා ප්‍රශංසාව පිරිනමනු ලැබූ අවස්ථාව.


# අබාධිත විරුවන්ට ශ්‍රීලපාහ කාන්තා සංගමයෙන් පරිත්‍යාගයක්

සටනේදී ආබාධිත තත්ත්වයට පත්ව රෙජිමුඛ ශ්‍රීලපාහ වෙත ඇතුලත් කර සිටින ආබාධිත රණවිරුවන්ගේ සුභසාධනය උදෙසා කටයුතු කිරීමට කැපවූ ශ්‍රීලංකා පාබල හමුදා කාන්තා සංමය විසින් ආබාධිත තත්ත්වයට පත් සෙබළුන් හට පැනනැගී ඇති ඉඩම්, නිවාස සහ ජලය ලබා ගැනීම වැනි ගැටළු කඩිනමින් නිරාකණය කරදීමට කටයුතු කරනු ඇත. පසුගිය නොවැම්බර් මස ශ්‍රීලපාහ කාන්තා සංගමය විසින් මෙම ආබාධිත සෙබළුන්ගේ ප්‍රයෝජනය උදෙසා මෙට්ට 50 ක් පරිත්‍යාග කරමින් තවත් සුභසාධක කටයුත්තක් සෙඳහා දායක වන ලදී. මෙම පරිත්‍යාගය සිදු කිරීම සඳහා ශ්‍රීලපාහ කාන්තා සංගමයේ ගරු සභාපතිනි ශාරී මල්ලවආරච්චි මැතිණිය විසින් මූලිකත්වය ගෙන කටයුතු කල අතර, මෙම මෙට්ට 50 පසුගිය වසරේ නොවැම්බර් මස 16 වන දින ශාරී මල්ලවආරච්චි මැතිණිය විසින් රෙජිමුඛ ශ්‍රීලපාහ අනදෙණ නිලධාරී මේජර් MAMI මුණසිංහ RSP ශ්‍රීලපාහ හට භාර දෙන ලද අතර, මෙම අවස්ථාවට ශ්‍රීලපාහ කාන්තා සංගමයේ සම්බන්ධීකරණ නිලධාරී කපිතාන් M.K. මනෝජ් කුමාර ශ්‍රීලපාහ ද සහභාගි වන ලදී.



ශාරී මල්ලවආරච්චි මැතිණිය විසින් රෙජිමුඛ ශ්‍රීලපාහ අණදෙන නිලධාරීහට මෙට්ට භාරදුන් අයුරු.

# 14 වන බළඇණි සංවත්සරය - 6 ශ්‍රීලපාහ.



මහා සංඝයා වහන්සේලා දානය සඳහා වැඩම කරවීම.

**පෞඩ ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ හය වන සාමාජිකයා වශයෙන් 1990.06.08 දින ජන්ම ලාබය ලද 6 වන ශ්‍රී ලංකා පාබල හමුදාව 2004.06.08 දින සිය ජීවිත මාවතේ 14 වන වියට පා තැබුවේය.**

14 වන සංවත්සරයේ තේමාව වුයේ ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් 2004.06.08 දින කොලොම්බුතුරෙයි කඳවුරේ චාම් උත්සව මාලාවක් පවත්වා, රටේ ස්වාධිපත්‍ය ආරක්‍ෂා කිරීමට ඒකකය සමගින් රාජකාරී කර අප අතරින් වියෝ වු නිලධාරි හා සෙසු නිලයිනට පිං පැමිණවීම සඳහා මොවුන්ගේ දෙමව්පියන්, බිරින්දෑවරුන්, දරුවන්, සහෝදර සහෝදරියන් සහ ඥාතීන්ගේ සහභාගීත්වයෙන් 2004.06.19 සහ 20 යන දෙදින තුළ මැදමූලය ස්ථානගත මිහින්තලේ මහකනදරාව කඳවුරේ පිංකම් මාලාවක් පවත්වන ලදී.

## මූලස්ථානය කොලොම්බුතුරෙයි

ප්‍රථමයෙන් කොලොම්බුතුරෙයි කඳවුරේ ඉදිකර ඇති පන්සල් භූමියේ සෑම කණ්ඩායමක්ම නියෝජනය වන පරිදි භට පිරිස් කැඳවා බෝධි පූජාවක් පැවැත්වීය. ඉන් අනතුරුව යාපනය නාගවිහාරස්ථානයේද බෝධි පූජාවක් පවත් වන ලදී. එම බෝධි පූජාව අවසානයේ යාපනය නල්ලූර් ඉන්දු කෝවිලේ දේව මෙහෙයක් පැවැත්විය.

ඉන් අනතුරුව සියළුම භට පිරිස්හි සංගීත රසාස්වාදය උදෙසා 4 ශ්‍රීලපාහ සංගීත කණ්ඩායම ඒකකය වෙත ගෙන්වන ලදී. එම සංගීත රාවයේ අමන්දානන්දයටපත් සෙබලුන් නටමින් ගයමින් ප්‍රීති ප්‍රමෝදයට පත්ව 14 වන සංවත්සරය සැමරීය. එය අවසානයේ බළඇණි සංවත්සරයට සමගාමීව වැසි මාසය තුළ පවත්වන ලද අත්පන්දු සහ පාපන්දු තරඟාවලියේ ශුරතාවය හිමිකරගත් පාලන කණ්ඩායම් ක්‍රීඩකයින් හට සහ අනුශූරතාවය ලබාගත් සී කණ්ඩායමේ ක්‍රීඩකයින් හට ත්‍යාග පිරිනමා වැඩ කටයුතු අවසන් කරන ලදී.

## මිහින්තලේ කඳවුර



ධාතු කරඬුව පරිත් මණ්ඩපයේ තැන්පත් කිරීම

ඒකකය සමගින් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය/අතුරුදහන් රණවිරුවන් භක්ත්‍යාදරයෙන් සිහිපත්කර ඔවුන් හට පිං පැමිණවීමේ මූලික අරමුණ කොටගෙන හා ඒකකය වෙත සෙත්පතා ආගමික කටයුතු වලට මුල්තැන දීම වත්මන් අණදෙන නිළධාරිතුමා වන මේජර් ජේ තන්තිරිවත්ත ආර්ඩබ්පි ශ්‍රීලපාහගේ අදහස විය. ඒ අනුව මියගිය/අතුරුදහන් රණවිරුවන්ගේ දෙමව්පියන්, බිරින්දෑවරුන්, දූ දරුවන්, සහෝදර සහෝදරියන් සහ ඥාතීන්ගේ සහභාගිත්වයෙන් මැදමුලය මිහින්තලේ යුධ හමුදා කඳවුරේදී ධර්ම දේශනාවක් පවත්වා පසුදින සංඝයා වහන්සේ විෂයෙහි සංඝගත දක්ෂිණාවක් පැවැත්වීමට යෝජනාකර තිබිණ. ඒ අනුව 14 වන සංවත්සරයේ යෝජිත වැඩසටහන් මතු දැක්වෙන පරිදි මිහින්තලේ කඳවුරේ පැවැත්වීමට තිරණය කළහ.

**2004.06.19 දින - සවස අනුරාධපුරය ජය ශ්‍රී මහා බෝමළුවේ බෝධිපූජා පිංකමක්,**
**ධර්මදේශනය - මිහින්තලේ කඳවුරේ.**
**2004.06.20දින - සංඝික දානය - මිහින්තලේ කඳවුරේ.**

මේවන විට ඒකක සියළුම භටපිරිස් යාපනය කොලොම්බුතුරෙයි ප්‍රදේශයේ ස්ථානගතව සිටිබැවින් මිහින්තලේ කඳවුරේ වැඩකටයුතු සඳහා භට පිරිස් සහභාගි කරවීම අපහසු කරුණක් විය. එබැවින් මෙම සියළුම වැඩ කටයුතු පසුමූලය පනාගොඩ වෙතින් පැමිණෙන ලද ආබාධිත සෙබලුන් සහ මිහින්තලේ කඳවුරේ සිටින ආබාධිත සෙබලුන් හට හා පාලන රාජකාරි සඳහා යොදවා සිටින සීමිත භට පිරිස් වෙත පැවරී තිබිණ. විශාල පිරිසකට සංග්‍රහ කිරීම අසීරු කරුණක් වුවත්, අණ සහ පාලන කණ්ඩායමේ නිලධාරි අණදෙන වන මේජර් ටීඑස්එන්ඩී තුඩුහේන ආර්එස්පි ශ්‍රීලපාහ, මැද මූලය මිහින්තලේ කඳවුරේ නිළධාරි අණදෙන මේජර් KND කරුනාපාල RSP ශ්‍රීලපාහ කපිතන් එම්ඒපීඑස්බී මංචනායක ආර්ඩබ්පි ආර්එස්පි ශ්‍රීලපාහ ලුතිනන් කේපීඩීඒ කීර්තිරත්න ශ්‍රීලපාහ යන නිලධාරීන් මෙන්ම රෙජිමේන්තු සැරයන් මේජර් කේකේ ෂෙල්ටන් ඇතුළු ජ්‍යෙෂ්ඨ නොනිලධාරින්ගේ අධීක්ෂණය යටතේ වූ විධිමත් සංවිධාන මඩුල්ලේ ක්‍රියාකාරිත්වයෙන් හා නිලතල බේදයකින් තොරව සියළු අයවළුන්ගේ දැඩි සාමුහික කැපවීම මගින් මෙකී වැඩ කටයුතු සාර්ථකව සිදුකර ගැනීමට හැකිවීම පැසසුම් සහගත ය.

**14 වන සංවත්සරයේ තේමාව වුයේ ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් 2004.06.08 දින කොලොම්බුතුරෙයි කඳවුරේ චාම් උත්සව මාලාවක් පවත්වා, රටේ ස්වාධිපත්‍ය ආරක්‍ෂා කිරීමට ඒකකය සමගින් රාජකාරී කර අප අතරින් වියෝ වු නිළධාරි හා සෙසුනිළයින්ගේ දෙමව්පියන්, බිරින්දෑවරුන්, දරුවන්, සහෝදර සහෝදරියන් සහ ඥාතීන්ගේ සහභාගිත්වයෙන් 2004.06.19 සහ 20 යන දෙදින තුළ මැදමූලය ස්ථානගත මිහින්තලේ මහකනදරාව කඳවුරේ පිංකම් මාලාවක් පැවැත්වීමටය.**

මේ අනුව ඒකකය ආරම්භයේ සිට 14 වන සංවත්සරය උදාවන තෙක් ඒකකය වෙත ඇතුලත්ව සිටියදී මියගිය/අතුරුදහන්වූ රණවිරුවන් 422 දෙදෙනෙකුගේ එක් පවුලකින් සාමාජිකයින් තිදෙනා බැගින් සහභාගි වන ලෙසෙ එම ඥාතීන් වෙත කල්වේලා ඇතිව දැනුම් දීම් කර තිබිණ. ඒ අනුව ''රණවිරු'' ඥාතීන් විශාල සංඛ්‍යාවක් පැමිණ සිටි අතර, එසේ පැමිණෙන ලද අයවලුන් සඳහා ප්‍රවාහන නවාතැන් හා ආහාර පාන ආදී පහසුකම් සැපයීමට සියළු කටයුතු සම්පාදනය කර තිබුණි. පිංකමෙහි යෝජිත මූලික අංගය වශයෙන් 2004.06.19 වන දින සවස් භාගයේ අනුරාධපුර ජය ශ්‍රී මහා බෝසෙවනේ බෝධි පූජාවක් සංවිධානය කර තිබූ අතර, මේ සඳහා පැමිණ සිටි ''රණවිරු'' ඥාතීන් අනුරාධපුරය ශ්‍රී සාරානන්ද පිරිවෙන් භූමියට රැස්ව සිටියහ. එතැන් සිට අලංකාර මල් පෙරහැරකින් ජය ශ්‍රී මහා බෝධි මළුව දක්වා ගමන් කරවීම දුටු දුටුවන්ගේ සිත් ගන්නක් වූවා සැක නැත. මෙම බෝධි පූජාව අවසානයේදී සියළුම දෙනා රාත්‍රී ධර්ම දේශනාව සඳහා මිහින්තලේ මහ කනදරාව යුධ හමුදා කඳවුර වෙත පැමිණෙන ලදී. එම ධර්ම දේශනාව අවසානයේ නවාතැන් පහසුකම් සඳහා වෙන්කර තිබූ මිහින්තලේ ලේක්හවුස් විශ්‍රාම ශාලාව වෙත කැඳවාගෙන ගොස් රාත්‍රී ආහාර පාන සපයන ලදී. 2004. 06.20 දින, මියගිය/අතුරුදහන් ''රණවිරු'' ඥාතීන්ගේ ගම්වාසීන්ගේ සහ මැදමූලය කඳවුරේ නිළධාරි/සෙබළුන්ගේ සහභාගිත්වයෙන් සංවිධානය කර තිබූ අලංකාර පෙරහැර මගින් මහකනදරාව ශ්‍රී සුගතාරාම විහාරස්ථානයේ සිට සංඝයා වහන්සේ පහළොස් නමක් මැදමූලය යුධ හමුදා කඳවර වෙත වැඩමවා සාංඝික දානය පිළිගන්වනු ලැබීය.



අණදෙන නිලධාරිතුමා විසින් පැමිණ සිටි රණවිරු ඥාතීන් වෙත අටපිරිකර සම්මාධම් කිරීම

මෙම පිංකම් මාලාව අවසානයේ ඒකකය සමගින් රාජකාරී කර රටදැය වෙනුවෙන් දිවිපිදූ/අතුරුදහන් වූවන්ගේ පවුල් වල සුභසාධනය උදෙසා පිහිටුවා ඇති ''රණවිරු'' සංගමයේ පසුවන සභාවාරය අණදෙන නිළධාරි මේජර් ජේ තන්තිරිවත්ත ආර්ඩබ්පි ශ්‍රීලපාහගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර මෙහිදී ''රණවිරු'' පවුල්වලට ගැටළු සහ එළඹෙන 15 වන සංවත්සරය පිළිබඳ සාකච්ඡා කරන ලදී. මෙම කමිටුව රැස්වීම මිහින්තලේ මැදමූලය ස්ථානගත මහකනදරාව කඳවුර තුළ පැවැත්වුණි.

**බුද්ධි අංශය - 6 ශ්‍රීලපාහ**

# ශ්‍රීලපාහ කාන්තා සංගමයේ දායකත්වය

## විශේෂ අවස්ථා



2004.09.21 දින රෙජිමේන්තු නව බේකර් ගොඩනැගිල්ලේ පැවති රෙජිමුඛ සහන ණය බෙදාදීමේ උත්සවයේදී කාන්තා සංගමය මගින් ආරම්භ ඇති ආබාධිත අයවලුන් සඳහා නිවාස ඉදි කිරීමේ ව්‍යාපෘතියේ පළමු සෙනියා වන සෙ/306748 කෝප්‍රල් විජේරත්න YMNB හට රුः 100000/-ක මුදලක් කාන්තා සංගමයේ ගරු සභාපතිනිය ශාරි මල්ලවආරච්චි මහත්මිය අතින් ප්‍රධානය කළ අවස්ථාව



2004.09.21 දින රෙජිමේන්තු නව බේකර් ගොඩනැගිල්ලේ පැවති රෙජිමුඛ සහන ණය බෙදාදීමේ උත්සවයේදී සෙ/14649 සැරයන් ජයතිලක HP යන ජේ.කො.නො.නි. හට අදාල රුः 15000/- ප්‍රේෂණ පත කාන්තා සංගමයේ ගරු සභාපතිය ශාරි මල්ලවආරච්චි මහත්මිය අතින් ප්‍රධානය කල අවස්ථාව.



2004.09.21 දින රෙජිමේන්තු නව බේකර් ගොඩනැගිල්ලේ පැවති රෙජිමුඛ සහන ණය බෙදාදීමේ උත්සවයේදී රු. 15000/- ප්‍රේෂණපත සෙ/ 303511 කෝප්‍රල් සුසන්ත AGA වෙත කාන්තා සංගමයේ සාමාජිකා කාන්තිද සිල්වා මහත්මිය අතින් ප්‍රධානය කළ අයුරු. පසෙකින් රෙජිමුඛ ශ්‍රීලපාහ අණදෙන නිළධාරී කර්නල් එල්.එම්. මුදලිගේ ආර්ඩබ්පී, ආර්එස්පී, ශ්‍රීලපාහ ද වේ.



2004.09.21 දින රෙජිමේන්තු නව බේකර් ගොඩනැගිල්ලේ පැවති රෙජිමුඛ සහන ණය බෙදාදීමේ උත්සවයේදී සෙ/305467 ලාःකෝ නවරත්න APSP හට ඔහුට හිමි ප්‍රේෂණපත කාන්තා සංගමයේ සාමාජිකා රාදිකා ජයසූරිය මහත්මිය අතින් ප්‍රධානය කල අවස්ථාව. පසෙකින් රෙජිමුඛ ශ්‍රීලපාහ අණදෙන නිළධාරී ලුතිනන් කර්නල් LM මුදලිගේ RWP RSP ශ්‍රීලපාහ ද වේ.



2004.09.21 දින රෙජිමේන්තු නව බේකර් ගොඩනැගිල්ලේ පැවති රෙජිමුඛ සහන ණය බෙදාදීමේ උත්සවයේදී සෙ/313211 සාःසෙ කරුණාරත්න WP යන සෙනියා වෙත ඔහුට අයත් ප්‍රේෂණපත කාන්තා සංගමයේ සාමාජිකා දමයන්ති රත්නායක මහත්මිය අතින් ප්‍රධානය කල අයුරු. එම ඡායාරූපයේ පසෙකින් රෙජිමුඛ අණදෙන නිළධාරී ලුතිනන් කර්නල් L.M මුදලිගේ RWP RSP ශ්‍රීලපාහ සහ සහන ණය යෝජනා ක්‍රමයේ ගිණුම්භාර නිළධාරී හා කාන්තා සංගමයේ සම්බන්ධීකරණ නිළධාරී කපිතන් MKM කුමාර, ශ්‍රීලපාහ ද වේ.



2004.09.21 දින රෙජිමේන්තු නව බේකර් ගොඩනැගිල්ලේ පැවති රෙජිමුඛ සහන ණය බෙදාදීමේ උත්සවයේදී සෙ/302225 සැරයන් කුලතුංග යන ජේ.කො.නො.නි. ගේ ආබාධිත දරුවා වෙත රෝද පුටුවක් පරිත්‍යාග කිරීම කාන්තා සංගමයේ ගරු සභාපතිනිය ශාරි මල්ලවආරච්චි මහත්මිය අතින් සිදුකල අවස්ථාව.



2004.09.30 දින යුධ හමුදා මූලස්ථානයේ සේවා වනිතා ඒකකයේ පැවති උත්සවයේදී දෙඇස් අන්ධ සෙ/304979 ලාःකො උඩුමුල්ල PU යන කො.නො.නි. හට ඉඩමක් මිලදී ගැනීම සඳහා දයා සමූහ ව්‍යාපාරය වෙතින් රු. 90000/- ප්‍රේෂණපත පරිත්‍යාග කරන ලදී. මෙය දයා සමූහ ව්‍යාපාරයේ අධිපති දයා ගමගේ මහතා විසින් කාන්තා සංගමයේ සභාපතිනිය ගරු ශාරි මල්ලවආරච්චි මහත්මිය වෙත අදාල ප්‍රේෂණපත භාරදුන් අවස්ථාව. පසෙකින් යුද හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය සෝනියා කෝට්ටේගොඩ මැතිණිය, ප්‍රේෂණපත් ලාභී ලාःකො උඩුමුල්ල ද වේ.

ශ්‍රීලපාහ කාන්තා සංගමය

# 6 වන බළඇණිය

## ශ්‍රීලංකා පාබල හමුදාව සියළු ශ්‍රීලපාහ ඒකක අතරින් 2004 වර්ෂයේ සෑම අතින්ම අති ශූර බළඇණිය වූ වගයි.



ශ්‍රීලපාහ රෙජිමේන්තුවේ

6 වන සාමාජිකයා වශයෙන් 1990.06.08 දින 0810 පැයට යෙදෙන සුභ මොහොතින් පනාගොඩ යුධ හමුදා ජනපදයේ රෙජිමූලය ශ්‍රීලපාහ හිදී උත්සවාකාරයෙන් 6 ශ්‍රීලපාහ නගා සිටුවන ලද අතර, ඒකකයේ අණදීම එවකට මේජර් ඩී රත්න සභාපති ආර්එස්පි ශ්‍රීලපාහ විසින් භාර ගන්නා ලදී. ඒකකය නගා සිටුවීම සඳහා අනිකුත් ශ්‍රීලපාහ නිත්‍ය ඒකකයන් වෙතින් ලබාදුන් සෙබලුන් අතුරින් වැඩි පිරිසක් ක්‍රියාන්විත රාජකාරියන්හි නියලී සිට අත්දැකීම් බහුල පරිනත අයවළුන් වුවද ඔවුනොවුන් අතර අන්‍යොන්‍ය සම්බන්ධතාවය නංවාලීමේ අදිටනින් අණදෙන නිළධාරීගේ තීරණයට අනුව යුධ හමුදා මූලස්ථානයෙහි අනුමැතිය ඇතිව සාමූහික පුහුණුවීම් පැවැත්වීම සඳහා 1990.06.11 දින සටන් පුහුණු පාසල අම්පාර බලා භට පිරිස් පිටත් වන ලදී.

එහෙත් 1 ශ්‍රීලපාහ වෙතින් මෙම ඒකකය නගා සිටුවීම පිණිස ඇතුලත් කර, ඒ වන විට කල්මුණේ සහ කලවංචිකඩි යුධ හමුදා කඳවුරු වල ස්ථානගතව සිටි භට පිරිස් වෙත ත්‍රස්තවාදීන් විසින් ප්‍රහාරයන් එල්ල කර සෙබලුන් 13 දෙනෙකු ජීවිතක්ෂයට පත් කරමින් ආරම්භවූ දෙවන ඊලාම් යුද්ධයට අනපේක්ෂිත අයුරින් මුහුණදීමට සිදුවන ලදී. ඒ අනුව සාමූහික පුහුණුවීම් පසෙකලා **දෙවන ඊලාම් යුද්ධය මැඩපැවැත්වීම සඳහා රජය විසින් දියත් කරන ලද බළවේගය අදියර 1, වන්නි වික්‍රම, හයේ පහර, බිලැක් ෂොක්ස්, යාල්දේවි, විදුලි පහර, ඉදිරි පිම්ම, සෙක් හැන්ඩ්, බැරල් වෝමර්, තන්ඩර් සට්‍රයික්, රිවිරැස, ජයසිකුරු සහ රිවිකිරණ යන මහා පරිමාණයේ ක්‍රියාන්විත මෙහෙයුම් මෙන්ම කුඩා පරිමාණයේ සෑම ක්‍රියාන්විතයන් සඳහාම දායකත්වය ලබාදෙමින් ඒකක භටපිරිස් හට ඉදුරාම මෙහෙයුම් / ක්‍රියාන්විත රාජකාරි සඳහා යොමුවීමට සිදුවන ලදී.**

එලෙස ස්ථාපනය කරන ලද මෙම ඒකකය ක්‍රියාන්විත රාජකාරි වලට මෙන්ම පාලන සහ ක්‍රීඩා කටයුතු වලදීද අනෙකුත් ඒකක හා උරෙන් උරගැටී රාජකාරි කරමින් වසර 14 ක් ඉතිහාසයක් පසුකොට 15 වන සංවත්සරයට ලගාවෙමින් සිටියදී ඒකකයේ ආරම්භයේ සිට මේ දක්වා ඉටුකල කාර්‍යයන් පැසසුමට ලක්කර සියළුම නිත්‍ය/ස්වේච්ඡා ශ්‍රීලපාහ ඒකක අතුරින් 2003/2004 වර්ෂ වල සෑම අතින්ම අතිශූර බළඇණිය වශයෙන් සහ හොඳම පාලන කටයුතු වලට හිමි කුසලානයන් 2004.11.11 දින බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී යුධ හමුදාපතිතුමා සහ රෙජිමේන්තු අධිපතිතුමන් විසින් අප ඒකක වෙත ප්‍රධානය කරන ලදී.

විශේෂයෙන්ම එහි ගෞරවය ඒකකය ආරම්භයේ සිට නායකත්වය දුන් හිටපු අණදෙන නිලධාරීන් වන මේජර් ජෙනරල් ඩී.රත්නසභාපති ආර්ඩබ්පී ආර්එස්පි යුඑස්පී (විශ්‍රාමික), බ්‍රිගේඩියර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී, ආර්එස්පී යුඑස්පී පීඑස්සී කර්නල් ඩියු ද ලැනරෝල් ආර්ඩබ්පී, ආර්එස්පී (මියගිය), ලුතිනන් කර්නල් එස්කේපීඑන් බී ඇහැලමල්පෙ ආර්එස්පී, ලුතිනන් කර්නල් ඒඑල්එස්කේ පෙරේරා ආර්එස්පී සහ වත්මන් අණදෙන නිලධාරී මේජර් ජේ තන්තිරිවත්ත ආර්ඩබ්පී හටද හිමිවනු ඇත.

> **විශේෂයෙන්ම එහි ගෞරවය ඒකකය ආරම්භයේ සිට නායකත්වය දුන් හිටපු අණදෙන නිළධාරීන් වන මේජර් ජෙනරල් ඩී.රත්නසභාපති ආර්ඩබ්පී ආර්එස්පි යුඑස්පී (විශ්‍රාමික), බ්‍රිගේඩියර් ආර්එම්ඩී රත්නායක ආර්ඩබ්පී ආර්එස්පි යුඑස්පී පීඑස්සී කර්නල් ඩියු ද ලැනරෝල් ආර්ඩබ්පී, ආර්එස්පී (මියගිය), ලුතිනන් කර්නල් එස්කේපීඑන් බී ඇහැලමල්පේ ආර්එස්පී, ලුතිනන් කර්නල් ඒඑල්එස්කේ පෙරේරා ආර්එස්පී සහ වත්මන් අණදෙන නිළධාරී මේජර් ජේ තන්තිරිවත්ත ආර්ඩබ්පී හටද හිමිවනු ඇත.**

එමෙන්ම වසර 14 ක ඉතිහාසය තුලදී ඒකකය සමගින් රාජකාරි කර මියගිය/අතුරුදහන්වූ නිලධාරි / සෙසු නිලයින්ද, තුවාල ලබා දැනට අබාධිත / පහත් වෛද්‍ය වර්ග කිරීම් මත සිටින නිලධාරි/සෙසු නිලයින්ද, දැනට විශ්‍රාමිකව සිටින අයවළුන් මෙන්ම ඒකකයේ රාජකාරි වල නියලී සිටින නිලධාරි/සෙසු නිලයින්ද මෙම සුවිශේෂ වූ ජයග්‍රහනයෙහි කොටස් කරුවන් වන බැවින්, ඔවුන් සියළු දෙනා හටද එම ගෞරවය හිමිවනු ඇත.

**බුද්ධි අංශය - 6 ශ්‍රීලපාහ**

# හමුදා සාමාජිකයින් විවිධ උත්සව වලට සහභාගි වීම

**මෙම** ලිපිය ලිවීමට මා අදහස් කලේ මීට දින කිහිපයකට ප්‍රථම කොනොනි පුහුණු පාසැලේ සේවයේ නියුතු ලාන්ස් කෝප්‍රල්වරයකුගේ බිරිඳගේ පියාගේ අවමංගල්‍ය උත්සවයට කොනොනි පුහුණු පාසැල නියෝජනය කරමින් සහභාගි වු අවස්ථාවේ දුටු දර්ශණයන් හේතුවෙන් මෙම ලිපිය ලිවීමට අදහස් කළෙමි. පණිවුහුවමාරු කිරීමේ කටයුතු වලට සම්බන්ධිත ඒකකයකට අයත් ලාකෝවරයකුගේ ඉහත කී ඥාතියාගේ අවමංගල්‍ය කටයුතු යෙදී තිබුනේ එදින 1430 පැයටයි. මෙම කොනොනි එදින 1100 පැයේ සිට පමණ තම රෙජිමේන්තුවේ සාමාජිකයින්ගේ පැමිණීම අපේක්‍ෂාවෙන් සිටි අතර, ඔහු තම අතරැදී දුරකථනය මගින් අවස්ථා කීහිපයකදීම තම රෙජිමේන්තුවට කතාකර ඔවුන්ගේ පැමිණීම සනාථ කරගැනීමට කටයුතු කළේය. ඒකකය වෙතින් දැනුම් දුන්නේ 1200 පැය වන විට යුද හමුදා සාමාජිකයින් පැමිනෙනු ඇති බවය. ඒ අනුව ලාකෝ වරයා විසින් ඔවුන්ට අවශ්‍ය පරිදි ආහාරද වෙන්කර තබා තිබුණි. 1400 පැය වන විට අනුරාධපුරය සිට පැමිණි හටපිරිස් රැගත් නවීන පන්නයේ වෑන්රථය මහනුවර ප්‍රදේශයේ පැවති මෙම අවමංගල්‍යට සහභාගී වීමට පැමිනුණි. එහි ඒකකයේ රෙසැමේ, සරඹ උපදේශක සහ ජ්‍යෙකොනොනියකු සමගින් තවත් සෙබලුන් 08 දෙනකු පමණ සිටියහ.

ඔවුන් පැමිණි වහාම නිවස තුළට ගොස් මෘතදේහයට අවසන් ගෞරව දක්වා නිවසට ආසන්නයේම තිබූ මෘත දේහය තැන්පත් කරන ස්ථානයට යන ලදී. එහි අදාල කොනොනිගේ ඥාතීන් සහ ප්‍රදේශවාසීන් විශාල පිරිසක් රැඳී සිටියහ. රෙසැමේ, සරඹ උපදේශක, සැරයන් සහ තවත් සෙනින් කිහිප දෙනකු බීමත්ව සිටි අතර, සැරයන්වරයා අධික බිමතින් සිටිනු දක්නට ලැබුණි. සැරයන්වරයා ඉතා අශෝභන කථා කියමින් තම ජ්‍යෙෂ්ඨ නිලයින්ට පවා යුධ හමුදා පිළිවෙතට පටහැනි ආකාරයට උසුලු විසුලු කරමින් අවමංගල්‍ය උත්සවයකදී නොහැසිරිය යුතු ආකාරයට හැසිරුනි. එම අවස්ථාවේ අවට සිටි සියලු දෙනාගේම අවධානය එදෙස යොමුවී තිබූ අතර, ඇඳුම්වලින් සහ හැඩහුරුකම් වලින් යුධ හමුදා සාමාජිකයින් බවට ඒත්තු ගැනුනි. අවමංගල උත්සවයකදී එලෙස හැසිරීම පිළිබඳව එම ස්ථානයේ සිටි සැවොම යුද හමුදාව කෙරෙහි තම සිත් වල පිළිකුලක් ඇති කර ගැනීම සාමාන්‍ය දෙයකි. එය වැලැක්විය නොහැක්කක් බවට ඔබටද තේරුම් යනු ඇත. කෙතරම් වටිනා ඇඳුම් ආයිත්තම් ඇදිසිටියද මහත්මා ගතියක් නම් පෙනෙන්ට නොතිබුනි. සැරයන්වරයා අධික බිමතින් එලෙස නොහොබිනා ආකාරයෙන් හැසිරෙද්දී එහි සිටි ඒකකයේ සෙසුනිල ජ්‍යෙෂ්ඨයා වන රෙසැමේ හෝ ඒකකයේ වගකිව යුතු තනතුරක් දරන සරඹ උපදේශකවරයා හෝ සැරයන්ව පාලනය කිරීමට කිසිම ක්‍රියාමර්ගයක් ගැනීමෙන් වැලකී සිටීම ඉතා කණගාටුවට කරුනකි. මෙම අවස්ථාව වන විට අවමංගල සභාවේ ආගමික කටයුතු ආරම්භ කෙරුණි. එම අවස්ථාවේ ලාකෝවරයා පැමිණ රෙසැමේට සහ සරඹ උපදේශකට අවමංගල්‍ය සභාව අමතා ඒකකය වෙනුවෙන් වචන කිහිපයක් කතා කරන මෙන් ඇරයුමක් කළේය. එවිට ඔවුන් පැවසුවේ රාත්‍රිය එලඹීමට ප්‍රථම ආපසු කඳවුරට යායුතු බැවින් දැන්ම පිටත්විය යුතු බවකි.

මේ වන විට වේලාව සවස 1440 පැය පමණ වන්නට ඇත. ඔවුන් පැමිණ ගතව ඇත්තේ විනාඩි 40 ක පමණ කාලයකි. අනුරාධපුර වැනි සැතපුම් 100 ක් පමණ දුරක සිට විනාඩි 40 ගතකිරීමට පැමිණුනේ ඇයි යන්න මට ගැටළුවක් විය. යාමට හදිසි බව පවසමින් සියලුදෙනාම වෑන්රථය ළඟට පැමිණීමේදී ලාකෝ වරයා කෙසේ හෝ කතාවක් පවත්වා යන ලෙස ඉල්ලමින් පසුපසින් පැමිණියද එයට සාර්ථක ප්‍රතිචාරයක් නොලැබුණි. කෙසේ වෙතත් යාමට හදිසියෙන් පැමිණි යහලුවන් වෑන් රථය ළඟ නැවතී විනාඩි 30 ක් පමණ සිටි අතර සරඹ උපදේශක සහ සැරයන් වරින් වර "කෝ බං අරවා තාම ගෙනාවේ නැන්ද" අවස්ථා කීපයකදී ඇසීය. එසේ අසා එහෙනම් අපි යනවා යන්න කියමින් වෑන් රථයට ගොඩවී යාමට සැරසුණි. එවිට ලාකෝ වරයාද "මමත් එහෙනම් එන්නම් මඟට, මගින් ගන්න පුළුවන්" යනුවෙන් පවසමින් වාහනයට නැගුනේය. ඔහුට ආපසු එනවිට තනියම එන්න වන බැවින් මා හටද කතා කළේය. මම ද වෑන් රථයට ගොඩ විය. මීටර් 200 පමණ යන විට ඉදිරියට පැමිණි ත්‍රීවිලරයක් නැවැත්විය. එයින් බෑගයක් ගෙන ලාකෝ වරයා එය සරඹ උපදේශක අත තැබූ අතර එහි අරක්කු බෝතල් දෙකක් තිබෙනු මා හට දිස් විය. ඔවුන් මෙතෙක් රැදී සිටි කාරණය මා හට ඒත්තු ගැනුනේ මේ අවස්ථාවේදීය. මොවුන් සැතපුම් සියගණනක් දුර ගෙවා පැමිණියේ සැබැවින්ම තම ඒකකයේ සෙබලෙකුගේ ළඟම ඥාතියෙකුගේ අවමංගල්‍යට සහභාගි වීමටද එසේ නැතිනම් නොමිලේ අරක්කු බී විනෝද වීමටද යන්න ප්‍රශ්නයකි. යුද හමුදාව වෙත පැවරී ඇති දහසක් රාජකාරී මධ්‍යයේ රුපියල් දහසක පමණ ඩීසල් වැය කර කුලී ගෙවීමේ පදනම මත පවරා ගත් වාහනයක් සෙබළුන් කීපදෙනෙකු සමගින් තවත් සෙබලෙකුගේ ඥාතියකුගේ අවමංගල්‍ය උත්සවයට සහභාගි කරවීමට පිටත් කරන්නේ මෙවන් දෙයක් බලාපොරොත්තුවෙන්ද? ඒකකයේ අණදෙන නිලධාරීතුමා හෝ විධායක අධිකාරීතුමා මෙවැනි සිද්ධීන් වෙතැයි අපේක්‍ෂා කරන්නේද ?. නිවසේ සිටින සෙබලා ඒකක හට පිරිස් වලින් බලාපොරොත්තුවන්නේ මෙවන් සහභාගිවීමක්ද? මෙම සිද්ධියේදී එම ලාකෝ වරයාගේ මානසිකත්වය මා හට මනාව වැටුහිණි. එම අවස්ථාවේ අවමංගල්‍ය සභාව අමතා වචන කීපයක් කතාකිරීමට මා සිතුවද මා හැර වෙනත් කිසිදු යුද හමුදා සාමාජිකයෙකු නොසිටි බැවින් එය නුසුදුසු බව මාහට ඒත්තු ගැන්විණි. සමාන්‍යයෙන් යුද හමුදා සෙබළුන් වශයෙන් සාමූහිකව පිරිසක් වශයෙන් යම් ගමනක් බිමනක් යන විට මත්පැන් පානය කර, විනෝදවීම සිදුකරන්නකි. නමුත් එයටද යම් ක්‍රමයක් තිබේ. අවමංගල්‍යට සහභාගිවී ආපසු කඳවුරට පැමිණීමේදී එලෙස විනෝද වූවාට කම් නැත.. හේතුව ගමනේ පරමාර්ථය ඉටුවී තිබීමයි. නමුත් ගමන යාමේ මූලික අරමුණ ඉටු නොකර තමන්ගේ විනෝදයට මුල්තැනදී ක්‍රියාකිරීමෙන් සමස්ථයක් වශයෙන් ඒකකයට මෙන්ම යුද්ධ හමුදාවටම අපකීර්තියක් ගෙන දෙනු ඇත. එබැවින් මෙවන් ගමන් සඳහා හටපිරිස් සහභාගි කරවීමේදී ඒකකයේත්, යුද්ධ හමුදාවේත්, ප්‍රශ්ණයට මුහුණපා සිටින

සෙබලාගේත් ගෞරවය ආරක්ෂා වීම සඳහා පහත සඳහන් පරිදි ක්‍රියා කිරීම සුදුසු යැයි මා සිතමි.

අ. ගමනට සහභාගි කරවන හටපිරිස් සිවිල් ජන සමාජයේ උත්සවයකට සහභාගි කිරීමට තරම් සුදුසු අයවලුන්ද යන වග සොයා බැලීම.

ආ. හැකිතාක් මත්පැන් පානයෙන් තොර අයවලුන් සහභාගි කරවීමට ක්‍රියාකිරීම.

ඇ. මත්පැන් පානය කරන්නවුන් වුවද ඒ සඳහා සහභාගි වන ජ්‍යෙෂ්ඨතම සාමාජිකයාට මිනිස් පාලනය පිළිබඳව දැනීමක් හැකියාවක් ඇද්ද යන්න සොයා බලා නායකත්වය පැවරීම සහ වගකීම භාරදීම.

ඈ. ගමනට සහභාගි වන අයවලුන්ට එහි වැදගත්කම, පිටත්විය යුතු වේලාව, අදාල ස්ථානයේ රැදී සිටිය යුතු වේලාව, නැවත පිටත්විය යුතු වේලාව, විවේක ගැනීමට අවශ්‍ය වන්නේ නම් ඒ සම්බන්ධ විස්තර, ගමන සම්බන්ධයෙන් වගකිය යුත්තේ කවුරුන්ද යන්න ආදී සියලු කරුණු පහදා දී අවශ්‍ය උපදෙස් වගකිය යුතු නිලධාරියෙකු විසින් ලබාදීම.

සෙබලකුට යම් උත්සවයකට තම සේවා ස්ථානයෙන් හටපිරිස් සහභාගිවීම තරම් සතුටුවිය හැකි අවස්ථාවක් නොමැත. එය තමන්ගේ අභිමානයට විශාල රැකුලක් වන්නේය. නමුත් ඉහත සිද්ධියේ පරිදි සහභාගි වන්නේ නම් සෙබළාගේ අභිමානයට කුමක් වන්නේද? එබැවින් මේ පිළිබඳව අවධානය යොමුකර සිවිල් සමාජයේ පැවැත්වෙන උත්සව වලට සහභාගි වීමේදී ඒකකයේ සහ සමස්ථ යුද හමුදාවේම ගෞරවය රැකෙන පරිදි සහභාගි වීමට කටයුතු කරන මෙන් ඔබ සැමගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

සෙ/12432 බනි 11
**කරුණාරත්න ටීඑම්එන්අයි**
(6 වන බලඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව)
කොතෙනි පුහුණු පාසැල - කලාඔය.



# ලෝව විවිධ සොයා ගැනීම්

**ලොව** විවිධ සොයා ගැනීම් යන මැයෙන් ඈත අතීතයේ සිට අප භාවිතා කළ විවිධ උපකරණ සම්බන්ධව ලිපි පෙළක් මා ලිවීමට අදහස් කර ඇත. මෙම සොයාගැනීම් සියල්ල විවිධ පොත්පත් සහ සඟරා වලින් උපුටා ගනු ලබන අතර, මෙම ලිපි පාසැල් අධ්‍යාපන ලබන දරුවන්ගේ සිට වියපත් සැමගේම දැනුම වර්ධනය වීමට ඉවහල් වනු ඇති බව මා සිතමි. ඒ අනුව අද මා මුලින්ම ඉදිරිපත් කරන්නේ ගල් ආයුධය පිළිබඳවයි.

**ගල් ආයුධ Stone Tools ක්‍රිස්තු පූර්ව මිලියන 2.6 )**


අද ලෝකයේ මනුෂ්‍යයන් තම එදිනෙදා කටයුතු සඳහා නොයෙක් අවි ආයුධ පරිහරණය කරනු ලබයි. ලෝහයෙන් තනනු ලබන පිහි වර්ග, උදලු, නගුල, පොරව, වැනි බොහෝ ආයුධ අද ඉතාමත් අත්‍යවශ්‍ය දේ බවට පත්වී තිබේ. අද එසේ වුවද, එදා අප ආදී කල්පිත මිනිසා තම සුපුරුදු සමාජ දින චර්යා රටාවෙන් මිදී නව ප්‍රවණතාවයට එක්වන්නට දරණ ලද උත්සාහයේදී ආයුධ වල අවශ්‍යතාවය වෙනුවෙන් කුමන ක්‍රියාමාර්ගයක් ගත්තේද?

## ගල් ආයුධ


එය තමා ලෝකයේ ප්‍රථම සොයා ගැනීම, ආයුධ නිපදවීම සොයා ගැනීම මිනිසා තවතවත් දියුණු තත්ත්වයක් කෙරෙහි ගෙනයාමට එදා සමත් වුවාට කිසිදු සැකයක් නොමැත. 1969 දී අප්‍රිකාවේ කරන ලද කැනීම් වලින් සොයාගත් ගල් වලින් නිපදවන ලද ආදි කාලීන පිහිතල ක්‍රිස්තු පූර්ව මිලියන 2.6 ක් පමණ පැරනි යැයි ගණන් බලා තිබේ. අප්‍රිකාව, යුරෝපය මෙන්ම ආසියාවේද මෙවැනි ආදි කල්පිත ගල් ආයුධ බොහෝ සේ සොයා ගෙන තිබේ.

දඩයමට, සතුන් කපා ගැනීමට සහ වෙනත් සියලුම අවශ්‍යතාවයන් සඳහා ඔවුන් ගල් ආයුධ නිපදවාගත් බව අද තහවුරු වී තිබේ. එම ආයුධ කෙතරම් තාක්‍ෂණික අතින් ඉස්තරම් ඒවා වුවද යන්න අද තනන බොහෝ පිහි, මිටි පොරෝ වැනි ආයුධ එදා ආදී කල්පිත හැඩරුවෙන්ම තැනීම නිසාවෙන් ඔප්පු වේ ඒවා තම අවශ්‍යතාවය වෙනුවෙන්ම පමණක් නිපදවා ගන්නට යෙදුනු ආයුධ අද කෙතරම් දුරක් පැමිණ තිබේද?

කෙසේ වෙතත්, මිනිසාගේ පරිනාමයේ දියුණුව උදෙසාම එදා බිහිවුනු ආයුධ අද මිනිසාගේ විනාශය උදෙසාද පාවිච්චි කරන්නට යොදා ගැනේ. මෙය කෙතරම් කණගාටුදායකද?




සෙ/12432 බනි 11 **කරුණාරත්න ටීඑම්එන්අයි**




# 2004 යුධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය

පසුගිය වසරේ යුධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය විශිෂ්ට ලෙස ජයග්‍රහණය කළ අප එල්ලේ කණ්ඩායම මෙවර තරගාවලියකට පිවිසියේ ජයග්‍රාහී මානසික මට්ටමකින් යුතුවය. කෙසේ නමුදු ක්‍රීඩාවේ චමත්කාරය ජයපරාජය දෝලනයක් මත තිබීම නිසාම අප ක්‍රීඩකයින් හොඳ පුහුණුවකින් පසු මනා සැලැස්මකින් යුතුව තරගාවලියට පිවිසෙන ලදී.

**තරගාවලියේ මූලික වටයේ තරඟ 2004.11.15, 16,17 සහ 18 යන දිනයන්හිදී පනාගොඩ කාලතුවක්කු රෙජිමේන්තු ක්‍රීඩා පිටියේදී පැවැත්වුණි. මූලික වටයේදී අප රෙජිමේන්තු එල්ලෙ කණ්ඩායම රෙම විපරෙ සහ රෙම ශ්‍රීලයුපොසේබ යන රෙජිමේන්තු එල්ලෙ කණ්ඩායම් සමග තරඟ වැද ජයග්‍රහණය කර අවසන් වටයට පිවිසියහ. අවසන් වටයේදී ශ්‍රීලයුපොසේබ, සහ ශ්‍රීලංසංබ රෙජිමේන්තු එල්ලෙ කණ්ඩායම් පරාජය කර අපරාජිතව අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලැබූහ.**

අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලැබූ අනිත් කණ්ඩාම වූයේ කලක් යුධ හමුදාව තුළ එල්ලේ ක්‍රීඩාවේ අධිපත්‍ය පතුරා සිටි ශ්‍රීලයුපොදුසේබ එල්ලේ කණ්ඩායමයි. යුධ හමුදාවේ විණයාරක්‍ෂාධිපති බ්‍රිගේඩියර් එම් තෝරදෙණිය ජ්‍යෂ්ඨ නිලධාරීතුමන්ගේ ප්‍රධානත්වයෙන් අවසන් මහා තරඟය 2004.11.25 වෙනි දින පැවැත්විය. කාසියේ වාසිය දිනූ අප රෙජිමේන්තු කණ්ඩායමේ ආරාධනයෙන් ශ්‍රීලයුපොදුසේබ එල්ලේ කණ්ඩයම ප්‍රථමයෙන් පන්දුවට පහර දුන් අතර, ඔවුන් සියළුම දෙනාම දැවී ප්‍රථම ඉනිම වෙනුනේ වට 12 ක් රැස්කර ගත්හ. තියණු තරඟ රටාවකින් පසු අප රෙජිම ක්‍රීඩකයෝ ප්‍රථම ඉනිම වෙනුවෙන් වට 13 ක් ලබා පළමු ඉනිමේ වටයක් ඉදිරියෙන් සිටීමට සමත් වූහ. ප්‍රථම ඉනිමේ පන්දු රැකීමේදී දැක්වූ දුර්වලතාවයන් මගහරවා ගනිමින් තරඟ වැදුනු රෙජිම ක්‍රීඩකයින් දෙවන ඉනිමේදී ශ්‍රීලපොදුසේබ ක්‍රීඩකයින්ට ලබාගැනීමට ඉඩ දුන්නේ වට 06 ක් පමණි. ජයග්‍රහණය ප්‍රථම ඉනිමේ වටයක වාසිය සඳහා දෙවන ඉනිමේ ලකුණු 06 ක් ලබාගැනීමට සිදුවී තිබුණි. වරෙක ක්‍රීඩකයින් 08 කු දැවී වට තුනක් ලබා අසීරුතාවයක සිටි අප ක්‍රීඩකයින් 14 දෙනෙකු පමණක් දැවී ජයග්‍රහණය සඳහා වු ඉතිරි වට ගණන ලබාගෙන 2004 වසරේදී යුධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය දිනා ගැනීමට සමත් වූහ.

ජයග්‍රාහී අප රෙජිම එල්ලේ කණ්ඩායම රෙජිමේන්තු අධිපතිතුමන්ගේ ප්‍රශංසාවට ලක්වූ අතර, රෙජිමේන්තුවේ නිලධාරීන්ගේ සහ ජ්‍යෂ්ඨ කොනොනින්ගේ සහභාගීත්වයෙන් යුතුව විශේෂ රාත්‍රී භෝජන සංග්‍රහයක් ඉතා උසස් මට්ටමින් ජයග්‍රාහී එල්ලේ කණ්ඩායම වෙනුවෙන් පවත්වන ලදී.

## ශ්‍රීලපාහ එල්ලේ කණ්ඩායම

| | | | |
|---|---|---|---|
| සෙ/302052 | සාසෙ | චන්ද්‍රජීව | පීඒඑන් (එල්ලේ කණ්ඩායමේ නායක) |
| සෙ/13327 | බනි 11 | ජයවික්‍රම | ඒආර් |
| සෙ/302187 | කෝප්‍රල් | පෙරේරා | එම්ඒඒසීඑන් |
| සෙ/304882 | කෝප්‍රල් | මහින්ද | එල්ඩී |
| සෙ/307637 | කෝප්‍රල් | ප්‍රියංකර | කේපී |
| සෙ/300639 | ලාකෝ | විජේරත්න | එම්පීඑස් |
| සෙ/308770 | ලාකෝ | කුමාර | පීඩී |
| සෙ/308080 | ලාකෝ | සිව්රත්න | එස්බීයූඑම් |
| සෙ/308307 | ලාකෝ | සේරම් | ඊඑම්එම්එස් |
| සෙ/308027 | ලාකෝ | විජේසිරි | ඒඑම්ඩීඑස් |
| සෙ/314357 | ලාකෝ | කුමාරදාස | එම්ඒසී |
| සෙ/00013 | ලාකෝ | ලක්‍ෂමන් | ඒඑම් |
| සෙ/00126 | ලාකෝ | පුෂ්පකුමාර | ආර්පීබී |
| සෙ/301399 | සාසෙ | ප්‍රියදර්ශන | වයිඑච්එස් |
| සෙ/304472 | සාසෙ | මාරසිංහ | එන්පීඩී |
| සෙ/304472 | කෝප්‍රල් | වසන්ත | කේඑස් |
| සෙ/00813 | කෝප්‍රල් | එගොඩවත්ත | කේඑස් |
| සෙ/309382 | සාසෙ | පෙරේරා | එම්එච්එම් |
| සෙ/00441 | සාසෙ | ප්‍රියන්ත | කේඩී |
| සෙ/550556 | ලාකෝ | නන්දසේන | කේඑම් |
| සෙ/02061 | ලාකෝ | ද සිල්වා | එම්ජේඑස් |
| සෙ/300111 | කෝප්‍රල් | සේනාරත්න | එම්එම්සී |
| සෙ/304840 | සාසෙ | රණසිංහ | ආර්ඒඒ |

## ලංකා සවාරිය 2004

අතිගරු ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිණියගේ පදවි ප්‍රාප්තිය නිමිති කොටගෙන නිල්වලා හරසර උත්සව මාලාවකට සමගාමීව මෙවර ලංකා සවාරිය පැවැත් වුණි. 2004 දෙසැම්බර් මස 12 වෙනි දින කොළඹ ලේක්හවුස් මන්දිරය ඉදිරිපිටින් ආරම්භ කළ ලංකා සවාරියේ ස්ටෑන්ඩට් පාපැදි තරඟය අවසන් වූයේ මාතර නිල්වලා හරසර උත්සව භූමියෙනි. මුහුදු පෙදෙස් ඔස්සේ ගාලුපාරේ තරඟ කරුවන් 350 කට අධික සංඛ්‍යාවක් තරඟ වැදුණු දක්නට ලැබිණි. එහිදී ශ්‍රීලපාහ පාපැදි සංචිතයෙහි ක්‍රීඩකයින් 10 දෙනෙකු සැලසුම් සහගතව තරඟ වැදීමට සලස්වා තිබුණි. පසුගිය වසරක පමණ කාලයක සිට ශ්‍රී ලංකා පාපැදි ක්ෂේත්‍රයෙහි ස්ටෑන්ඩට් අංශයෙහි කැපීපෙනුනු අප පාබල ක්‍රීඩකයෝ තරඟ ප්‍රතිවාදීන් හඳුනාගෙන කණ්ඩායමක් ලෙස ඉතා දක්‍ෂ ලෙස තරඟ වැදී අවසානයේ 9 (සෙවි) ශ්‍රීලපාහ බල ඇණියේ සෙ/9ඩී01356 සාසෙ සමන් කුමාර ඩබ්පීජේ ජයගන්නා ලදී. සැබැවින්ම එය පාබල හමුදාවට පොදුවේ යුධ හමුදාවට ලත් ජයග්‍රහී මොහොතේ ස්වාධීන රූපවාහිනී සේවය ඔස්සේ සජීවීව සම්බන්ධ වුණු සාසෙ සමන් කුමාර ඩබ්පීජේ තමන් ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් ක්‍රීඩකයෙකු බවත් රෙජිමේන්තුවෙන් ලැබුණු සහයෝගය මෙම ජයග්‍රහණය පිටුපස ඇති බවත් රටටම හඬනගා කීවේය.

**සැබැවින්ම එය අපට ආඩම්බරයකි. ජයග්‍රහනයෙන් පසුව රෙජිමේන්තුවේදී උණුසුම් ලෙස පිළිගත් පාපැදි කණ්ඩායම රෙජිමේන්තු සේනාවිධායකතුමන්ගේ මෙන්ම රෙජිමේන්තු අධිපතිතුමන්ගේ ද ප්‍රශංසාවට පාත්‍ර විය. එපමණක් නොව උක්ත ක්‍රීඩකයාහට රේසින් වර්ගයේ පාපැදියක් ලබාදීමට කටයුතු කරන ලෙස රෙජිමේන්තු අධිපතිතුමන් විධානය කරන ලදී.**

# 2004 යුධ හමුදා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය

මෙවර යුධ හමුදා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරඟාවලිය පසුගිය වසරේ දක්ෂතාවයන්ට අනුව සුපර්, ලීග්, ''ඕඩී'' කාණ්ඩය සහ ''සී'' කාණ්ඩය යනුවෙන් කාණ්ඩ තුනකින් පැවැත්වුණි. ඒ අනුව අප රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම තරඟ වැදුනේ ''බී'' කණ්ඩායම යටතේය. යුධ හමුදාව තුළ අතිශය ජනප්‍රිය ක්‍රීඩාවක් වන වොලිබෝල් ක්‍රීඩාව තවත් ප්‍රචලිත කිරීමක් ලෙස මෙවර සියළුම රෙජිමේන්තු, විවිධ කණ්ඩ යටතේ තරඟ කරනු දක්නට ලැබුණි.

උක්ත තරඟාවලියේ මූලික තරඟ 2004.10.27, සහ 28 යන දිනයන්හිදී පනාගොඩ ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බලකා වොලිබෝල් ක්‍රීඩාංගනයේදී විශාල ප්‍රේක්ෂකයන් සංඛ්‍යාවක් මධ්‍යයේ පැවැත්වුණි. මූලික තරඟ වලදී අප රෙජිමේන්තු කණ්ඩායම ශ්‍රීලංජාආබමු, ශ්‍රීලංඉ, ශ්‍රීලවියාඉ. සහ කරෙ රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම් ඉතා පහසුවෙන් පරාජයට පත් කරමින් උක්ත තරඟාවලියේ ''බී'' කාණ්ඩයේ අවසාන පූර්ව තරඟ දක්වා පහසුවෙන් සුදුසුකම් ලැබූහ. අවසන් පූර්ව තරඟය 2004 නොවැම්බර් මස 08 වෙනි දින ශ්‍රීලංසංඥා රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායම අතර, පැවැත්වුණි. ආරම්භයේදී ශ්‍රීලංසංඥා රෙම කණ්ඩායම කරට කර සටනක් දුන්නද පිලිවෙලින් 21-25, 17-25, 14-25 ලෙස අප රෙජිමේන්තු ක්‍රීඩකයෝ වට තුනේම ජයග්‍රහණය කර අවසන් තරඟය සඳහා සුදුසුකම් ලැබූහ.

2004.11.08 වෙනි දින කොළඹ සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එස්එච්එස් කොට්ටේගොඩ ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී ගේ ප්‍රධානත්වයෙන් අවසන් මහා තරඟය පැවැත්වුණු අතර, තරඟය සඳහා විශාල යුධ හමුදා නිලධාරී/සෙසුනිල සංඛ්‍යාවක් පැමිණ සිටියහ. 'බී' කාණ්ඩයේ අවසන් මහා තරඟය සඳහා අප රෙජිම කණ්ඩායම සමඟ තරඟ වැදුනේ රෙම ශ්‍රීලයුපොහේබ වොලිබෝල් කණ්ඩායමයි. තරඟ වට 05 කින් යුතුව අවසන් මහා තරඟයේ 1-3 ලෙස ජයගන්නට ශ්‍රීලයුපොහේබ වොලිබොල් කණ්ඩායම සමත්වූහ. විශේෂයෙන් අප රෙජිමේන්තු වොලිබෝල් කණ්ඩායමේ ප්‍රධාන පුහුණුකරු තනතුරු හෙබවූ ජාතික තරුණ සේවා සභාවේ විදේශීය පුහුණුකරු ජපන් ජාතික වකයා බසී මහතාගේ වෙහෙස මහන්සිය සහ ජාතික තරුණසේවා සභාවේ ක්‍රීඩා නිලධාරින්ගේ මග පෙන්වීම නිසාම යුධ හමුදාව තුළ වොලිබෝල් කණ්ඩායම් අතර, ඉහල දක්ෂතා ඇති ජනප්‍රිය වොලිබෝල් කණ්ඩායම් කිහිපය අතරට කෙටි කාලයකින් පැමිණීමට අප කණ්ඩායමට හැකිවූ බව සඳහන් කල යුතුය. තවත් වර්ධනය කර ගත යුතු දක්ෂතාවයන් සහ හැකියාවන් සීමිතය. අනුශූරතා කුසලානය ලබාගන්නා අවස්ථාවේදී අප රෙජිම කණ්ඩායමේ නායක සෙ/5ඩී02593 සාසෙ සෝමරත්න ටීඑච්බීඑම් වෙත යුද්ධ හමුදාධිපතිතුමන් විසින් ප්‍රකාශ කර සිටියේ ''ලබන වසරේ අඩුපාඩු මඟහරවා ගනිමින් තරඟ වැද ජය ගැනීමට පුහුණුවීම් කරන්න'' යන්නයි. සැබැවින්ම ක්‍රීඩකයින් සැමදෙනාම එම වදන් තුලින් ලත් පන්නරයෙන්, පරාජය තුළින් නැවතත් නැගී සිටීමට මහත් පිටුවහලක් ලැබුණු බව් ක්‍රීඩකයින්ගේ මුහුණු වලින් දිස් වුණි.

## ශ්‍රීලපාහ වොලිබෝල් කණ්ඩායම :

| | | | |
|---|---|---|---|
| සෙ/5ඩී02593 | සාසෙ | සෝමරත්න | ටීඑච්බීඑම් (නායක) |
| සෙ/5ඩී00503 | කෝප්‍රල් | විජේකෝන් | ඊඑම්පී |
| සෙ/5ඩී00247 | කෝප්‍රල් | සේනාරත්න | කේපීආර්එස් |
| සෙ/302785 | ලාකෝ | සිව්රත්න | එස්බීවයිජේඑස් |
| සෙ/2ඩී01471 | ලාකෝ | වික්‍රමසිංහ | ඩීපී |
| සෙ/2ඩී01825 | ලාකො | කොඩිකාර | ජේකේ |
| සෙ/2ඩී01930 | ලාකෝ | පුංචිබංඩා | එස්බීආර් |
| සෙ/14ඩී0248 | සාසෙ | සම්පත් ප්‍රසන්න | ඩීකේ |
| සෙ/5ඩී1803 | සාසෙ | කරුණාරත්න | ජේකේ |
| සෙ/9ඩී01114 | සාසෙ | අජිත් මංජුල | එස් |
| සෙ/2ඩී03329 | සාසෙ | ජානක | ඩබ්ඒටී |
| සෙ/5ඩී02591 | සාසෙ | සුනිල් ශාන්ත | කේඑච් |
| සෙ/5ඩී02594 | සාසෙ | සිල්වා | කේඑච්ඊඩීකේ |
| සෙ/5ඩී02596 | සාසෙ | ද සිල්වා | එන්එච්එච්එස් |
| සෙ/9ඩී01362 | සාසෙ | වික්‍රමසිංහ | ඩබ්එච්සීආර් |
| සෙ/9ඩී01380 | සාසෙ | අමරවංශ | එච් |
| සෙ/149366 | ආසෙ | විමලසිරි | එච්කේ |
| සෙ/149367 | සාසෙ | අල්විස් | කේකේඑම් |

මේජර් පීවීඑම්එම් පෙරේරා ශ්‍රීලපාහ
ක්‍රීඩාභාර නිලධාරි - රෙම ශ්‍රීලපාහ

## කයිතඩි ළමා නිවාසයේ ළමුන් සමඟ 4 ශ්‍රීලපාහ ඒකකයේ නිලධාරි සහ සෙසු නිලයින් දිනක්

සිවිල් ජනතාව සහ යුධ හමුදාව අතර සුහදත්වය වර්ධනය කර ගැනීම සඳහා මෙම ඒකකයේ අණදෙන නිලධාරීතුමාගේ මග පෙන්වීම යටතේ සෑම මසකම 01 දින චාවකච්චේරි කයිතඩි ළමා නිවාසය වෙත උදා, දිවා, රාත්‍රී ආහාර ලබා දෙනු ලබන අතර, මෙම පුණ්‍ය කටයුත්ත සඳහා ඒකකයේ නිලධාරි/සෙනීන් මහත් උනන්දුවකින්, උද්යෝගයකින් සහයෝගය දී කටයුතු කරයි. මෙම ළමා නිවසයේ අනාථ දරු දරියන් 30 ක් පමණ සිටින අතර, අප ඒකකය විසින් දවස පුරා කෑම බීම සහ අනෙකුත් අවශ්‍යතාවයන් ලබාදී එම දරු දරියන් ප්‍රීතියෙන් තැබීමට කටයුතු කරන්නේ ඉමහත් වූ ආදරයෙනි. ඒකකය විසින් මෙවන් කටයුතු සිදු කිරීම හේතුවෙන් ප්‍රදේශයේ දමිළ ජනතාව විසින් යුධ හමුදාව වෙත මහත් ගෞරවයක් දක්වනු ලබන බැවින් යුධ හමුදා අයවලුන් හට ද රාජකාරී කිරීම පහසු වන අතර යුධ හමුදාව තුලද එම වැසියන් ගැන තරමක් හෝ විශ්වාසයක් ගොඩනැගී ඇත.



ඉහත ඡායාරූපයෙන් දක්වෙන්නේ 2004.12.01 වන දින එම ළමා නිවාසය වෙත පිරිනමන ලද දිවා භෝජන සංග්‍රහයෙන් පසු ඒකක අණදෙන නිලධාරී සහ නිලධාරීන් ළමා නිවාසයේ කාර්යය මණ්ඩලය හා දරු දරියන් සමඟ සුහද පිළිසඳරකින් පසු සමූහ ඡායාරූපයකට පෙනී සිටින අයුරුයි.

(බුද්ධි අංශය 4 ශ්‍රීලපාහ)

# යුධ හමුදා අන්තර් රෙජිමේන්තු එල්ලේ ශූරතාවය




ශිලපාහ එල්ලේ කණ්ඩායමේ නායක සා/සෙ වනදප්ව PAN ජයග්‍රාහී කුසලානය ලබාගත් මොහොත



ශිලපාහ එල්ලේ කණ්ඩායම එල්ලේ ශූරතාවය දිනාගැනීමෙන් පසු සමූහ ඡායාරූපයකට පෙනී සිටි අයුරු

# ලංකා සවාරිය - 2004 (පාපැදි)



සා/සෙ සමන් කුමාර WGJ කුසලානය සමග





සා/සෙ සමන් කුමාර WGJ ඇතුළු ශිලපාහ ක්‍රීඩකයින් පූගොඩ පල්ලෙවෙල ගම්වාසීන් විසින් පිළිගත් අවස්ථාව

# යුධ හමුදා අන්තර් රෙජිමේන්තු වොලිබෝල් තරගාවලිය



"බී" කාණ්ඩයේ අනුශූරතාවය දිනාගත් ශිලපාහ වොලිබෝල් කණ්ඩායම




අනුශූරතා කුසලානය යුධහමුදපති තුමන් අතින් ශිලපාහ වොලිබෝල් කණ්ඩායමේ නායකයා විසින් ලබාගත් අවස්ථාව

# රෙජිමේන්තු මූලස්ථාන බළඇණි සහනාධාර ණය යෝජනා ක්‍රමය ආරම්භ කිරීම.

## ආරම්භය :

රෙජිමේන්තු මූලස්ථාන බළඇණිය මගින් ක්‍රියාත්මක වන මෙම ණය යෝජනා ක්‍රමය 27 වන ශ්‍රීලපාහ රෙජිමේන්තු විධායක මහා සභාවේ අනුමැතියෙන් පසු 2004.04.05 වන දින සිට ආරම්භ කරන ලදී.

## පරමාර්ථය

මෙහි මූලික පරමාර්ථය වන්නේ බළඇණි සංඛ්‍යා බලයට යටත්ව ආබාධිත තත්ත්වය මත සේවයේ නියුතු සෙසු නිළයින්හට සහණාධාර යෝජනා ක්‍රමයක් යටතේ ණය සහන ක්‍රමයක් ක්‍රියාත්මක කොට සුභසාධනය ඉටුකිරීම වේ. මෙම කරුණු හේතු කොට බළඇණියේ සේවයේ නියුතු සෙසු නිළයින්හට පැන නගින හදිසි හෝ හදිසි නොවන මූලික අවශ්‍යතාවයන් ඉටුකිරීම මෙහි ප්‍රධාන පරමාර්ථය වේ.

## මෙම ණය යෝජනා ක්‍රමය මඟින් පළමු අදියර යටතේ ණය ලබාදීම :

මෙම ණය යෝජනා ක්‍රමයේ පළමු අදියර යටතේ ණය මුදල් ලබාදීමට මෙම ඒකකය විසින් 2003.01.30 වනදින හෝමාගම විල්ෆඩ් සේනානායක ක්‍රීඩාංගනයේ පවත්වන ලද "පාබල රාත්‍රිය 2003" සංගීත ප්‍රසංගයෙන් ලද ආදායමෙන් රුපියල් 300000/= ක මුදලක් ලබාදෙන ලද අතර, එම මුදල රෙජිමුඛ ශ්‍රීලපාහ අණදෙන නිලධාරීතුමාගේ අනුමැතිය යටතේ ණය මණ්ඩලය විසින් තෝරා ගන්නා ලද සෙනීන් 20 දෙනෙකු සඳහා රුපියල් 15000/= බැගින් වූ ප්‍රේෂණපත් 2004.05.17 වන දින යුධ හමුදා සේවා වනිතා ඒකකයේ ගරු සභාපතිනිය වන ශ්‍රීලපාහ කාන්තා සංගමයේ හිටපු සභාපතිනිය වන සෝනියා කෝට්ටේගොඩ මැතිණිය හා වත්මන් ශ්‍රීලංකා පාබල හමුදා කාන්තා සංගමයේ ගරු සභාපතිනිය වන ශාරි මල්ලවආරච්චි මැතිණිය ඇතුලු සාමාජිකාවන් සහ රෙජිමේන්තු සේනාවිධායකතුමන්, මෙම ඒකයේ හිටපු අණදෙන නිලධාරිතුමා ඇතුළු සියලුම නිලධාරීන් සහ රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුළු සියළුම ජෙකොනොනීන්/සෙසු නිලයින්ගේ සහභාගීත්වයෙන් ප්‍රධානය කරන ලදී.

## රෙජිමුඛ සහන ණය මේ දක්වා ලබාදීම:

ණය යෝජනා ක්‍රමයේ දෙවන අදියර යටතේ ණය මුදල් ලබාදීමට මෙම ඒකකය සහ ශ්‍රීලපාහ කාන්තා සංගමය සමග එක්ව 2004 අප්‍රේල් 30 වන දින පවත්වන ලද "පාබල රාත්‍රිය 2004" සංගීත ප්‍රසංගයෙන් ලද ආදායමෙන් රුපියල් 300000/- ක මුදලක් ලබාදුන් අතර, එම මුදල මෙම ඒකක හිටපු අණදෙන නිලධාරිතුමාගේ අධීක්‍ෂණය යටතේ ණය මණ්ඩලය විසින් අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර තිබූ අවශ්‍යතාවයන් අධීක්‍ෂණය කොට අයදුම්පත් 20 ක් තෝරා ගන්නා ලදී. දෙවන අදියර යටතේ එම ණය අයදුම්කරුවන්ට චෙක්පත් ප්‍රධානය කිරීම ශ්‍රීලපාහ කාන්තා සංගමය මගින් පවත්වා ගෙන යනු ලබන ශ්‍රීලපාහ සිල්ව බියුගල්ස් ගැලැන්ට් බේකරිය තුළ සිදුකල අතර, මෙම උත්සවය සඳහා පාබල හමුදා කාන්තා සංගමයේ ගරු සභාපතිනිය වන ශාරි මල්ලවආරච්චි මැතිණිය ඇතුලු සාමාජිකාවන් සහ මෙම ඒකකයේ හිටපු අණදෙන නිලධාරීතුමා ඇතුළු සියලුම නිලධාරීන්ද රෙජිමේන්තු සැරයන් මේජර් ඇතුලු සියලුම ජෙකොනොනි/සෙසු නිලයින්ගේ ප්‍රධානත්වයෙන් 2004.09.21 වන දින සිදු කරන ලදී. එහිදී චෙක්පත් ප්‍රධානය ශ්‍රීලපාහ කාන්තා සංගමයේ ගරු සභාපතිනිය වන ශාරි මල්ලවආරච්චි ප්‍රමුඛ සමාජිකාවන් විසින් සිදු කරන ලදී. 2004.10.01 දින රෙජිමුඛ ශ්‍රීලපාහ අණදෙන නිලධාරිගේ නිගමනය මත ණය මණ්ඩලයේ තීරණයෙන් සෙනීන් 08 දෙනෙකුට ණය මුදල් ලබාදෙන ලදී. තවද මෙම ඒකකයේ සෙසු නිලයින්ට පැන නගින හදිසි අවශ්‍යතාවයන් මත අණදෙන නිලධාරීගේ අනුමැතිය යටතේ ණය මණ්ඩලයේ නිගමනයෙන් මේ දක්වා සෙනීන් 05 දෙනෙකුට ණය මුදල් ලබාදෙන ලදී. මීට අමතරව 2004.12.26 වන දින ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් අවතැන්වූ මෙම ඒකකයට අයත් සෙනීන් 03 දෙනෙකුට අණදෙන නිලධාරීතුමාගේ නිර්දේශ මත 2005.01.03 වන දින ණය මුදල් ලබාදෙන ලදී.

## ණය මුදල් ගෙවීම සහ වාරික මුදල් අයකර ගැනීම :

මෙම ණය යෝජනා ක්‍රමය මගින් ණය ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමෙන් පසු ණය අයදුම්පත ණය අංශයට ලැබීමේ පිළිවෙල මත හා පැනනැගී ඇති අවශ්‍යතාවය මත ණය ලබාදීම සිදු කරනු ලැබේ. ණයමුදල් ලබාදීමෙන් පසු ණය මණ්ඩලයේ තීරණය අනුව මාසිකව මුදලින් වාරික මුදල් ණය අංශය වෙත ලබාදීම සිදු කරනු ලබන අතර, එම මුදල් ණය අංශය වෙතින් රෙආස රෙජිමුඛ ශ්‍රීලපාහි තැන්පත් කිරීම සිදු කරනු ලබයි. එයට අමතරව ඒකකය වෙතින් වැහාදී ලබන සෙනීන්ගේ අරෙසේ රාජකාරී වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම වසර 12 ක් කාලයෙන් පසු යුධ හමුදාවෙන් ඉවත්වන සෙබලුන් රෙජිමුඛ ණය ලබා ඇත්නම් අවසන් නිෂ්කාශණයන්ට ප්‍රථම මෙම ණය සම්පූර්ණයෙන් ගෙවා අවසන් කල යුතුව ඇත. එමෙන්ම දීර්ඝ කාලීන නිනොසේනො සෙනීන් සඳහාද මෙම රෙජිමේන්තු සහන ණය ලබා නොදෙනු ලන අතර, සහන ණය ලබාගත් සෙනියෙකු නිනොසේනො වුවහොත් ඔහුගේ ණය වාරික ඇපකරුවන්ගෙන් ලබා ගැනීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම ණය ලාභියාහට යම් ජීවිත හානියක් සිදුවූ අවස්ථාවකදී ඔහුගේ අවසන් නිශ්කාෂණයන්ගෙන් සියළු හිඟ මුදල් අයකර ගැනීම සිදු කරගනු ලබයි.

| | | |
|---|---|---|
| දැනට ණය මුදල් ගෙවා ඇති සම්පූර්ණ අයදුම්කරුවන් සංඛ්‍යා | = | 56 යි |
| ණය ගෙවා ඇති සම්පූර්ණ මුදල | = | රු. 840000.00 |

## රෙජිමුඛ සහනාධාර ණය යෝජනා ක්‍රමයෙ නිලධාරී මුඩුල්ල

1. **අධීක්‍ෂණ නිලධාරී**
11. **ගිණුම්භාර නිලධාරී**
111. **සාමාජිකයින්**

| | |
|---|---|
| 2 වන අණදෙන නිලධාරී | - රෙජිමුඛ ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන | - අණ සහ පාලන කණ්ඩායම රෙජිමුඛ ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන | - තුවාලකරුවන් රඳවා ගැනීමේ කණ්ඩායම රෙජිමුඛ ශ්‍රීලපාහ |
| නිලධාරී අණදෙන | - ලිපිලේඛන නඩත්තු කිරීමේ කණ්ඩායම |

රෙජිමේන්තු බලලත් නිලධාරී රෙජිමුඛ ශ්‍රීලපාහ

ගිණුම්භාර ජ්‍යෙෂ්ඨ කොනොනි

රෙජිමුඛ ණය අංශය

8 පාබල නියමු උනා
සතුටු සිනා මුව රැඳුනා ....
"සිංහපුර" ට පා නැගුවා
සිව්යට ... සවියක් පැතුවා ....



# දසුනෙන් හසුන

දසුන :
8 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරීතුමා (2004 මැයි 27) වැඩ භාරගැනීමට පැමිණි සුභ මොහොත

හසුන :
බනි 1 බී.ඩී. සුජීව,
රෙජිමේන්තු සැරයන් මේජර්,
8 ශ්‍රී ලංකා පාබල හමුදාව,
මහවැලි - සිංහපුර,
වැළිකන්ද.

## අකලට පරනොවන මල්

ලක් මවුනි ඔබ රකින
සෙබල දූ පුතුන් හට
යෝධ බල සහ විරිය
ලැබෙනවාමයි නිතින.
ගේ දොරද ඉඩකඩම්
බිරිඳ සහ දූ පුතුන්
සොයුර සොයුරියන් සහ
දෙමව්පියෝ නොතකමින්
යුධ බිමට ගොස් නිතින
දිවිය ගැන නොතකමින
සටන් කොට ජය රැගෙන
එන ආසිරි බලනු මැන
රටත් ජාතිය සමඟ
සමගි දම රැකගන්ට
වෛර දරන ඔබ සැමට
ලැබෙනවා බුදු සරණ
දෙදහස් පන්සිය වසක්
රැගෙන ආ බුදු දහම
සහ අපේ සිහලකම
රැක ගන්න පන ලෙසින
සතුරන්ට බියවන්න
එපා කිසිදින ඔන්න
තෙරුවන්ගේ ගුණ බෙලෙන්
ලැබේවා රැකවරණ ...

තිඹිරිගස්යාය ශ්‍රී ධර්මචාරණ දහම් පාසැලේ
ආචාර්ණී සාමච්නිසුරු
පී.ඒ. චාලට්
නො. 286, බෝධිරාජාපුර,
වේරහැර, බොරලැස්ගමුව

## ආදරය

ආදරය යනු යම් කිසි හදවත්
දෙකක් තුල
හටගන්නා ලද සිතුවිලි සමුදායක
බැඳීමක් පමණි
ආදරය ගත් විට දුප්පත්, පෝසත්,
ජාතිභේද යන අංශවල පොදුවේ
පැවත ගෙන එන කරුණකි
එසේ නැතිව උසස් තැන්වල අයට
පමණක් සීමා වුවක් නොවේ.

දුප්පත්කම හමුවේ ආදරය කියන
අකුරු හතර යටපත් වී යයි
එවිට ආදරය මිරිගුව පසුපස
හබායන මුවපැටවකු සේය
දුප්පත් වුනත් හදවත ලස්සන නම්
එතන ආදරය පිහිටා ඇත.


ලොව උතුම්ම ආදරය ලැබිය
හැක්කේ මෙලොවට බිහිකල
අහිංසක අම්මගේ හදවතින් පමණි

ස/316060
සාසෙ නිශාන්ත එල්පී
1 ශ්‍රීලපාහ - බුද්ධි අංශය

## "එපා ලක් මැණිව බිලිදෙන්න"

කුරිරු යුද්ධය නිසා රටක් ජාතියත්
විනාශය කරා ලඟාවන මොහොත
රටට ජාතියට සාමය ගෙනෙනන්ට
ඔබ ඒ උදාර සිතුවිල්ලෙන් යුතුව
සෙබලෙකු ලෙසින්
සාමයේ අත්වැල් බැඳ ගන්න
වෙඩි වරුසා මැද
ඔබ ගෙවන කටුක ජීවිතය
දුක් ගැහැට වලින් පිරී බව
යුධ වදින ඔබේ සිතට දැනුනද
සතුරට බියේ කිසිවිටකත් එපා
ලක් මැණිව බිළි දෙන්න

සෙ/ 315343
සාසෙ සමන් කුමාර ආර්ඩී
''ඒ'' කණ්ඩායම 4 ශ්‍රීලපාහ
යාපනය




## යුද්ධය

රියක් දුවාලක් නැතිවම
නෙත් අයා අවි ඇතිව
ගිනි ගැහුනු වැලිකතරේ
සිටිමි මා නිහඬවම...
එකිනෙකා මරාගෙන
ඇඟ කොටා දමන මේ ...
හිගන්නන්ගේ තුවාලය
සුවවේද කවදාක ....?

නි/31637, 2 ලුතිනන් ඩබ්පිසි ගලේවෙල
ශ්‍රීලපාහ
9 වන බළඇණිය
ශ්‍රීලංකා පාබල හමුදාව
යුධ හමුදා කඳවුර
පොට්පදි, නගර්කෝවිල්

## මගේ හොඳ සුදු තාත්තී

හැම මාසෙම නිවාඩුවට ඔබ ආ විට
නෙක විසිතුරු දේ අරගෙනදී මා සනසා
මගේ සුදූ දූව ඔයා මගේ පණ වාගේ
අම්මි කියන දේ අහගෙන
දඟ නොකර හොඳින් ඉන්න
සුදූ තාත්ති ඔබ හැමදාමත්
කියන්නේ මට ඒ දේමයි

මං ඔයාගේ සුදූ දූව ව
මං උපන්නේ පෙර පිනකට
මට හිතුනේ ඒ මොහොතේදී

ඔබෙ සෙනෙහස කැටිකර ලූ
සෙනහෙ වදන්
ඔබ මට දුන් ජීවිතයම
මට ඇති මගේ සුදූ තාත්තී
නැගි ඉල්ලා අඩන්නේ නෑ මීට පස්සේ නම්

මා ඇති දූඩි කරන්න
මා හොඳ පුරුවැසියෙකු කරන්න
ඔබ හෙලනා දහදිය බිඳු
රෑ තුන්යම නිදි මරාන හෙලන සුසුම්
මට දූනෙනවා මගේ සුදූ තාත්තී
ඔබ හෙලනා සුසුම් ගානේ
ඔබ හෙලනා කඳුළු ගානේ
වන්දි ගෙවන්නම් මා
අනාගතේ ඔබේ පැතුම් ඔබේ හීන
ඉටු කරමින් රටට වටින ලොවට
වටින
හොඳ ගැහැනියක්ව
ඔයා රකින්නම් තාත්තේ
මම දෙවියන්ගෙන් ඉල්ලන්නේ
මතු උපදින හැම භවයෙම
මගෙ හොඳ සුදූ තාත්තී
මටම ලබා දෙන්න කියා

සෙ/00480 සාසෙ ඒකනායක EYK
හමුදාපති ලේකම් කාර්යාලය - යුහමු



## නව වසර

කාලය දුවලා වසරක් ගෙවලා
ලෝකය යයි ඉදිරියට බලා
සැමදෙන සිත් සුභ පැතුමන් පුරවා
නව වසරක් ඇත උදාවෙලා

කිරියෙන් පැනියෙන් ඉතිරි නොගියට
අහිතක් නම් තුන් සිතක නැති
හැම පැල්පතකම බතක් ඉදෙන්නට
වරම් දෙතොත් හොඳටෝම ඇති

මල්වල අහරන සියොලග ගවසා
තුරු මිහි තලයට සිසිල දෙයි
වාන් දමන දියවර මහ වැව් වල
කෙතට කරල් පලදවනු ඇති

දුක් ගින්නෙන් දැවී ජීවිත හදවත්
මෙත් සිසිලෙන් සුවපත් වේවා
සමගිය සාමය සතුට පිරිගිය
නව වසරේ දැය සැනසේවා

නි/63246 කපිතන් එච්ඩීටී ජයකොඩි ශ්‍රීලපාහ
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුධ හමුදා මූලස්ථානය
කොළඹ 03.

## අපේ රට අපේ ජාතිය අපේකම

අපි සිංහලුන් වෙමු සෙනගින් සිටින කුඩා
යන්නට තැනක් නැත ලොවතුළ මෙයට වඩා
දුනහොත් යම් කෙනෙකු මේ රට දෙකට කඩා
මරණය හොඳයි ජීවත් වෙනවාට වඩා

විසදිටු අයනිසා වචිබිම නොවැන සෙනේ
ටික ටික හොරෙන් ජාතියෙ වල කපනු පෙනේ
පවසම් මේ නඩුව බුදුහාමුරු වනේ
ලක්මව නැති අපට මොන ජාතියද අනේ

හෙළ ජාතියම දුවුවත් එක වලට කපා
කොදුපන නැතුව දවසක්වත් ඉන්න එපා
විසදිටු පිරිස යෙදුවත් මෙහි දන්න උපා
අපෙ රට බෙදා තව කෙනෙකුට දෙන්න එපා

විසදිටුකමින් පතුරන යුධගිනි පුපුරු
අප දූනසිටිමු කවිරුදු ජාතියෙ හතුරු
ඌරුමය කළ නොහැක ලොව කිසිවෙකුට බොරු
ලක්බිම අපේමය ඉරහඳ තිබෙන තුරු

සාමවිනිසුරු P.A. වාලටි මිය
අංක 286, කනත්ත පාර,
බෝධිරාජා පුර, වේරහැර, බොරලැස්ගමුව.



## සාමයේ සිතුවිල්ල ......?

සීතල නිශායාමයෙහි
දරා ගිනි අවිය දැතින්
බලා ඉන්නෙමි
එනතුරා ඔබ සබඳ
අදත් කිමද ඔබ සොයා නාවේ
සාමයේ කුමුදු මල් මිට
විකසිත කරවන්න සාමයේ සුවඳ
එහෙත් .... නවම ඇයි පමාවී
පුන් සඳක් වී මෝදු වනු මැන
අමාවක වූ මගේ දේශය
සණ අඳුරෙන් මුදවා තබන්නට.


සෙ/310838
ලාකෝ අබේසේකර එච්එම්සීකේ
රෙජිමුඛ (3 ශ්‍රීලපාහ)
පනාගොඩ කඳවුර

## පරාජිත වූ ආදරය



තටුවකින් මලක් වැටෙන කොට ඒ තරම් කාලයක්
දරාගෙන හිටපු තටුවට හුගාක් දුක
හිතෙනවා ඇති...
හෝ හෝ ගාලා එන චන්ඩ මාරුතයට
ගසේ අත්තක් බිඳී විසී වුනහම
ඒ ගහටත් හුගාක් දුක
හිතෙනවා ඇති ...
ගහ මලානික වෙන්නේ
ඒ නිසා වෙන්නත් ඇති .....
මුහුදු වෙරලේ පුංචි ළමයි කෝම් පිට්ටු ගහනවිට
මුහුදේ වතුර ඇවිත් ඒවා සෝදගෙන යනකොට
ඒ පුංචි ළමයිට හුගාක් දුක
හිතෙනවා ඇති ....
ඉකි ගහගහා අඩන්නේ ඒ නිසා
වෙන්න ඇති ....
පුංචි කෙල්ල ලස්සන මනමාලියක් කරලා
මනමාලයාට බාරදෙන විට අම්මගේ ඇස් වලට
කඳුලු එන්නේ දුක සිතෙන නිසා වෙන්න ඇති
කාටවත් නොපෙනෙන්න කඳුළු පිස දාගන්නේ ඒ නිසා
වෙන්න ඇති....
ලස්සනම ලස්සන දේවල් පෙන්නලා ඔයා මගේමයි කියලා
මගේ සිත අරන් වෙන්ව යන විට මම ඔහේ බලාගෙන
හිටියේ මම එයාට ආදරේ නිසා
වෙන්න ඇති ...
අදටත් මම සිතන්නේ ඒ නිසා
වෙන්නත් ඇති ...
ඔයා මගේමයි කියමින් ළඟින් ඉඳ ඉක්මනින් මගේ
සෙනෙහස හැර ගියේ කොහොමද ... ආ.ද.ර.ය...
තාමත් සිතනවා මම ....

සෙ/301249 සැරයන් සිරිවර්ධන, ඊඩීඑස්
බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ - කට්ටපරිච්චන්මුතූර්




### කියනු මැන අයියණ්ඩියේ

සිනිදු ඔබේ දෑත් අතරට
රුදුරු ගිනි අවියක්
සිරවුනේ කෙලෙසද
ගිනිගෙන දළුවන යුධ බිමක
පා තබා යන්නට
හැකි වුණේ කෙලෙසද
සිනිදු සළු දවටුණ ගතට
ගොරහැඩි තිළ ඇඳුමක්
ඇඟලා ගත්තේ කෙලෙසද
පාළුව තනිකම නුහුරු සිතට
එය දරා ගත්තේ කෙලෙසද
සතුරන් සමඟ උරෙන් උරගැටී
යුධ වදින්නට තරම
අහිංසක ඔය හිත
දඩිකර ගත්තේ කෙලෙසද
කියනු මැන අයියණ්ඩියේ
ඔබට හැකිවුණිද
මෙ කටුක දිවිය ගෙවන්නට ...

මහේෂි රාජකරුණා
රෙම ශ්‍රීලපාහ රාජකාරීකරනු ලබන
ව/සැ සුනිල් K.A. ගේ හැගණිය

## පිය සෙනෙහස

මව් සෙනෙහස අහිමි ලොව
මහා වේගයක් නොව්
සඳුන් සිසිලක් විය. ඔබ මා හට
නුවණැස පාදා
ලොව දකින්නට...............
යහපත් දිවි පෙවතක් ගෙවන්නට
ඔබ දුන් ඔවා මිණි
අද ද මට සිහි වේ පියාණෙනි
සව් බල දැත මා හට
රැකවරණය දුන්නු
හිතේ එඩිය ඔබගේ
මා හට දුන්නු
මා යන ගමන හිරු මෙන් උන්නු
පුදුමයි
පියාණෙනි
හැඩිහය කිරි නොවුන

තත්සරණි සේනාධිපති
අනුරාධපුර ස්වර්ණපාලි බාලිකා ජා.පා
11 වසර

## හිමි සඳුනි

ගෙපැලෙහි පහණ නැහැ අඳුරුයි හැමදාම
දෙවැටෙහි පිපිණු මල් පරවිය නොකියාම
සතුටෙහි උපත දුක උරුමය සිතුසේම
ජීවත් වන්නේ කෙලෙසද ඔබ නැතුවාම

ආගිය ගමන් මග මින් වසරකට පෙර
සිහි වී තැලී යයි හදවත හැඟුම්බර
මා ගෙන තුරුලෙ රඳවා කියූ කතන්දර
තාමත් ඇසෙයි ඒ මා හට වරින් වර

ඔබගිය දිනේ තාමත් මතකයට නැගෙයි
යලි ඔබ ආව දින හද සිතුවමට නැගෙයි
රට ජාතිය නමින් රණබිම ලෙයින් තෙමෙයි
ඒ මතකයෙන් හැමදාමත් මසිත සැලෙයි

ජීවත් වෙලා ජීවතයට සැප දුන්න
මගෙ ජීවිතේ සැමදා මා ළඟ උන්න
කිසිදා කඳුල මගෙ හදවත නොමදුන්න
මතුවත් හිමි සඳුනි මගෙ ළඟ ඉපදෙන්න

නිම්මි - මහනුවර
(සැරයන් කඩිගමුව A.S.M.R.S.A.P
ගේ නැගණිය)

## දයාබර ඔබට කියන වගනම්

අහිමි දෙයක්ම
පතා මනෙතු හඬා
වැටෙන්නේ අද ඊයෙක නොවේ.
නිදි වැරූ තාරුකා මවනා
නිමේෂයක් පාසා
ලතෙත් හද හඬා වැටෙනුයේ
උම්මාද හිතුලුවන් නිසා නොව ...
එකෝමත් එක හිත පොඩියක
සුපිපුණු
සැළමුතු ප්‍රේමයක් නියාමය .. පරි
සමාප්තියෙන් මා බොළඳකුයැයි
හැඟී ගියද එය මිනිස් කමට
පොදු ධර්මතාවයක යැයි සිතා
මම නිදොස් වෙමි ..
එහෙත් ඔබගේ දුක
කඳුල සුසුම සාංකාව සමඟ
ජීවත් වෙමි දයාබර කුමරියේ
අදත් හෙටත්
මතුවටත් ........


සෙ/308075 කෝප්‍රල් කීර්ති තිස්ස ජේබීසී
බුද්ධි අංශය 7 ශ්‍රීලපාහ
කට්ටපරිච්චන් මුතූර්

## සුනාමි නුඹෙ

2004 උඳුවප් මස
26 වෙනි ඉරු දින
මහ සයුරුට පැමිණි
අමුත්තා සුනාමි
නුඹද ....
ගොඩබමක් ලෙස සිදී
නුඹ නිසා සයුර කළ විපැත්තිය
කැළඹිලිකාර නුඹගේ
මේ ස්වභාවය
වෙරළ සොයාගෙන
ආවද ...
නිහඬව නිසලව සිටි
මහ සයුර සුනාමි නුඹ නිසා
ඒ බව අමතක කළාද ...

දරුණු වුනේ ඇයි සයුර
සුනාමි නුඹ නිසා
මෙතරම්
සුනාමි නුඹ කොහි
සිට මෙහි පැමිණියද
ඇයි අවේ මෙතරම්
විපතක් සිදු කරන්නට ...
කුසගිනි වුනාද නුඹට
මෙතරම් ජීවිත, දේපළ
බිලිගන්නට
විශාල මහ නුවර
තුන්බිය එකල ...
නුඹටත් දෙවැනි වුයේ
නැහැ මෙකල
බැලූ බැලූ තැන
මලකඳන්
බැලූ බැලූ අත
මිනිසුන්ගේ විලාපය
සුනාමි නුඹට
නොපෙනේද , නොඇසේද
උන්හිටි තැන් පවා
අහිමිකළ සුනාමි
නුඹට සමාව
දිය යුතුද අප...
සුනාමි
මොහොතක් සිතන්න
නුඹ කළ විපත ගැන
දැන්වත් නුඹ ඒගැන
සෑහීමකට පත්වෙනවාද?
නැවත වරක්
ජීවිත දේපළ බිලිගන්නට
හිතන්නවත් එපා
සුනාමි නුඹ
මේ ලැබූ නව වසරේ

චමරි ගයන්තිකා ප්‍රනාන්දු
ශා/අන්තෝනි බාලිකා විදුහල - පානදුර
(ලුතිි (උප) ඩී.ආර්. ප්‍රනාන්දු
ශ්‍රීලපාහ දියණිය)




## වසන්තය නිමාවිය

දුරැතු සීතල වෙලාගෙන
ගැහේ ගත සිත
අන්ධකාරයේ හිඩැස් අතරින්
එබී බලමින්
නිසොල්මන්ව

බලන් පුළිඟු කැට වන් කිරණ
දෑස් අග දල්වෙමින්
දියකරන් කඳුලු කැට
අනාගතය ගැන
සිතන හැටි දකින හැටි
සකායේ ඡායාව
අස්සෙන්

සෙ/14 ඞී 00555
ලා/කෝ කපිල කුමාර පී.එස්
14 ශ්‍රීලපාහ - ඒ කණ්ඩායම

## රසකතා



**වතුර ගන්න ටැංකිය**

ප්‍රසන්න අර තියෙන්නේ ටැංකියක්ද ?
ආ... ඔව් ඔව් සර්.... ඒ ටැංකියක් තමයි ...
මෙහේ අය වතුර ගන්නේ ඒ ටැංකියෙන්ද ?
ඔ..ඔව් සර් .... මෙහේ අය වතුර ගන්නේ ඒ ටැංකියෙන් තමයි.
යමු බලන්නට එතනට ....
එම ස්ථානයට ගිය පසු දක්නට ලැබුනේ බොහෝ කලකට පෙර කඩාදමා තිබෙන ටැංකියකි. දුරට පෙනුනේ එහි තිබෙන එකම බිත්තිය පමණකි.

***කව්ද සීනියර් ?***

*එස් එෆ් කමාන්ඩර් වන්නි ද සීනියර් උඹද සීනියර් ?*
*ඇයි එහෙම අහන්නේ ..... ?*
*උඹ වන්නිනායක නිසා ....*



කපිතාන් තරිඳු වීරසිංහ - ශ්‍රීලපාහ
උතුරු නැගෙනහිර ආණ්ඩුකාර කාර්යාලය
ත්‍රිකුණාමලය.

## නව යුධහමුදාපතිතුමාට සුභාශිංෂණ

පදවිය ලබා යුද හමුදාපති ලෙසට
ඔබ දුටුගැමුණු වෙයි අප මුළු සිරිලකට
විස්කම් දක්වමින් කල මෙහෙයද රටට
සිහිකර උතුම් ආචාරය පුදනෙමි ඔබට

ඔබගේ වීර නාමය හදවතෙ රැදුනි
ගත සිත පිබිදිලා පන්නරයක් ලැබුණි
පෙර යුධ සමයේ ඔබ කළ විස්කම් තුමනි
සිනමා පටය ලෙස අප හද තුළ රැදුනි

උතුමන් වීර ඩෙන්සිල් කොබ්බෑ කඩුව
පුරවනවාද එතුමන් ලොව නැති අඩුව
ශක්තිය දිරිය ඔබ හට නොමවී අඩුව
තියුණු නුවණ දියුණුව වේවා වැඩිව

තිස්නව වසර සේවය කර හමුදාවේ
ඉහලම තනතුරට පත් යුධ හමුදාවේ
පැසසුම් සුභපැතුම් මැද යුධ හමුදාවේ
උසස්වීම් ලැබ ජීවය ගෙන ආවේ

තියුණු නුවණ තව ඔබගේ වැඩිවේවා
යන්නට ඉදිරියට අපහට ජයවේවා
රට දැය රකින්නට ආයුෂ වැඩිවේවා
යුධ ගිනි නිවී සාමයේ මල් පිබිදේවා

පැලඳ පදක්කම් ලැබ රණශූර ලෙසින්
යුධබිම විස්කමින් දස්කම් පෑව නිතින්
නිතරම ශූක්ෂම ලෙස බැලු තියුණු ඇසින්
යුධ බිය වියලිලා ලියලුනා ඉතින්

**ලුතිනන් ඩබ්ලිව් එම්එස්බී වලිසුන්දර ශ්‍රීලපාහ (නි/62869)**
**විධායක අධිකාරී - 22 ශ්‍රීලංජාආබමු**
**යුධ හමුදා කඳවුර**
**ලක්ෂපාන**

## මිණි පහන

ඝනදුරේ පාලුව රජවෙලා
දසතින් නැගෙන්නේ මද සුලඟට
සෙලවෙන කොල පමණයි
ඝනදුර මෙතරම් සැහැසිවෙද්දී
මට නුඹේ සිනාහඬ රැව්දේ
පාලුව කලුවර ඉරා දමන්නට
මා ආලෝකය සෙව්වෙමි
ඒ ආලෝකය ඔබයි හිමිසඳු

**නයනා කේ. කාරියවසම්**
**(සෙ/15805 ලාකෝ ද සිල්වා BHRU ගේ බිරිඳ)**






# වනය මැද බංකරේ

ගත හිරිගඩු පිපෙන අඳුරු රැය සීතලය
සඳුනැතත් අහස් කුස තරු කැකුළු විසිර ඇත
ගිනි අවිය තුරුළුකර දෑතට වාරු කරගෙන
මහ වනේ අඳුර මැද සතුරන් සොයා යනමේ ගමන
අතිශයින් බියකරුය පාළුව කාන්සිය වෙලාගෙන ඇතත්
සෙබළ ජීවිතය
බියක්නම් නැත ලයේ එඩිතර කමක් විය
මුළු ලොවම සොඳුරු සිහින දකිමින්
නිදන මැදියම් රැයේ අවදිව
නිදිමත කඩා හැලෙන තරුඑළියෙන්
ඉදිරියට යන අපට සුළු අතපසු වීමක් උව සෑහේවි
සතුරාගේ ගොදුරක් වීමට රෑ වවුලන් බස්සන් බකමූණන්
අතු අගින් හිඳ හඬතලයි ඝන වනයේ බියකරු සතුන්ගේ
නාද අතෝරක් නොමැතිව සීතලේ ගැහෙමින් තනිකමින් පාළුවෙන්
සිටින සෙබළුන්ට දුම්වැටියක් උරන්නට පවා
එය සතුරාගේ වෙඩි උන්ඩයකට සෙබළකුගේ අවාසනාවකට
අත වැනීමක් වන බැවිනි.

සෙ/304807
ලා/කො සුගත් ශාන්ත R.
10 ශ්‍රීලපාහ
රෙජි පාලන කණ්ඩායම

## සෙබලෙකුගේ ප්‍රාර්ථනය

එදා හෙළරජ දරුවන්
දුටුගැමුණු වැනි තවත් විරුවන්
සතුරන් පරදා ජයගොස නැගූසේම
අප විසින් මෙදා ද
දිවි දෙවැනි කොටගෙන
රැක ගන්නම් සිය නිජබිම
අදමෙන්ම මතුවටද මෙලෙසින්
තමන් දිනූ දේශය රැකගනීවි සිය පන නලසේ
අනාගත සුර විරුවන් අපහද ගැහෙන රිද්මය
අපගේ ජීවිය එකම අරමුණ අප උපන් දේශයයි

තල් රුප්පාවෙන් පොල් රුප්පාවට
සාමයේ සුදු පරවියන් හට නිදහසසේ
පියාසලන්නට හැකි ලොවක් තනමු අපි
මතුවට පිපෙන මල් කැකුල
මරණයේ සීතලින් මිලින කරන්නට නොව
ජීවිතයේ හිරු කිරණින්
නව පනක් ලබාදී
පුබුදු කරන්නට හැකි ලොවක් බිහිකරමු.

**සෙ/304807**
ලා/කො සුගත් ශාන්ත R.
**10 ශ්‍රීලපාහ**
රෙජි පාලන කණ්ඩායම

## සාමයේ අවුරුදු

| | |
|---|---|
| ජීවත් උනත් මැරනත් ඔහේ මට | මාක ද |
| මාවත් මගේ අඹුවත් රැකුනොත් | මදි ද |
| මෙහෙමත් හිතන අය හමුදාවේ | නැති ද |
| ඔබටත් අනේ සැනසෙන්නට | පුළුවනි ද |
| දුටුවිට කථාවයි බොරුවට පන | දෙන්ට |
| මුහුණට සිනාසෙයි ඔරවයි පිටු | පසට |
| කේලම්බස් අසා ගසලා කෙනෙකුගේ | බඩට |
| බැජඹෙයි අහෝ නින්දාවකි එය | ඔබට |
| දාහය වසකි මම හමුදාවේ | ගෙව්ව |
| කටුකයි අහෝ මුල මැද අග පසු | කෙරුව |
| බාධක මැදින් ජීවිතයම කැප | කෙරුව |
| තිලිණය ලෙසින් උරුමය පමණකි | කරුව. |
| දෂ්ඨ කරන සර්පයෝ ලොව විෂම | තමයි |
| දුෂ්ඨ උනේ ඇයි ඒ ඔබේ කුහක | කමයි |
| අෂ්ඨ ලෝක ධර්මය නම් සැමට | සමයි |
| ශක්තිය නොවේ යුක්තිය යම් දිනක | දිනයි |
| විසිවසරකින් පසුව අපටත් අවුරුදු | ලැබුවා |
| සාමය නිසා ගම්බිම් වෙත පා | තැබුවා |
| නාවික ගුවන් සේවාවන් ඉටු | කෙරුවා |
| මෙකි නොකී සැමටම සෙත | සැලසේවා |

සෙ/2ඞ01323
කෝප්‍රල්, කරුණාරත්න පීවම්
2 ශ්‍රීලපාහ

## කඳුළු බිඳුවක් එක්වෙලා .....

නිදි නැතිව ගෙවෙන මොහොතක්
අනේ නුඹ ගැන සිහිවෙලා
මටත් නොදැනිම දෙනෙත් අද්දර
කඳුළු බිඳුවක් එක්වෙලා
ඇත මතකය තාම ලඟමයි දුරස් වන්නැ
සිත ලගින් ...
සිතින් විරසක වුනේ කෙලෙසඳ
සපත වී හදවතින්
වෙහෙර මළුවේන් නොවේ සිසිලක්
මලේ ලඟ නුඹ නැති දා පටන්...
බිඳුන සෙනෙහස අරන් එනවද
නොයන්නට යලි පෙර ලෙසින් ...

සෙ/313916 කෝප්‍රල් නිමල් බංඩාර D.M.J.
දේවස්ථාන කඳවුර
තල්ලඩි - මන්නාරම

## යුද්ධය

රැයක් දවාලක් නැතිවම
නෙත් අයා අවි ඇතිව
ගිනි ගැහුනු වැලිකතරේ
සිටිමි මා නිහඬවම...
එකිනෙකා මරාගෙන
ඇණ කොටා දමන මේ ...
හිගන්නන්ගේ තුවාලය
සුවවේද කවදාක ....?

නි/3167 2 ලුතිනන් ඩබ්පිසි ගලේවෙල ශ්‍රීලපාහ
9 වන බළඇණිය ශ්‍රීලංකා පාබල හමුදාව
යුධ හමුදා කඳවුර.පොට්පදි
නගර්කෝවිල්




## නුඹ සම නැත

සඳ පායා දදුලන ඒ
පසලොස්වක රාත්‍රියේ
හිනහෙන ඒ සඳ මල
නුඹේ මුහුණය මට සිතුනට
ඝණ කළුවර මැදින් දිලෙන
අමාවක රාත්‍රියේ
දිලෙනා ඒ තරු මල්
නුඹේ නෙත යැයි මට සිතුනට
උදාරුසින් ලොව පුබුදන
ලහිරු මඩලේ රැස් කඳ ඒ
නුඹ තේජසයැයි මට සිතුන
නුඹ සම නැත කිසිවකටත් ඒ
උපන් බිමේ නිදහස රැක
මතු උපදින කැකුළු වලට
දෙන්නට නව නිදහස් ලොව
ලේ සුවඳැති සටන් බිමේ
පෙරමුණ ගෙන විරුවෙක් විලසට
රුපු උණ්ඩෙට ළය දී නුඹෙ
දේශය නාමෙන් දිවි දුන්
නුඹ සම නැත, නුඹට සම නැත
කිසිවක් මෙතුවක් මෙලොවේ

එරන්දි චතුරිකා ජනානි
කොටගල,පිටබැද්දර

## සෙබළ පියකුගෙන් ආදර පුතුට

තරුණ දිවිය මහ වනයට කැපකරලා
ඔබට හෙටක්, රටට සෙතක්
ඇත අප සැම එක්කරලා
නුඹ වාගේ පුංචි එවුන්
දුවපැන විත් රංඩුකරන්
අනාගතය දවස ගානේ
දහසක් මල් පැතුම් බැඳන්
හෙට දවසට මිහිකත මත
පය තබන්න නුඹට වරම්
ලබාදෙන්න නුඹේ පියා
පුද කෙරුවනේ දෙපය හිටන්
නුඹ ලොකුවී දැනමුතුවී
රටගැන හරි වැටහීමෙන්
හොඳ දිවියක්, රට වෙනුවෙන්
කැප කරන්න පුතේ "සහන්"

සෙ/309300 කෝප්‍රල් උදයසිරි K.K.D.J.
බුද්ධි අංශය - රෙජිමුඛ ශ්‍රීලපාහ

## සෙනෙහස

සිත් පුෂ්කරණියෙ පුපිපුනු පුෂ්පය නුඹ වෙයි සුන්දර
සිත් පතුලට විත් ආලය දුන්නා මට දුක් හින්දර
සත්කුම්පච් සත් සමුදුරු තරණය කොට විඳ කරදර
ටජ් මහලක් තනවන්නෙම් නුඹ ලැබ ගෙන සිත අද්දර

කපිතන් තරිඳු වීරසිංහ - 2 ශ්‍රීලපාහ
උතුරු නැගෙනහිර ආණ්ඩුකාර කාර්යාලය
ත්‍රිකුණාමලය.



## සුනාමි

දෙරණ කම්පා වෙලා සාගරය ගොඩට විත්
අපරාධ කාම හා අයුක්තියේ රැළි ඇවිත්
හොඳ නොහොඳ හැම හදට මහා දුක් ගිනි දෙමින්
මුහුද ගොස් මුහුදටම යළිත් නොඑනා වෙසින්

මුහුද බත් මායිමේ වැට යළිත් සවි නොකර
යුද වැදුණු දෙපිරිසම පස මිතුරුකම් දුරැර
අවතැන්වූ පරපුරට අනාගතයක් සදන
මඟක් හෙලි කර ගනිමු හැමට සැනසුම ලැබෙන

පොරණේ මේ දේශයට මුහුද ගොඩ ගැලූ දිනේ
වෙහෙර මහ දේවියයි අභිනව බිලි වුනේ
ඇයගේ පර හිතකාමී හද දුටුව සාගරේ
නිසලවී ඇයව ඉරණම් ගමන් ගෙන ගියේ

කළු වළාවක රිදී රේඛාව දකින්නට
යළිදු සාගරය ගැන සොදුරු කවි ලියන්නට
කිසි ලෙසින් සොබාදහම මතු උරණ නොවන්නට
බිලි දෙන්න හැම වාද භේද මේ සුනාමියට

කපිතන් තරිඳු වීරසිංහ
2 ශ්‍රීලපාහ
උතුරු නැගෙනහිර ආණ්ඩුකාර කාර්යාලය
ත්‍රිකුණාමලය.

## රැක දෙනු මගෙ සුදු අයියාව

මැදියම් රැයේ
ඝනදුර මැදින්
සතුරු බල බිඳින්නට
සිතක් නැති ගිණි අවියක්
සුරත දරා
නිදිවරණ
මගේ සුදු අයියේ
කෝ ඔබේ යෞවනය
කෝ ඔබේ හසරැල්ල
සියල්ල රට දැයට කැප කල
අහිංසක මගේ සුදු අයියව
රැකදෙන්න.
කළුතර මා බෝ සමිදුනි,
සියළු දෙවියනි

ඩී.ජී. නිශාන්ති යාපා
කුඩා මාලබේ
ඉත්තපාන

සෙ/312873 ලාකෝ යාපා
DGD ගේ නැගණිය

# පාබල සැමට සුභ නව වසරක් ..........



සාමය හඬින් ලක සැම දන සිත පිනවා
සතුට ලබන්නට හදවත් සිරි උරවා
සොම්නස සැමට ලැබ ගන්නට මුව පුරවා
පිරි සිදු සිතින් උරදෙයි සාමෙට විරුව

සුභ කටයුතුයි සැමදා ''ජය දද'' වන්නේ
නව සිතුවිලියි දැය නැගුමට ''දිරි'' වන්නේ
වසරක් ගෙවී නව හිරු රැස් විහි දෙන්නේ
වේවා ! සැමට සෙත පතනෙමු නව වසරකි එන්නේ

පාබල සොයුරු බළ ඇණි සැම දෙනා හට
සෙබළ කු ලෙසින් පිරිපුන් ලක් දෙරණ යට
සැමට දිරිය ලැබ ''සේවය'' කරන් නට
සැමදා හේතු වේවා සිහ ධජය යට

සෙ/11896,
**බනි 1 බී.වී. සුජීව,**
රෙජිමේන්තු සැරයන් මේජර්,
8 - ශ්‍රීලපාහ - මහවැලි-සිංහපුර,
වැළිකන්ද.

## වයිට් හැකල් ප්‍රහේලිකාව - අංක 24

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | | 3 | 4 | ■ | 5 | | | 6 |
| 7 | | | 8 | | ■ | | ■ | ■ | |
| 9 | | | ■ | | ■ | 10 | 11 | 12 | |
| | ■ | | ■ | 13 | | ■ | 14 | | ■ |
| 15 | 16 | | ■ | | ■ | ■ | 17 | | 18 |
| ■ | 19 | | | ■ | ■ | 20 | | | |
| 21 | | | ■ | 22 | 23 | | ■ | ■ | |
| 24 | | ■ | ■ | 25 | | | ■ | 26 | |
| | ■ | 27 | 28 | ■ | 29 | | 30 | ■ | |
| 31 | | | | ■ | | ■ | 32 | | |

**නිවැරදි විසඳුම්පත් 2005 ජූනි 15 දිනට පෙර එවිය යුතුය. තරඟ කූපනය සහ තරඟ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.**

තරඟ කූපනය සහ තරඟ කොන්දේසි පසු පිටෙහි ඇතුළත් කර ඇත.

**හරහට :**

1. දැකුම්කළු යන්නට සමාන වචනයකි.
5. ලෝකයේ අටවන් පුදුමය ලෙස හඳුන්වන්නේ.
7. ශිව දෙවියන්ගේ වාහනය වේ.
8. මෙය කියවීමට බැරි තුන්දොරින් එකකි.
9. සැප්තැම්බර් මාසය .... වේ.
10. රාත්‍රියෙන් පසු ....
13. රටක් කරවති
14. ප්‍රවේශමෙන් පරිහරණය කල යුතුවේ
15. වාදනය යන්නෙහි සමාන ඇරුත් ගෙනදෙයි
17. මෙම පරම්පරාවේ අය වයසට ගියද බිම නොයති
19. මෙය පූජා භාණ්ඩයකි
20. සමහරු මේවා තුළින් ගින්දර ද රැගෙන යාමට දක්ෂය
21. ගස් සමූහයක් මේ නමින් හඳුන්වයි.
22. ගසට කියන නමකි
24. මොහු කවදා කොතැනක සිටිදැයි අපි නොදනිමු
25. කාන්තාවන්ගේ දෑත් අලංකාර කිරීමට යොදාගනී
26. බෞද්ධ දර්ශනය අනුව දෙලොවටම වැඩදායි වේ.
27. ආරක්ෂාව සඳහා ලැබුණු සොබාදහමේ දායාදයකි.
29. කුසගින්න
31. රථවාහන ධාවනයේදී නැතුවම බැරි උපකරණයකි
32. වේදනාව යන්නෙහි ඇරුත් ගෙනදේ

**පහළට :**

2. ජලයට මේවා මිශ්‍ර වූ විට පානය සඳහා නොගනී.
3. මුදල් වුවද නෝට්ටු නොවේ.
4. සතර මහා ක්‍රීඩා නිධානයෙන් එකකි
5. කාන්සියට මේවා කියයි
6. අතීතයේදී භාවිතා කරන ලද යුධ උපකරණයකි.
11. වයසට යන කාන්තාවන් පළඳිති.
12. වැස්සෙන් හා අව්වෙන් නිවෙස් ආරක්ෂා කර දෙයි
16. යකුන්ගෙන් වැඩගන්නා
18. බෞද්ධයින් පූජනීය ස්ථාන නැරඹීමට යාම මේ නමින් හඳුන්වයි
20. ලංකාවේ දර්ශනීය දිය ඇල්ලකි
21. ප්‍රමාණය යන්නෙහි සමාන පදයකි.
22. පිරිමින් කාන්තාවන්ගේ මෙය කෙරෙහි සැළකිල්ලක් දක්වයි
23. ලෝකප්‍රසිද්ධ කාන්තාර ප්‍රදේශයකි
27. ආහාර පිස ගැනීමට උවමනා වේ.
28. හදවත ....
30. බෞද්ධ පොතපතේ සඳහන් වන්දනා කිරීමේ ගාථා විශේෂයක් මේ නමින් හඳුන්වයි.

# ප්‍රහේලිකා අංක 21 නිවැරදි විසදුම් හා ජයග්‍රහණය කළ අයවලුන්

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 8 | 2 | 1 | | 1 | 9 | 1 | 1 | |
| 9 | | | 9 | | 8 | | 9 | | 2 |
| 0 | | 1 | 5 | 0 | 5 | | 4 | | 5 |
| 1 | 9 | 2 | 4 | | 7 | | 5 | 4 | 7 |
| | | 1 | | 1 | | | | 3 | |
| | 1 | 9 | 2 | 9 | | 1 | 9 | 4 | 1 |
| | 9 | | | 8 | | 8 | | | 9 |
| | 4 | | | 2 | | 2 | | | 3 |
| 1 | 8 | 4 | 6 | | | 1 | 9 | 8 | 4 |
| 1 | | 0 | | 3 | 8 | | | 9 | |

### *1 වන ස්ථානය*

සෙ/302438 සැරයන් මනම්පේරි පී
රෙජිම ශ්‍රීලපාභ (1 ශ්‍රීලපාභ)
පනාගොඩ කඳවුර,
හෝමාගම.

### *2 වන ස්ථානය*

සෙ/301387 කෝප්‍රල් ගුණතිලක ඒසීආර්
4 ශ්‍රීලපාභ
යුහ කඳවුර
නුනාවිල්, චාවකච්චේරි

### *3 වන ස්ථානය*

සෙ/14234 සැරයන් සිරිවර්ධන ඩබ්ඩ්
රෙජිම ශ්‍රීලපාභ "ප්‍ර" ශාඛාව
පනාගොඩ කඳවුර,
හෝමාගම.

---

## වයිට් හැකල් ප්‍රහේලිකාව
## අංක 24

තරඟ කොන්දේසි :

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල් වල සමාජිකයන් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන, හා තුන්වන ජයග්‍රහණ හිමි කර ගන්නා ජයග්‍රාහකයින් පිළිවෙලින් රු. 1000/-, රු. 750/- රු500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ.
5. ප්‍රහේලිකා අංක 24 හි නිවැරදි විසඳුම 2005 ජුනි 15 වන දිනට පෙර එවිය යුතුයි.
6. නිවැරදි පිළිතුරු එකකට වඩා ඇත්නම් කුසපත් ඇදීමෙන් තෝරාගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකුට සඳහා පමණක් තෑගි දීම සිදු කෙරේ.
7. පිළිතුරුපත් එවන ලියුම් කවරයේ වම්පස උඩ කෙලවරේ "වයිට් හැකල් ප්‍රහෙලිකා අංක 24" යනුවෙන් සඳහන් කළ යුතුයි.

ලිපිනය : වයිට් හැකල් කර්තෘ
වයිට් හැකල් ප්‍රකාශන අංශය
රෙම ශ්‍රීලපාභ
පනාගොඩ
හෝමාගම

## කූපනය

අංකය :.....................................

නිලය :.....................................

නම :.....................................

රාජකාරී ලිපිනය :.....................................

.....................................

.....................................

ඒකකය :.....................................

හැ.පත් අංකය :.....................................

# පාබල සංගමයේ රැස්වීම - 2005-01-30



රැසවීම ආරම්භ කිරීමට ප්‍රථම
විශ්‍රාමික මේජර් ජෙනරාල් සීඑම්එච් සිල්වා සම්ප්‍රදායානුකූල පොල්තෙල් පහන දැල්වීම



රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට ප්‍රථම දිවිදුන් අයවළුන්
සිහිපත්කර විනාඩි 2ක නිශ්ශබ්ධතාවය




රැස්වීමට සහභාගී වූ ජ්‍යේෂ්ඨ නිලධාරීන්
ප්‍රමුඛ පාබල සංගමයේ සාමාජිකයින්



රැස්වීම අමතනු ලබන විශ්‍රාමික මේජර් ජෙනරාල් සීඑම්එච් සිල්වා වීඑස්වී



රෙජි අධිපති විසින් 2004 වසරේ සාමාජිකත්වය
ලබාගත් නිලධාරී/සෙනින්ගේ සාමාජික මුදල් භාරදුන් අවස්ථාව



දිවා භෝජන සංග්‍රහයට ප්‍රථම කණ්ඩුලට පළතුරු සංග්‍රහයක්



පාබල සංගමයේ විශ්‍රාමික සාමාජිකයින් දිවාභෝජන සංග්‍රහයට එක් වූ මොහොත



දිවා භෝජනය භුක්ති විඳිමින්





57 වන නිදහස් දින උත්සවයේදී,
ගරු ජනාධිපති තුමිය විසින් ශ්‍රීලපාහ ආචාර පෙළපාලියේ
ආචාරය පිළිගත් මොහොත